සැ. යු.- (i) 2023.11.10 වැනි දින පළ කරන ලද අංක 2358 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2023 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,359 - 2023 නොවැම්බර් මස 17 වැනි සිකුරාදා - 2023.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV(අ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව		පිටුව
තනතුරු-ඇබෑර්තු	—	පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ..	—
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—	ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	—
බඩුබාහිරාදිය විකිණීම්	—	අයවැය ලේඛන	—
පළාත් පාලන නිවේදන	2032	දේපළ විකිණීම්	—
අතුරු ව්‍යවස්ථා	—	විවිධ දැන්වීම්	2039

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 දෙසැම්බර් මස 08 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 නොවැම්බර් මස 24 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2031 - B 82516— 5,403 (2023/11)

පළාත් පාලන නිවේදන

ගම්පහ මහා නගර සභාව

2024 වර්ෂය තුළ මස් මාංශ වෙළෙඳසැල් වසා තැබීම

2024 වර්ෂය සඳහා පෝය දිනවල හා ලෝක සත්ව දිනයේ දී මස් මාංශ අලෙවිසැල් වසා තැබීම සම්බන්ධව ගම්පහ මහා නගර සභාව විසින් 2023.08.18 දින පැවති කළමනාකරණ කමිටුව (15) මගින් නිර්දේශ කර තීරණ අංක 35 යටතේ පහත දැක්වෙන යෝජනාව අනුමත කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

නාගරික කොමසාරිස්,
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ගම්පහ මහා නගර සභාව.

ගම්පහ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේ යෙදෙන පහත සඳහන් සියලුම පෝය දිනවල හා ලෝක සත්ත්ව දිනය යෙදෙන ඔක්තෝබර් 04 දිනය මස් මාංශ අලෙවිසැල් වසා තැබිය යුතු යැයි තීරණය කරමි.

2024 ජනවාරි 25	2024 ජූලි 20
2024 පෙබරවාරි 24	2024 අගෝස්තු 19
2024 මාර්තු 24	2024 සැප්තැම්බර් 17
2024 අප්‍රේල් 23	2024 ඔක්තෝබර් 04
2024 මැයි 23	2024 ඔක්තෝබර් 17
2024 මැයි 24	2024 නොවැම්බර් 15
2024 ජුනි 21	2024 දෙසැම්බර් 14

11-324

පස්සර ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළ කෙටුම්පත් අයවැය ලේඛනය මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බව දැනුම් දීම

පස්සර ප්‍රාදේශීය සභාවේ 2024 වර්ෂයට අදාළ කෙටුම්පත් අයවැය ලේඛනය මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා පස්සර ප්‍රාදේශීය සභා ප්‍රධාන පුස්තකාලයේ හා 10 කණුව උපකාර්යාල පුස්තකාලයේ 2023.11.17 දින සිට 2023.11.27 වැනි දින දක්වා මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. එස්. එම්. එන්. වනසිංහ,
සභා ලේකම්,
පස්සර ප්‍රාදේශීය සභාව.

11-377

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 134 (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින තීරණ අංක 2023/10/18/566 යටතේ ගෙන ඇති පහත සඳහන් තීරණයට එකී පනතේ 134 (1) උපවගන්තියෙන් පළාත් පාලන සහකාර

කොමසාරිස් වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරනු ලබන සංදීපනී නිල්මිණි දම්මුල්ලගේ වන මවිසින් අනුමැතිය දෙන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංදීපනී නිල්මිණී දම්මුල්ලගේ,
පළාත් පාලන සහකාර කොමසාරිස් - ගාල්ල.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින,
ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි 177 C යක්කලමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාශය, 177 D යක්කලමුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශය, 183 තල්ගම්පල ග්‍රාම නිලධාරි කොට්ඨාශය සහ 183 B තල්ගම්පල උතුර ග්‍රාම නිලාධාරි කොට්ඨාශ වලින් සමන්විත ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත් ඒ සඳහා ගාල්ල දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණය කළෙමි.

11-363

මොරටුව මහා නගර සභාව

2024 වර්ෂය සඳහා වැඩසටහන් අයවැය ලේඛනය

අංක 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 212 (ආ) වගන්තිය ප්‍රකාර මොරටුව මහා නගර සභාවේ 2024 වර්ෂය සඳහා වන වැඩසටහන් අය-වැය ලේඛන කෙටුම්පත 2023.11.17 දින සිට දින හතක් (07) කාර්යාල වේලාව තුළ මහජන විමර්ශනය පිණිස නගර සභා කාර්යාලයේ, කටුබැද්ද ජනසෙත පුස්තකාලයේ හා පීරිස් මාවතේ පිහිටි මොරටුව මහා නගර සභා පුස්තකාලයේ තබා ඇති බව දන්වමි.

එල්. පී. මනෝජා එස්. පතිරණ,
බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මොරටුව මහා නගර සභාව.

11-483

අක්කරයිපත්තු මහ නගර සභාව

2024 වර්ෂය සඳහා වැඩසටහන් අයවැය ලේඛනය

මහ නගර සභා ආඥාපනතේ 252 වැනි අධිකාරය 212 (ආ) වගන්තිය ප්‍රකාරව අක්කරයිපත්තු මහ නගර සභාව වෙනුවෙන් 2024 මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම් හා වියදම් ප්‍රකාශය ඇතුළත් අයවැය ලේඛනය 2023.11.20 වැනි දින සිට දින 07ක කාලයක් මහජනයාට පරීක්ෂා කිරීම සඳහා අක්කරයිපත්තු මහ නගර සභා කාර්යාලයේ තබා ඇති බව දැනුම් දෙමි.

ඒ. ටී. එම්. රාෆි,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
අක්කරපත්තුව.

11-484

උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

වරිපනම් ප්‍රතිශතය සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134 (1) උපවගන්තියෙන් ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ දේපළ මත වාර්ෂික වටිනාකමින් සියයට 5% වාර්ෂික වරිපනම් බද්දක් පනවා අයකිරීම සඳහා පලාගල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන පලාගල ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ඒ. පුන්‍යා කුමාරි ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේ ය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
උතුරු මැද පළාත.

2023 අගෝස්තු මස 16 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

11-460/1

උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

විෂය භාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන පලාගල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අළුත් තක්සේරුවක් හෝ සත්‍යාක්ෂණයක් කිරීමට 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ විධානය ලබාගත යුතු බවට තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වගන්තිය ප්‍රකාරව පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ දේපළ මත අළුත් තක්සේරුවක් හා සත්‍යාක්ෂණයක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් පලාගල ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපළ මත අළුත් තක්සේරුවක් හා සත්‍යාක්ෂණයක් සඳහා විධානය කරනු ලබන්නේ ය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
උතුරු මැද පළාත.

2023 අගෝස්තු මස 16 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

11-460/2

කොළොන්නාව නගර සභාව

2024 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීමේ නිවේදනය

කොළොන්නාව නගර සභාවේ ලේකම් හා සභාවේ බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී හේවා මාරඹගේ නෙලුම් කුමාරි වන මම 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව

කොළොන්නාව නගර සභාවේ, 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160 (1) වන වගන්තියෙන් කොළොන්නාව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කොළොන්නාව නගර සභා බල ප්‍රදේශයේ 2024 වර්ෂයට අදාළ වරිපනම් බදු පනවා අයකල යුතු බව 2023 වර්ෂයේ නොවැම්බර් මස 01 දිනැති තීරණ අංක 1598 මගින් පහත සඳහන් තීරණය ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. නෙලුම් කුමාරි,
ලේකම් හා සභාවේ බලතල, කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිළධාරී,
කොළොන්නාව නගර සභාව.

2023 නොවැම්බර් මස 01 වැනි දින,
කොළොන්නාව නගර සභා කාර්යාලයේ දී ය.

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම සම්බන්ධ තීරණය

කොළොන්නාව නගර සභාවේ, ලේකම් හා සභාවේ බලතල, කාර්ය, කර්තව්‍යය, ක්‍රියාත්මක කරන නිළධාරී හේවා මාරඹගේ නෙලුම් කුමාරි වන මම 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කොළොන්නාව නගර සභා බල ප්‍රදේශය තුල 2024 වර්ෂයට අදාලව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව තීරණය කරමි.

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160 වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ කොළොන්නාව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බල ප්‍රදේශය තුළ පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලි වල, ඉඩම්වල, ගෙපත්වල 2024 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා 2023 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත් 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් නේවාසික 8% ක් ද, වාණිජ 22%ක වාර්ෂික වරිපනම් බද්දක් ද පනවා අයකළ යුතු බවටත්,

තව ද, 2024 වර්ෂයෙ හි පහත උපලේඛනයෙ හි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2024, එම වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල නගර සභා අරමුදලට ගෙවන්නේ නම් එම කාර්තුවකට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද කොළොන්නාව නගර සභාව ලබා දිය යුතු බවටත්, තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව *කාර්තුව*	*II වැනි තීරුව* *ගෙවිය යුතු දිනය*	*III වැනි තීරුව* *5% වට්ටම සඳහා නිමිකම ලබන අවසාන දිනය*
පළමු කාර්තුව	2024 මාර්තු 31 දිනට පෙර	2024 ජනවාරි 31
දෙවන කාර්තුව	2024 ජුනි 30 දිනයට පෙර	2024 අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2024 සැප්තැම්බර් මස 30 දිනට පෙර	2024 ජූලි 31
හතරවන කාර්තුව	2024 දෙසැම්බර් 31 දිනට පෙර	2024 ඔක්තෝබර් 31

එච්. එම්. නෙලුම් කුමාරි,
ලේකම් හා සභාවේ බලතල, කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිළධාරී,
කොළොන්නාව නගර සභාව.

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) (අ) වගන්තිය යටතේ විරෝධතා කැඳවීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව, බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් හා මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී වන මා විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මං මාවත් මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ 2023 සැප්තැම්බර් මස 26 දින තීරණ අංක 2023.09.26/356 යටතේ මිල්ලනිය ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් ප්‍රකාශයට පත් කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම් හිමිකරුවන් විසින් හිමිකම් පාන පාර්ශ්වයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තුන්මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්ති ප්‍රකාරව ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ, මෙම නිවේදනය පිළිබඳව යම් විරෝධතාවයක් පළ නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් මිල්ලනිය ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

වයි. පී. මහේන්ද්‍ර,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය,
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

ග්‍රාම සේවා කොට්ඨාසය	*මාර්ගයේ නම*	*ආරම්භ වන ස්ථානය*	*අවසන් වන ස්ථානය*	*මාර්ගයේ දිග (මීටර්)*	*මාර්ගයේ පළල (මීටර්)*
අංක 645 බී, දෙල්දොරවත්ත	දෙල් දොරවත්ත සිට පුස්සැල්හේන දක්වා මාර්ගය	දෙල්දොරවත්ත හන්දිය	පුස්සැල්හේන හන්දිය	1235	6.10
අංක 645, මිල්ලනිය	ලඟාන සිට දාමින්ගමුව දක්වා මාර්ගය	හල්තොට මිල්ලනිය ප්‍රධාන පාර	දාමින්ගමුව හන්දිය	950	6.10

11-358/1

ඌව පරණගම ප්‍රාදේශීය සභාව

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ 9 වන වගන්තියේ (2) වන උප වගන්තියේ ප්‍රතිපාදන අනුව ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 14 වැනි දින, තීරණ අංක 2023/09/14-151 යටතේ ගෙන ඇති පහත සඳහන් තීරණයට, එකී පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත ලැබී ඇති බලතල යටතේ බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස් ඊ. ජී. ජේ. පී. ආරියරත්න වන මා විසින් අනුමැතිය දෙනු ලැබ ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස්,
බදුල්ල දිස්ත්‍රික්කය.

2023 ඔක්තෝබර් මස 31 වැනි දින,
සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ දී ය.

තීරණය

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උඟවපරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි පහත උපලේඛනයේ විස්තර කෙරෙන ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට තීරණය කළ බවත්, එම තීරණයට බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කළ යුතු බවටත් තීරණය කරමි.''

උපලේඛනය

උඟවපරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 47A අඹගස්දෝව ග්‍රාම නිළධාරී වසම, අංක 47C රතඹ ග්‍රාම නිලධාරී වසම, අංක 47D දරගල ග්‍රාම නිළධාරී වසම යන ග්‍රාම නිලධාරී වසම් ප්‍රදේශය තුලට ඇතුලත් වන්නා වූ,

උතුරට	:	අංක 43 පරණගම ග්‍රාම නිලධාරී වසම, 45C කුරුඳුගොල්ල ග්‍රාම නිලධාරී වසම, 45 කුමාරපට්ටිය ග්‍රාම නිලධාරී වසම දරන දේපළ වලින් ද,
නැගෙනහිරට	:	අංක 45G බලගල ග්‍රාම නිලධාරී වසම්, 53G ඩවුන්සයිඩ් ග්‍රාම නිලධාරී වසම, දරන දේපළ වලින් ද,
දකුණට	:	ප්‍රාදේශීය සභා සීමා වලින් ද,
බටහිරට	:	අංක 47B දංගමුව ග්‍රාම නිලධාරී වසම්, 47F පන්නලගම ග්‍රාම නිලධාරී වසම්, දරන දේපළ වලින් ද,

මායිම් ව ඇති රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ඇඳ සාදන ලද අංක NDC/22/13 දරන පහත සිතියමෙන් පෙන්නුම් කරන ප්‍රදේශය.


Ward Map of Uva Paranagama Pradeshiya Sabha- Badulla District
Ref. No : NDC / 22 / 13
Uva Paranagama Pradeshiya Sabha
Uva Paranagama Pradeshiya Sabha
WARD No
WARD Name
1 Maspanna
2 Wewegama
3 Gampaha
4 Dimbulana
5 Bambarapana
6 Welulla
7 Pannalawela
8 Ethkandawaka
9 Paranagama
10 Thawalampola
11 Uduhawara
12 Perawella
13 Galahagama
14 Medawela
15 Dangamuwa
16 Ambagasdowa
17 Pallewela
18 Yahala Arawa
19 Kotawera
20 Rathamba
Legend
Province Boundary
District Boundary
DS Boundary
GN Boundary
Polling Division Boundary
PS Boundary
MC / UC Boundary
Ward Boundary
Multi Member Ward
Prepared by Survey Department of Sri Lanka
Data Source:
National Delimitation Committee for Local Authorities - 2013
Ministry of Local Government and Provincial Councils
GN No
GN Name
43A Thawalampola
43C Idamegama
43E Ranhawadigama
44B Welamedagama
45 Kumarapattiya
45C Kurundugolla
46C Karagahaulpatha
47A Ambagasdowa
47F Pannalagama
53C Yahala Arawa
53F Kotawera Pahalagama
NUWARA ELIYA DISTRICT
Kandakeliya Pradeshiya Sabha
Hali-Ela Pradeshiya Sabha
Welimada Pradeshiya Sabha
Scale - 1:70,000
205000
220000
200000

විවිධ දැන්වීම්

කොළඹ මහා නගර සභාව

1979 අංක 42 සහ 1985 අංක 20 දරන මහා නගර සභා සංශෝධන පනත්වලින් සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) 247 අ, 247 ආ, 247 ඇ සහ 247 ඉ යන වගන්ති යටතේ කොළඹ මහා නගර සභාව විසින් 2024 වර්ෂය සඳහා පනවා ඇති බලපත්‍ර ගාස්තු සහ බදු අය කිරීම.

2023.10.17 කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් හා සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි විසින් තීරණ අංක 354 ප්‍රකාරව 2024 වර්ෂය සඳහා කොළඹ මහා නගර සභාව විසින් පනවා අය කිරීමට ඇති වෙළඳ බලපත්‍ර ගාස්තු කර්මාන්ත විෂයෙහි සහ/හෝ වෙළඳ ව්‍යාපාර විෂයෙහි බදු සහ ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු අය කිරීම පිළිබඳව ගාස්තු චක්‍රයක් පහත දැක්වෙන උපලේඛනයෙහි (1), (2), (3), (4) අනුපිළිවෙලින් සියලු දෙනාගේ ම දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම ගාස්තු 2024.12.31 දක්වා බලපැවැත්වේ.

2024 වර්ෂය සඳහා ගෙවිය යුතු මෙම බලපත්‍ර ගාස්තු සහ බදු මුදල් 2024.03.31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු බව මෙයින් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. භද්‍රානි ජයවර්ධන,
නාගරික කොමසාරිස් හා සභාවේ බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

කොළඹ මහා නගර සභාව,
පුරහල,
කොළඹ 07.

උපලේඛන අංක 01

247 "අ" වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තුව

(I) *බලපත්‍ර ගාස්තු චක්‍රය :*

ස්ථානයේ වාර්ෂික වටිනාකම *රු. ශත*	*බලපත්‍ර ගාස්තුව* *රු. ශත*
1,500 0 නොඉක්මවන විට	2,000 0
1,501 0 ඉක්මවන නමුත් 2,500 0 නොඉක්මවන විට	3,000 0
2,500 0 ඉක්මවන විට	5,000 0

(II) *ස්ථානය භාවිතා කරනු ලබන බලපත්‍රය ලබාගත යුතු කාර්යයන් සම්බන්ධ ලැයිස්තුව :*

1. මිනිරන් සකස් කිරීම හා ශ්‍රේණි කිරීම.
2. මිනිරන් ගබඩා කිරීම.
3. පොහොර නිෂ්පාදනය
4. පොහොර ගබඩා කිරීම
5. හම් ගබඩා කිරීම/නිෂ්පාදනය කිරීම.
6. කිලෝග්‍රෑම් 250 ට වඩා උම්බලකඩ ගබඩා කිරීම.
7. කුකුළන් ඇති කිරීම.
8. කළුගල් හෝ කබොක් ගල් හෑරීම.
9. බොරළු හෑරීම.
10. හරකුන් හෝ අශ්වයන් සඳහා මඩුවක් හෝ ඉස්තාලයක් පැවැත්වීම.
11. සත්ත්ව රෝහලක් පැවැත්වීම.
12. රබර් සකස් කිරීම.

13. මයිකා ශුද්ධ කිරීම.
14. බැටළුවන් සහ/ හෝ එළුවන් 10 ක් හෝ වැඩි ගණනක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම.
15. උළු, කොන්ක්‍රීට්, පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
16. කරඳමුංගු/කෙඳි/කුරුඳු/ගෙන්දගම් දුම යොදා සකස් කිරීම.
17. සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1,250 ට වඩා ගබඩා කිරීම.
18. ඔට්ටපාළු ඇඹරීම හා වේළීම.
19. ට්‍රන්ක පෙට්ටි හෝ/සහ සූට්කේස් නිෂ්පාදනය කිරීම.
20. ඉන්ජෙක්ටර් පොම්ප සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. විෂබීජනාශක නිෂ්පාදනය කිරීම.
22. ටයර් නැවත පිරවීමේ හෝ කට්ටා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
23. කුරුඳු කිලෝ ග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම.
24. කොකෝවා කිලෝ ග්‍රෑම් 500 ට වඩා ගබඩා කිරීම.
25. ලී බඩු නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
26. මැණික් කැපීම සහ/හෝ දියමන්ති ඔප දැමීම. (මැණික් ව්‍යාපාරිකයන් විසින්)
27. බලයලත් වෙළෙඳුන් විසින් රබර් ගබඩා කිරීම.
28. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කිරීම.
29. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය සහ/හෝ ගබඩා කිරීම.
30. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන රෙදි මෝලක් පවත්වාගෙන යාම.
31. පිටි හෝ කුළුබඩු වර්ග ඇඹරීම.
32. වාණිජමය කටයුතු සඳහා සත්ත්ව ආහාර පිණිස කිලෝග්‍රෑම් 100 කට වඩා ධාන්‍ය ගබඩා කිරීම (සමූපකාර ගබඩාවන් හැර)
33. රබර් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
34. මෝර වරල් සකස් කිරීම හා ගබඩා කිරීම.
35. යන්ත්‍ර මගින් ඇටකටු ඇඹරීම.
36. පොලිතීන්, සැලෝලයිට් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
37. ලීටර් 25 ට වඩා සහ/හෝ කිලෝ ග්‍රෑම් 20 ට වඩා අම්ල වර්ග (ඇසිඩ්) සහ/හෝ රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම.
38. පාවහන්/පාවහන් කොටස් සහ/හෝ බූට්ස් නිෂ්පාදනය කිරීම.
39. ඉටිපන්දම් නිෂ්පාදනය කිරීම.
40. වාෂ්ප බලයෙන්, ජල බලයෙන්, විදුලි බලයෙන් හෝ යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.
41. සිසිල් බීම/ පළතුරු බීම/ සෝස් වර්ග නිෂ්පාදනය කිරීම.
42. කොප්පරා ගබඩාවක් තබා ගැනීම.
43. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය කිරීම.
44. යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය කිරීම.
45. තෙල් සිඳීම පිණිස සෙක්කුවක් හෝ අතින් ක්‍රියා කරවන මෝලක් පැවැත්වීම.
46. රෙදි වර්ග නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම.
47. ගිනිපෙට්ටි නිෂ්පාදනය කිරීම.
48. පුළුන් ගබඩා කිරීම.
49. ලීටර් 225 කට වඩා පොල්තෙල් ගබඩා කිරීම.
50. මැතිලේටඩ් ස්ප්‍රිතු ගබඩා කිරීම.
51. ඇසිටිලින් සහ/හෝ ඔක්සිජන් නිෂ්පාදනය කිරීම.
52. උළු 500 ට වඩා ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
53. ගඩොල් 250 ට වඩා ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
54. කබොක් ගල් 250 ට වඩා ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
55. සිගරට් නිෂ්පාදනය කිරීම.
56. බීඩි සහ/හෝ සුරුට්ටු නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
57. කිලෝග්‍රෑම් 250 ට වඩා ලී පෙට්ටි ගබඩා කිරීම.
58. කොහු නිෂ්පාදනය.
59. රස කැවිලි නිෂ්පාදනය.
60. අඟුරු සහ/හෝ පොල්කටු අඟුරු කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම.
61. බෝට්ටු හෝ බත්තල් නිෂ්පාදනය කිරීම.

62. ලී පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම.
63. මෝටර් රථවාහන අලුත්වැඩියා කිරීම කරන ගරාජයක් හැර යකඩ සහ/හෝ වානේ වැඩපොලක් පවත්වාගෙන යාම.
64. මෝටර් රථවාහන අලුත්වැඩියා කිරීම/ කරන ගරාජයක් හැර ඔක්සිජන් වෑල්ඩිං සහ විදුලි වෑල්ඩිං පොලක් පවත්වාගෙන යාම.
65. මෝටර් රථවාහන අලුත්වැඩියා කරන ගරාජයක් පවත්වාගෙන යාම.
66. මෝටර් රථවාහන සේවා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
67. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම. (සේවකයින් 25 හෝ ඊට වැඩි)
68. පොල්තෙල් හැර වෙනත් ඕනෑම වර්ගයක තෙල් ලීටර් 50 ට වඩා ගබඩා කිරීම.
69. ගෙන්දගම් සහ/හෝ ගෙන්දගම් කුඩු කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම.
70. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය කිරීම.
71. පතරොම් 100 ට වඩා ගබඩා කිරීම.
72. කොහු/මෙට්ට/කොට්ට/කුෂන් වැනි දෑ නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම.
73. අලුත් ටයර් හෝ ටියුබ් 50 කට වඩා ගබඩා කිරීම.
74. විසිරි පින්තාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
75. විදුලි බලයෙන් හැර යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
76. යන්ත්‍රානුසාරයෙන් ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
77. කමිස කරපටි සහ කමිස අත් සකස් කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
78. ගරාජයක් හැර යන්ත්‍රානුසාරයෙන් විද්‍යුත් ලෝහාලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
79. ගෑස්/ගල් අඟුරු ගෑස් නිපදවීම, ගබඩා කිරීම හෝ වෙළෙඳාම් කිරීම.
80. අම්ලකර වායු බල කම්හලක් පවත්වාගෙන යාම.
81. යපස් උණු කිරීම.
82. රතිඤ්ඤා ගබඩා කිරීම.
83. කිලෝග්‍රෑම් දෙකකට වඩා වෙඩි බෙහෙත් ගබඩා කිරීම.
84. මේද, ඉටි වර්ග, මැලියම් වර්ග ගබඩා කිරීම.
85. ගෙබිම පොලිෂ් නිෂ්පාදනය කිරීම.
86. තාර පිරිපහදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
87. ශීතකරණ සහ වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම, නැවත සකස් කිරීම, සහ පරීක්ෂා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
88. මෝටර් කාර් රථ එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
89. මෝටර් බයිසිකල් හෝ ස්කූටර් හෝ ත්‍රීරෝද රථ එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
90. අතුනුබහන් හා සත්ත්ව තෙල් උණු කිරීම.
91. සබන් නිෂ්පාදනය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
92. තෙල් උණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
93. රෙදි ඩයි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
94. සම් පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
95. දේශීය බෙහෙත් ද්‍රව්‍ය යොදා බීම වර්ග නිෂ්පාදනය කිරීම හා විකිණීම.
96. සව් නිෂ්පාදනය කිරීම.
97. වෙඩි බෙහෙත් නිෂ්පාදනය කිරීම.
98. ගිනිකෙළි නිෂ්පාදනය කිරීම.
99. පිදුරු ගබඩාවක් පවත්වාගෙන යාම.
100. ඇටකටු ගබඩාවක් පවත්වාගෙන යාම.
101. ගිනි ගන්නා සුළු තෙල් ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
102. පපඩම් නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම.
103. හෝටලයක් පවත්වාගෙන යාම.
104. ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාම.
105. කිරි පට්ටියක් පවත්වාගෙන යාම.
106. ධාන්‍ය වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
107. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීම.
108. පුන්නක්කු කිලෝග්‍රෑම් 1000 ට වඩා ගබඩා කිරීම.

109. පුන්නක්කු හැර වෙනත් සත්ත්ව ආහාර කිලෝග්‍රෑම් 1000 ට වඩා ගබඩා කිරීම.
110. අතින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
111. පොහොර, මිනිරන්, අළුහුණු බහාලීම සඳහා පාවිච්චි කරන ලද ගෝනි ගබඩා කිරීම, ශුද්ධ කිරීම හෝ අලුත්වැඩියා කිරීම.
112. පුවක් ශුද්ධ කර දීම.
113. පොල්කටු අඟුරු කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම හෝ ඒ හා ආශ්‍රිත කර්මාන්තයක් පවත්වාගෙන යාම.
114. පරණ යකඩ ගබඩා කිරීම.
115. ග්ලූ හා ගම් වර්ග නිෂ්පාදනය සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
116. බැටරි නැවත පිරවීම හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
117. හිස් බෝතල් 100 ට වඩා ගබඩා කිරීම.
118. මිනී පෙට්ටි නිෂ්පාදනය සහ/හෝ ගබඩා කිරීම.
119. කපුරු නිෂ්පාදනය කිරීම.
120. පොහොර, හුණු, මිනිරන් බහාලීම සඳහා පාවිච්චි නොකරන ලද ගෝනි 100 ට වඩා ගබඩා කිරීම.
121. පාවිච්චි කරන ලද ටයර් හෝ ටියුබ් 100 ට වඩා ගබඩා කිරීම.
122. පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කිරීම.
123. අලුත් සහ/හෝ පරණ කඩදාසි කිලෝග්‍රෑම් 250 ට වඩා ගබඩා කිරීම.
124. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරනු නොලබන විද්‍යුත් අලේපනය, ක්‍රෝමියම් ආලේපනය, රන් ආලේපනය, රිදී ආලේපනය හෝ තඹ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
125. දර මඩුවක් පවත්වාගෙන යාම.
126. හකුරු නිෂ්පාදනය සහ/හෝ ගබඩා කිරීම.
127. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම. (සේවක සංඛ්‍යාව 25 ට අඩු)
128. බොම්බයි ඵෑණු කිලෝග්‍රෑම් 250 ට වඩා ගබඩා කිරීම.
129. අර්තාපල් කිලෝග්‍රෑම් 250 ට වඩා ගබඩා කිරීම.
130. කරවල කිලෝග්‍රෑම් 500 ට වඩා ගබඩා කිරීම.
131. ජාඩි කිලෝග්‍රෑම් 500 ට වඩා ගබඩා කිරීම.
132. ඇඳුම් ඩ්‍රයි ක්ලීන් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
133. කෝපි හෝ තේ පැන් ශාලාවක් පවත්වාගෙන යාම.
134. කෑම විකුණන ස්ථානයක් හා/හෝ බත් කඩයක් පවත්වාගෙන යාම. (හුදෙක්ම සාමාජිකයින් සඳහා පමණක්ම සුභ සාධක සංගම් මඟින් පවත්වන ආපන ශාලා බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් ය.)
135. නේවාසිකාගාරයක් පවත්වාගෙන යාම.
136. භෝජනාගාරයක් හා/හෝ ආපන ශාලාවක් පවත්වාගෙන යාම.
137. බේකරියක් පවත්වාගෙන යාම.
138. බාබර් සාප්පුවක් සහ/හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම. (සම්භාහන මධ්‍යස්ථාන හැර)
139. ලොන්ඩරියක් පවත්වාගෙන යාම.
140. හුණු ගබඩා කිරීම.
141. ටයර්, ටියුබ්, වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
142. බන්දිත ගුදම් පවත්වාගෙන යාම.
143. සීනි ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
144. තිරිඟු පිටි ගබඩා කිරීම සහ/ හෝ වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
145. ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
146. යන්ත්‍රානුසාරයෙන්, විදුලි බලයෙන් හෝ වාෂ්ප බලයෙන් ක්‍රියා කරන කුමන අන්දමක හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම හා ගබඩා කිරීම සඳහා කාර්මික ආයතනයක් පවත්වාගෙන යාම.
147. මනුෂ්‍ය පරිභෝජනය සඳහා ගන්නා සියලුම ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හා ගබඩා කිරීම.
148. දේශීය හෝ බටහිර ඖෂධ නිෂ්පාදනය කිරීම.
149. අවමංගල ශාලාවක් පවත්වාගෙන යාම
150. මෘත ශරීර කල් තබා ගැනීමේ/සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (එම්බාම් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම)
151. ලැගුම් නිවාස පවත්වාගෙන යාම

(iii) ලංකා සංචාරක මණ්ඩලයේ (වර්තමාන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ) ලියාපදිංචි කර ඇත්තා වූ හෝ එම මණ්ඩලය මගින් අනුමත කර ඇත්තා වූ හෝ හෝටල්වලින්, නවාතැන්පලවල්වලින් හෝ ආපනශාලාවලින් අදාළ හෝටලයේ,

නවාතැන්පොලේ හෝ ආපනශාලාවේ පසුගිය වර්ෂයේ මුළු ලැබීම් වලින් සියයට දශම පහක (0.5%) බලපත්‍ර ගාස්තුවක් 2024 ජනවාරි මස 01 වැනි දින සිට පනවා අය කිරීම.

උපලේඛන අංක 02

247 "(ආ)" වගන්තිය යටතෙ හි ඇතැම් කර්මාන්ත විෂයෙහි බදු

(i) *බදු ගාස්තු චක්‍රය :*

ස්ථානයේ වාර්ෂික වටිනාකම *රු. ශත*	*අයවිය යුතු බදු මුදල්* *රු. ශත*
රු. 1,500 0 නොඉක්මවන විට	2,000 0
රු. 1,501 0 ඉක්මවන නමුත් රු. 2,500 0 නොඉක්මවන විට	3,000 0
රු. 2,500 0 ඉක්මවන විට	5,000 0

(ආ) *කර්මාන්ත ලැයිස්තුව :*

1. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
2. කාර්යාල බඩු බාහිරාදිය ගබඩා කිරීම සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වගෙන යාම.
3. පාවිච්චි කළ සහ/හෝ අලුත් මෝටර් රථ ගෙන්වීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
4. අලුත් හෝ පාවිච්චි කරන ලද මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
5. ශීතකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
6. විදුරු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
7. රූපවාහිනී යන්ත්‍ර ගෙන්වීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
8. බටහිර ඖෂධ වර්ග වෙළෙඳාම් කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
9. බලයලත් මත්පැන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
10. බිස්කට් සහ/හෝ ටින් කෑම වර්ග විකුණනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම.
11. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
12. රෙදිපිළි වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙනයාම.
13. භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
14. බයිසිකල් විකිණීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
15. මෝටර් සයිකල් සහ/හෝ ස්කූටර් හා/හෝ ත්‍රිරෝද රථ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
16. චීනච්චට්ටි භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
17. පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
18. වායු සමීකරණ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
19. මාළු අල්ලන දැල් නිෂ්පාදනය කිරීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
20. සබන් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. විවිධ භාණ්ඩ නැවිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
22. රෙදිපිළි මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
23. මැණික් සහ/හෝ දියමන්ති කැපීමේ හා පුහුණු කිරීමේ පාසලක් පවත්වාගෙන යාම.
24. ඉවතලන නූල් හෝ ජූට් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
25. ආහාර ද්‍රව්‍ය හෝ වෙනත් පාරිභෝගික ද්‍රව්‍ය අපනයනයට සහ/හෝ ආනයනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
26. ආරක්ෂක සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
27. කැසට් පටිගත කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
28. මහන මැෂින් ගෙන්වීම සහ/හෝ විකිණීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
29. පරිගණක යන්ත්‍ර ගෙන්වීම සහ/හෝ විකිණීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
30. චංචල හෝ නිශ්චල දේපළ විකිණීමේ ස්ථානයක්/ආයතනයක් පවත්වාගෙන යාම.

31. ඇස් කණ්නාඩි නිෂ්පාදනය සහ/හෝ ස්ථානයක්/විකිණීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
32. ලාම්පු ආවරණ නිෂ්පාදනය සහ/හෝ ස්ථානයක්/විකිණීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
33. යකඩ බඩු විකිණීමේ ස්ථානයක් /ආයතනයක් පවත්වාගෙන යාම.
34. මැණික් හා දියමන්ති වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
35. තොග වශයෙන් කොහු ලණු ගබඩා කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
36. ඉටිපන්දම් ගබඩා කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
37. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ සහ /හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
38. විදුලිබල උත්පාදන යන්ත්‍ර කුලියට දීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
39. අලුත් ටයර්, ටියුබ් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
40. ප්‍රචාරක සේවා ස්ථානයක් පවත්වාගෙන යාම.
41. සිගරට් හෝ බීඩි වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
42. මසා නිමකළ ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
43. වාණිජමය කාර්යයන් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
44. ඔරලෝසු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
45. බීජ වර්ග සහ/ හෝ පැළ වර්ග වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
46. ගුවන් සේවා කාර්යාලයක් පවත්වාගෙන යාම.
47. සංචාරක සේවා ආයතනයක් පවත්වාගෙන යාම.
48. විදේශ රැකියා සැපයීමේ ඒජන්සියක් පවත්වාගෙන යාම.
49. කන්ටේනර් නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීමේ හෝ ගබඩා කිරීමේ අංගනයක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම.
50. රූපවාහිනී යන්ත්‍ර හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
51. සුරතලය සඳහා ඇති කරන මසුන් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
52. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙනයාම.
53. නියෝජිත (ඒජන්සි) තැපැල් හලක් පවත්වාගෙන යාම.
54. අභ්‍යන්තර පණිවුඩ හුවමාරු කිරීමේ උපකරණ වෙළෙඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
55. ආයුර්වේද ඖෂධ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
56. මුළුතැන්ගෙයි උපකරණ ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
57. ඡායාරූප දල සේයාපට සේදීමේ සහ මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
58. සනීපාරක්ෂක උපකරණ සහ/හෝ පිඟන් ගඩොල් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
59. බේකරිවලට අවශ්‍ය ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
60. ලිපිද්‍රව්‍ය හා/හෝ මංගල ආරාධනා පත්‍ර වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
61. ජල පොම්ප හා උපාංග වෙළෙඳාම් කිරීම.
62. අකුරු කෙටීමේ ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම.
63. සිසිල් බීම වෙළෙඳාම් කිරීම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
64. විකිණීම සඳහා වෙළඳ ද්‍රව්‍ය ගබඩා කිරීම සහ/හෝ අංගනයක් පවත්වාගෙන යාම. (වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර හැර)
65. යකඩ තහඩු හා ඇලුමිනියම් තහඩු ආශ්‍රිත වැඩපලක් පවත්වාගෙන යාම.
66. බුමුතුරුණු සහ ෆෝමිකා ෂීට්ස් විකිණීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
67. ධීවර ආම්පන්න වෙළඳාම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
68. කේක් සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යයන් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
69. කළුගල් ආශ්‍රිතව සමරු ඵලක සහ/හෝ ෆ්ලෝ ටයිල්ස් නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
70. ගුවන් විදුලි යන්ත්‍ර අමතර කොටස් වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
71. පිඟන් බඩු වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
72. තෑගි භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
73. ආහාර ද්‍රව්‍ය සහ කුළුබඩු වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
74. වාණිජමය කටයුතු සඳහා ආයතනයක් හෝ කාර්යාලයක් පවත්වාගෙන යාම.
75. දුම්කොල ගබඩා කිරීම සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
76. දේශීය සහ/හෝ විදේශීය ආනයනික හෝ අපනයනික භාණ්ඩ ගබඩා කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

77. විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
78. කිරිගරුඬ සහ/හෝ කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
79. කඩදාසි බෑග් නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
80. කෞතුක භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
81. සිල්ලර වෙළඳසලක් පවත්වාගෙන යාම (ග්‍රොසරි).
82. සාප්පු බඩු වෙළඳසැලක් පවත්වාගෙන යාම.
83. ඡායා පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
84. අත් යන්ත්‍ර මගින් නිෂ්පාදිත රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
85. පොත් පත් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
86. අරුමෝසම් බඩු වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් සහ/හෝ සැරසිලි භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
87. වීඩියෝ කැසට් පට වෙළෙඳාම් කිරීම සහ/හෝ කුළියට දීම.
88. පොත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
89. තරාදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
90. සංගීත භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
91. හිස් බැරල් ගබඩා කිරීම සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
92. මංගල හෝ අවමංගල කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීම හෝ කුලියට දීම.
93. බිත්තර වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
94. සිහිවටන නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
95. පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
96. සෙල්ලම් බඩු ගබඩා කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
97. මල් සාප්පුවක් පවත්වාගෙන යාම.
98. ප්‍රචාරක දැන්වීම්, අතින් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
99. ගොවි උපකරණ ආම්පන්න වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
100. දුරකථන/ටෙලෙක්ස් පණිවුඩ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
101. වෛද්‍ය උපකරණ ආනයනය කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීම.
102. පපඩම් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
103. පොල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
104. කිරි ආහාර වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
105. කඩල වර්ග වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
106. බයිසිකල් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
107. හැලි වලං සහ/හෝ කොහු භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
108. පළතුරු වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
109. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
110. ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
111. එළවළු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
112. කුඩ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
113. කට්ටකුමංජල් ගබඩා කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
114. මල් පෝච්චි සහ/හෝ විවිධ පැල වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
115. කැටයම් කැපීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
116. ගිනි නිවීමේ ආම්පන්න සහ හෝ ආශ්වාස ප්‍රාශ්වාස උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
117. කාර්යාල උපකරණ විකිණීමේ සහ/හෝ අලුත්වැඩියා කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
118. පරිගණක යන්ත්‍ර පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
119. ගෘහ නිර්මාණ ශිල්පය හෝ සැලසුම් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
120. රිය පැදවීම පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
121. දන්ත කාර්මික ස්ථානයක් පවත්වාගෙන යාම.
122. රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
123. උපදේශක සේවා ආයතනයක් පවත්වාගෙන යාම.

124. සංචාරක බස් සේවා ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම.
125. බඩු ප්‍රවාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම.
126. දේශීය හා විදේශීය බැංකු ආයතන පවත්වාගෙන යාම.
127. රක්ෂණ සමාගම් පවත්වාගෙන යාම.
128. යන්ත්‍රෝපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
129. කුෂන් වැනි දෑ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
130. කැඩපත් සහ/හෝ ගොඩනැගිලි වීදුරු වර්ග වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
131. සම් භාණ්ඩ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
132. ප්ලාස්ටික් භාණ්ඩ ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
133. සුවඳ විලවුන් වර්ග වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
134. පාවිච්චි කරන ලද ටයර්, ටියුබ් සහ පුරවන ලද ටයර් ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
135. රසායනාගාර උපකරණ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
136. පරිගණක මගින් මුද්‍රණ කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
137. ඇලුමිනියම් භාණ්ඩ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
138. ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
139. ඉරන ලද ලී ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
140. මැටි භාණ්ඩ නිෂ්පාදනය විකිණීම සහ/හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
141. පාන් වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
142. බතික් රෙදි නිෂ්පාදනය කිරීම සහ/හෝ විකිණීම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
143. රථ වාහන රෝද සමබර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
144. කුඩ නිෂ්පාදනය කිරීම සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
145. නූල් නිෂ්පාදනය කිරීම සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
146. තේ කුඩු ගබඩා කිරීම සහ/හෝ පැකට් කිරීම සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
147. ලී බඩු වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
148. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම.
149. ප්ලාස්ටික් භාණ්ඩ සහ/හෝ ෆයිබර් ග්ලාස් භාණ්ඩ නිෂ්පාදනය සහ/හෝ විකිණීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
150. පෞද්ගලික සාත්තු නිවාසයක් හෝ රෝහලක් පවත්වාගෙන යාම.
151. ලොරි බොඩි සහ අනෙකුත් වාහන සඳහා බොඩි ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
152. විනාකිරි නිෂ්පාදනය සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
153. ශීත කළ පළතුරු බීම නිෂ්පාදනය කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
154. වෛද්‍ය පරීක්ෂණාගාරයක් පවත්වාගෙන යාම.
155. ගිනි අවි වෙළඳාම් කිරීමේ සහ/හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
156. වානේ හෝ යකඩ කම්බිවලින් තැනූ විවිධ උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
157. විවිධ එසෙන්ස් වර්ග නිෂ්පාදනය කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
158. ප්ලාස්ටික් වැනි දෑ උපයෝගී කරගෙන ක්‍රීඩා භාණ්ඩ/ විසිතුරු භාණ්ඩ හෝ වෙනත් විවිධ දෑ නිෂ්පාදනය කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
159. රසායනික ද්‍රව්‍ය සහ/හෝ රසායනාගාර උපකරණ නිෂ්පාදනය කිරීමේ ගබඩා කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
160. උත්සව සඳහා කෑම වර්ග සහ/හෝ සිසිල් බීම නිෂ්පාදනය කිරීම සහ සැපයීම.
161. කපාපු පොල් වෙළඳාම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
162. බණිජ වර්ග වෙළඳාම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
163. පූජා භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
164. වැලි සහ/හෝ කළුගල් ගබඩා කිරීමේ හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
165. දියලුණු කි.ග්‍රෑ. 1,000 ට වඩා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

166. කිරිහලක් පවත්වාගෙන යාම.
167. කාර් හූඩ් සහ ආසන සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
168. හඳුන්කුරු නිෂ්පාදනය සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
169. මී පැණි/ පොල් පැණි/ කිතුල් පැණි/ හෝ වෙනත් පැණි වර්ග සෑදීමේ/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
170. කාර්මික ආයතනයක් පවත්වාගෙන යාම.
171. අවුල්පත් (රසකැවිලි) සහ /හෝ කෙටි කෑම වර්ග වෙළඳසලක් පවත්වාගෙන යාම.
172. රබර් සීල් සහ/හෝ බ්ලොක් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
173. ලෝහ සහ/හෝ ෆයිබ්‍රග්ලාස් යකඩ තහඩුවලින් විවිධ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
174. නූඩ්ල්ස් සෑදීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
175. මයින හමක් සහ ඒ හා සමාන උපකරණයක් භාවිතා කිරීමේ ස්ථානයක් (කම්හලක්) පවත්වාගෙන යාම.
176. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම සහ/හෝ ප්‍රදර්ශනය කිරීම සහ/හෝ අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
177. රථ වාහන ගාලක් පවත්වාගෙන යාම.
178. පරිගණක සහ දුරකථන ආශ්‍රිත අන්තර්ජාල සේවා හා ඊ මේල් සේවා ඇතුළත් සයිබර් කැෆේ ආයතනයක් පවත්වාගෙන යාම.
179. බෝතල්ගත කරන ලද වතුර විකිණීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
180. උත්සවශාලා කුලියට දීම.
181. රථවාහන කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
182. වාහන බර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
183. භාණ්ඩ නිෂ්කාශනය කිරීමේ කාර්යාලයක් පවත්වාගෙන යාම.
184. අයිස්ක්‍රීම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
185. කෘත්‍රිම මල් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
186. මහා නගර සභා ආඥාපනතේ 247 අ හෝ 247 ඈ වැනි වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු හෝ වෙළෙඳ ව්‍යාපාර විෂයයෙහි බදු නොගෙවන ඉහතින් සඳහන් නොවූ වාණිජ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
187. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
188. පරිගණක අලුත්වැඩියා කිරීමේ හා උපාංග සහ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
189. ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ, විකිණීමේ හා අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
190. රබර් සීල් හා යකඩ මුද්‍රා නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
191. නාවික කටයුතු සඳහා කාර්යාලයක් පවත්වාගෙන යාම.
192. විදුලි බිල් අයකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
193. අලුත් යකඩ වෙළෙඳාම/ගබඩා කිරීම.
194. බෝතල්ගත කරන ලද ලිහිසි තෙල් වෙළඳාම.
195. විදේශ මුදල් හුවමාරු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
196. අම්ල වර්ග, රසායනික ද්‍රව්‍ය හැර වෙනත් ගෙබිම හා ගොඩනැගිලි පිරිසිදු කිරීමේ දියර වර්ග ගබඩා කිරීම හෝ වෙළඳාම් කිරීම.

උපලේඛන අංක 03

247 "(ඇ)" වගන්තිය යටතෙහි පනවා ඇති වෙළඳ ව්‍යාපාර විෂයෙහි බදු

(i) *බදු වක්‍රය* :

	වෙළඳ ව්‍යාපාරයෙන් ගත වූ වර්ෂයේ දී ලත් ලැබීම්	*ගෙවිය යුතු බද්ද රු. ශත*
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
02.	රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03.	රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04.	රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
05.	රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
06.	රු. 1,50,001 ඉක්මවන විට	3,000 0

(ii) *බදු පනවන ලැබූ ව්‍යාපාර ලැයිස්තුව :*

1. කොමිස් ඒජන්තවරු
2. ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවෝ
3. මුදල් ණයට දෙන්නන්
4. බ්‍රෝකර්වරු
5. වෙන්දේසිකරුවන්
6. මුදල් ආයෝජකයින්
7. රන් බඩු උකස් ගන්නන්
8. උපදේශකවරුන් හෝ උපදේශන සේවාවන්

උපලේඛන අංක 04

1985 අංක 20 දරන මහා නගර සභා (සංශෝධන) පනතින් සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) 247 "ඉ" වැනි වගන්තිය යටතේ ඇතැම් ඉඩම් විකිණීම විෂයයෙහි බදු අය කිරීම.

කොළඹ මහා නගර සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර්කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකු *නැනහොන්* අනුයෝජකයෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ *නැනහොන්* වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබුණ මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් කෙනෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් එසේ ඒ ඉඩම විකුණාලත් මුදලින් සභාවට ගෙවිය යුතුය.

සටහන :

2024 වසර සඳහා ඉහත සඳහන් ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු අය කිරීමේ දී පහත දැක්වෙන පදනම මත ක්‍රියාත්මක වනු ඇත.

1. එක් පුද්ගලයෙකු විසින් එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කීපයකින් යුත් ගොඩනැගිල්ලක හෝ ගොඩනැගිලි කිහිපයක එකම ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නේ නම් වාර්ෂික බදු ගණනය කිරීම සඳහා පමණක් එය එක් ස්ථානයක් වශයෙන් සලකා බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු අය කරනු ඇත.

2. එක් පුද්ගලයෙකු විසින් එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කීපයකින් යුත් ගොඩනැගිල්ලක විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම් එම ව්‍යාපාරය හෝ කර්මාන්තය සඳහා යොදු ගෙන ඇති බිම් ප්‍රමාණය අනුව වාර්ෂික වටිනාකම කොටස් කර බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු වෙන වෙනම අය කරනු ඇත.

3. එක් පුද්ගලයෙකු විසින් එකම වර්ගයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල වරිපනම් අංක කිහිපයකින් සමන්විත ගොඩනැගිල්ලක් වුව ද එය එකම වරිපනම් අංකයක පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් ලෙස සලකා ව්‍යාපාර බදු හෝ බලපත්‍ර ගාස්තු අය කරනු ඇත. එසේ වුව ද එම ස්ථානයේ වාර්ෂික බලපත්‍ර ගාස්තුව හෝ ව්‍යාපාරික බද්ද උපරිමය රුපියල් 5,000 ට අඩු වන්නේ නම් එවැනි අවස්ථාවක අදාළ සියලුම ගොඩනැගිලිවල වරිපනම් අංකවල වාර්ෂික වටිනාකම ඒකාබද්ධ කර ලැබෙන මුළු තක්සේරු අනුව බලපත්‍ර ගාස්තුව හෝ ව්‍යාපාරික බද්ද තීරණය කරනු ඇත.

4. එක් පුද්ගලයෙකු විසින් වරිපනම් අංක කිහිපයක, විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවක එකී වරිපනම් අංක එකට යාව පිහිටියේ වූව ද තම එක් එක් ව්‍යාපාරය හෝ කර්මාන්තය වෙනුවෙන් වෙන වෙනම බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු අය කරනු ඇත.

5. එක් වරිපනම් අංකයක් යටතේ පුද්ගලයින් කිහිප දෙනෙකු ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම්, ඒ එක් එක් ව්‍යාපාරය සඳහා යොදු ගනු ලබන ස්ථානයේ බිම් ප්‍රමාණය අනුව එකී ගොඩනැගිල්ලේ වාර්ෂික තක්සේරුව කොටස් කර බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු වෙන වෙනම අය කරනු ලැබේ.

රාජාංගනය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

149 වගන්තිය යටතේ වෙළෙඳ බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය ප්‍රකාර ව එකී පනතේ 150 වන වගන්තියේ පළමුවන (1) උපවගන්තිය අනුව පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද 2016.03.30 වැනි දින අංක 1960/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථා අනුව හෝ වෙනත් ආකාරයෙන් බලපත්‍රයක් ලබාගත යුතු පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් පරිශ්‍රයක්, ස්ථානයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් අනුප්‍රමාණයන්ගෙන් යුත් බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂයට වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමට 2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින ප්‍රාදේශීය සභාවේ පැවති පරිපාලන කමිටු රැස්වීමේ දී තීරණ අංක RPS/2023/10/11/118 යටතේ සභා සම්මත වූ බැවින් ඒ බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය අනුව රාජාංගනය ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. එම්. සිසිල් විජේසිංහ වන මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද එකී වෙළෙඳ බලපත්‍ර ගාස්තු 2024 මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එම්. සිසිල් විජේසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 11 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		පරිශ්‍රයට අයකළ යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තුව		
	ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 0 ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 751 0 සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,501 0 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	කොණ්ඩ හා රැවුල කැපීමේ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	සිසිල් බීම, පළතුරු යුෂ අලෙවි සලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	කිරි හෝ මුදවපු කිරි අලෙවි සලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	බැටරි ආරෝපන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	කඩල, වඩේ, බයිට් වර්ග කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	ආපන ශාලාවක්/හෝටලයක්/තේ පැන් සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	පා පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	කාර්යාල ව්‍යාපාරික ස්ථාන පිරිසිදු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	වාහන කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	නවාතැන් පොළ පහසුකම් පවත්වාගෙන යන සහ ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	බාහිර වෛද්‍ය ප්‍රතිකාර/ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර සම්බාහන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	මස් හෝ මාළු විකිණීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		පරිශ්‍රයට අයකළ යුතු වාර්ෂික බදු ගාස්තුව		
	ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 0 ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 751 0 සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,501 0 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
14.	රේඩියෝ/රූපවාහිනී/පරිගණක හා විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	දුරකතන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ජලය පිරිපහදු කර අළෙවි කිරීම	500 0	750 0	1,000 0
18.	වෛද්‍ය පරීක්ෂණාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	භාණ්ඩ ප්‍රවාහනය	500 0	750 0	1,000 0

11-321/1

රාජාංගනය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

152 (1) වගන්තිය යටතේ ව්‍යාපාර බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (1) ප්‍රකාරව රාජාංගනය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ දක්වා ඇති අනුප්‍රමාණයන් නොඉක්මවන්නා වූ අනුප්‍රමාණයන්ට අනුකූලව වෙළෙඳ බලපත්‍රවලට හා කර්මාන්ත බද්දට යටත් නොවන සියලුම වෙළෙඳ ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂික බද්දක් 2024 වර්ෂයට වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට 2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින ප්‍රාදේශීය සභාවේ පැවති පරිපාලන කමිටු රැස්වීමේ දී තීරණ අංක RPS/2023/10/11/118 යටතේ සභා සම්මත වූ බැවින් ඒ බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය අනුව රාජාංගනය ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. එම්. සිසිල් විජේසිංහ වන මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එම්. සිසිල් විජේසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

152 (1) වගන්තිය යටතේ ව්‍යාපාර බදු

මෙම බද්ද ගෙවිය යුතු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම් ලැබීම්වලට අනුකූලව පහත දැක්වෙන ප්‍රමාණයන් නොඉක්මවන පරිදි වේ :

	ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම්	*ගෙවිය යුතු වාර්ෂික බද්ද රු. ශත*
1.	රු. 1.00 සිට රු. 6,000.00 දක්වා	කිසිවක් නැත
2.	රු. 6,001.00 සිට රු. 12,000.00 දක්වා	90 0
3.	රු. 12,001.00 සිට රු. 18,750.00 දක්වා	180 0
4.	රු. 18,751.00 සිට රු. 75,000.00 දක්වා	360 0
5.	රු. 75,001.00 සිට රු. 1,50,000.00 දක්වා	1,200 0
6.	රු. 1,50,001.00 සිට ඉහළට	3,000 0

ව්‍යාපාරයේ ස්වභාවය :

01. සිල්ලර වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
02. තොග වෙළඳ සැලක් පවත්වාගෙන යාම
03. ආයෝජන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
04. ඉංග්‍රීසි හෝ දේශීය බෙහෙත් අලෙවි සැලක් පවත්වාගෙන යාම
05. රක්ෂණ සමාගමක් පවත්වාගෙන යාම
06. බැංකුවක් පවත්වාගෙන යාම
07. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
08. ලිහිසි තෙල් අලෙවි කිරීමේ අලෙවි සැලක් පවත්වාගෙන යාම
09. වෙන්දේසිකරුවන් සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
10. උකස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
11. මෝටර් වාහන හෝ යතුරු පැදි සර්විස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
12. මෝටර් රථ වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
13. පාවිච්චි කරන ලද වාහන මිලට ගෙන නැවත විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
14. මෝටර් වාහන ටින්කර් පේන්ට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
15. මෝටර් රථ වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
16. යතුරු පැදි, ලොරි, ට්‍රැක්ටර් හා වෙනත් වාහන ගෙන්වා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
17. ටයර් සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18. වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම
19. රියදුරු පුහුණු කිරීමේ පාසලක් පවත්වාගෙන යාම
20. පුද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
21. බ්‍රෝකර්වරු වශයෙන් කටයුතු කිරීම
22. කළුගල් පුපුරවා හැරීම
23. ඉදිකිරීම් කර්මාන්තයේ යෙදී සිටින කොන්ත්‍රාත් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
24. සම්ප්‍රේෂණ කුළුණු මගින් දුරකතන සේවා සැපයීම
25. රේඩියෝ, රූපවාහිනී යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර, හා ගෘහ විදුලි උපකරණ හා වෙනත් විදුලි උපකරණ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
26. ශබ්ද විකාශන යන්ත්‍ර, ජෙනරේටර් හා වෙනත් විදුලි උපකරණ හා ආලෝකකරණය සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27. හට්, පුටු, මඟුල් පෝරු, බුෆේ සෙට් සමග උත්සව භාණ්ඩ සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
28. උත්සව සඳහා කේටරින් සර්විස් සැපයීම යෙදී සිටින ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
29. රෙදිපිළි හෝ සාප්පු බඩු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
30. මනිබඩු හා රූපලාවණ්‍යයට අවශ්‍ය ද්‍රව්‍ය සපයන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
31. ගොඩනැගිලි ඉදි කිරීම් ද්‍රව්‍ය, වැලි, ගඩොල්, අලෙවි කිරීමේ ස්ථානයක් (හාඩ්වෙයාර්) පවත්වාගෙන යාම
32. කුෂන් වැඩ පලක් පවත්වාගෙන යාම
33. නවාතැන් පහසුකම් සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
34. ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
35. සම්භාණ්ඩ (පාවහන්), රබර් හෝ ප්ලාස්ටික් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
36. ස්වර්ණාභරණ වෙළඳසලක් පවත්වාගෙන යාම
37. ගෑස් වර්ග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38. විදේශ රැකියා ආයතනයක් පවත්වාගෙන යාම
39. ඇස් කණ්ණාඩි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
40. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
41. විවිධ භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
42. පිත්තල භාණ්ඩ අලෙවිය
43. ඉවුම් පිහුම් උපකරණ හා වලං අලෙවි සලක් පවත්වාගෙන යාම
44. බුලත් පුවක් අලෙවි වෙළෙඳසලක් පවත්වාගෙන යාම
45. මැණික් මිල දී ගැනීම හා අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
46. වැලි සෝදා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
47. නිවාස සැලසුම් සැකසීමේ හා ඇස්තමේන්තු සැකසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
48. වාහන දුම් පරීක්ෂණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
49. දුරකථන කුළුණු ඉදිකිරීම
50. ෆාම් ෂොප් පවත්වාගෙන යාම

51. ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
52. බටහිර හා දේශීය වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
53. භාණ්ඩ කුළියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
54. කොන්ත්‍රාත්කරුවන්
55. ජංගම දුරකථන උපාංග අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
56. සී ඩී හා වීඩියෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
58. මනාලියන් හැඩගැන්වීමේ හා රූපලාවන්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම
59. පිරිපහදු ජලය බෙදාහැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. රට හා මෙරට බීමහලක් පවත්වාගෙන යාම
61. කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
62. කෘමිනාශක, කෘෂි බීජ හා කෘෂි උපකරණ අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
63. ලී වෙළෙඳසලක් පවත්වාගෙන යාම
64. ගෘහ භාණ්ඩ වෙළෙඳසලක් පවත්වාගෙන යාම
65. මුද්‍රණාලයක් හෝ පරිගණක ග්‍රැෆික් ඩිසයින් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
66. පාසල් උපකරණ හා පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
67. ප්ලාස්ටික් නාමපුවරු, බැනර් හා දැන්වීම් පුවරු මුද්‍රණය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
68. ධාන්‍ය වර්ග මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. විසිතුරු මසුන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70. රේස් බුකියක් පවත්වාගෙන යාම
71. ඉවතලන ද්‍රව්‍ය එකතු කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
72. ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
73. විදේශ රැකියා ආයතනයක් පවත්වාගෙන යාම
74. බොරළු කැපීම
75. පොල් එකතු කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
76. තේ කොළ/කුළු බඩු පැකට් කිරීම හා වෙනත් ද්‍රව්‍ය පැකට් කිරීම/රස කැවිලි අලෙවිය
77. ඇලුමිනියම් කම්බි හෝ වීදුරු උපයෝගී කරගෙන සිදු කරනු ලබන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
78. ගල් කැඩීම
79. නිවාස සැලසුම්
80. එළවළු/පළතුරු අලෙවිය

11-321/2

රාජාංගනය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) වගන්තිය යටතේ (කර්මාන්ත) බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) වගන්ති අනුව එකී පනතේ 150 (2) වගන්තියේ පළමුවන උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාර රාජාංගනය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් පරිශ්‍රයක්, ස්ථානයක් සම්බන්ධයෙන් II වැනි තීරුවේ සඳහන් අනුප්‍රමාණයන්ගෙන් යුත් 2024 වර්ෂයට වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමට 2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින ප්‍රාදේශීය සභාවේ පැවති පරිපාලන කමිටු රැස්වීමේ දී තීරණ අංක RPS/2023/10/11/118 යටතේ සභා සම්මත වූ බැවින් ඒ බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය අනුව රාජාංගනය ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. එම්. සිසිල් විජේසිංහ වන මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එම්. සිසිල් විජේසිංහ,
ලේකම් හා බලතල කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		පරිශ්‍රයට අය කළ යුතු වාර්ෂික බදු ගාස්තු		
	ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ඇඟලුම් කම්හලක් පවත්වාගෙන යාම (එක් මැෂින් එකක් සඳහා)	500 0	750 0	1,000 0
02.	ගඩොල්/මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
03.	පහන්තිර නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
04.	හදුන්කුරු සුවඳ ධූපක නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
05.	පපඩම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
06.	බීඩි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
07.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
08.	කොප්පරා නිපදවීම හෝ සකස් කිරීම	500 0	750 0	1,000 0
09.	කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
10.	ඉදල්, කොසු නිපදවීම	500 0	750 0	1,000 0
11.	බිම්මල් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
12.	පැණි හකුරු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
13.	යෝගට්/අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
14.	පැල තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	සෙල්ලම්බඩු/විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
17.	බෑග්/නිමි ඇඳුම් /රූපලාවන්‍ය ද්‍රව්‍ය/බතික් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18.	පොල්ලෙලි ආශ්‍රිත කර්මාන්ත	500 0	750 0	1,000 0
19.	යකඩ කම්හලක් පවත්වාගෙන යාම/ගරාජයක්	500 0	750 0	1,000 0
20.	ගව/ඌරු/එළු/මිරිදිය මසුන්/විසිතුරු මසුන් හෝ වෙනත් සත්ත්ව ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	සහල්/පොල් තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
22.	ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදනය	500 0	750 0	1,000 0
23.	කළුගල් ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
24.	සිමෙන්ති ආශ්‍රිත කර්මාන්ත	500 0	750 0	1,000 0
25.	කෘෂි නිෂ්පාදිතවල අගය වැඩ කිරීම/තවත් නිෂ්පාදනයක අමුද්‍රව්‍යයක් නිපදවීම	500 0	750 0	1,000 0
26.	ලී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	කෘෂි උපකරණ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
30.	වායු සමීකරණ හා ශීතකරණ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
31.	ලියුම් කවර ඇතුලු පැකට් කවර නිෂ්පාදනය	500 0	750 0	1,000 0

රාජාංගනය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

147 (1) යටතේ වෙනත් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය ප්‍රකාරව එකී පනතේ 149 වැනි වගන්තියෙන් හෝ එම විධිවිධාන ප්‍රකාරව පළමුවන උපවගන්තියේ (ආ) ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාරව පහත 2024 වර්ෂයට අදළව ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා වූ වෙනත් ගාස්තු නියම කිරීම 2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින ප්‍රාදේශීය සභාවේ පැවති පරිපාලන කමිටු රැස්වීමේ දී තීරණ අංක RPS/2023/10/11/118 යටතේ සභා සම්මත වූ බැවින් ඒ බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය අනුව රාජාංගනය ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. එම්. සිසිල් විජේසිංහ වන මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එම්. සිසිල් විජේසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2023ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව විස්තරය*	*II වැනි තීරුව ගාස්තුව රු. ශත*
01.	වීථිරේඛා නොපවරා ගැනීම සහතික නිකුත් කිරීම සඳහා පරීක්ෂණ ගාස්තු අය කිරීම	400 0
02.	වීථිරේඛා නොපවරා ගැනීම සහතිකයක් නිකුත් කිරීම සඳහා සහතිකපත් ගාස්තු අය කිරීම (මීට අමතරව රජයේ මුද්දර ගාස්තු අය කරනු ලැබේ)	1,000 0
03.	පිඹුරු පත් අනුමත කිරීමේ ගාස්තු	500 0
04.	පාරිසරික බලපත්‍ර අයදුම්පත් ගාස්තු	250 0
05.	පාරිසරික බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත් ගස්තු	250 0
06.	පාරිසරික ආරක්ෂණ බලපත්‍ර පරීක්ෂා කිරීමේ පෙරසැරි ගාස්තුව :	
	ආයෝජනය	
	රු. 2,50,000.00 හෝ ඊට අඩු	3,000 0
	රු. 2,50,001.00 - රු. 5,00,000.00	3,750 0
	රු. 5,00,001.00 - රු. 10,00,000.00	5,000 0
	රු. 10,00,000.00 වැඩි	10,000 0
07.	පාරිසරික බලපත්‍ර ගාස්තු (1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධානයන්ට යටත් ව) පාරිසරික බලපත්‍ර සහතික පත්‍ර ගාස්තු	4,500 0

- සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ නියුක්ත ව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
- සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින බතික් කර්මාන්ත
- සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින වානිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
- රෙදි වියන යන්ත්‍ර මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එබ්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
- දිනකට ලීටර් 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත

- පොල්තෙල් හෝ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත වානිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
- දිනකට ලීටර් 100කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත
- දිනකට කිලෝග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවයක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්
- මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්
- සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත
- එක් තොගයක් කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවයක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
- සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්ත ව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ හා සැකසුම් කර්මාන්ත
- සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්ත ව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/මුහුවම් කිරීමේ කර්මාන්ත
- සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
- දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත
- ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්
- ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපළවල්"
- ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපළවල්
- වැඩුණු සතුන්ගේ මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපළවල්

  * මිශ්‍ර ගොවිපළවල් සඳහා අනුපාතය = {පක්ෂීන් සංඛ්‍යාව +[50x (ඌරන් සංඛ්‍යාව + ගවයන් සංඛ්‍යාව) + 10 x (එළුවන් සංඛ්‍යාව)]
- ගබඩා ධාරිතාවය ඝන මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
- කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
- යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
- දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
- සේවක සංඛ්‍යාව 5කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්ත ව සිටින ප්ලාස්ටර් ඔෆ් පැරිස් අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා ඕනෑම කර්මාන්තයක්
- බෙලිකටු කැබලි කිරීමේ කර්මාන්ත
- උළු සහ ගඩොල් පෝරණු
- වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිත ව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
- කළුගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
- පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු
- දිනකට ඝන මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවයක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
- දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත
- බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත
- සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා

- පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම් හල්
- විසිරි පින්තාරු කිරීමේ හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ
- වාහන සේවා සිදුනොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත
- ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
- මෘත ශරීර කල්තබා ගැනීමට සකස් කිරීම සහිත මල්ශාලා
- ඉහත කොටස්වලට ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම කර්මාන්තයක්

08	කර්මාන්ත ගිවිසුම් ගාස්තුව	500 0
09	පාපැදි බලපත්‍ර ගාස්තු	10 0
10	වරිපනම් නාමය වෙනස් කිරීමේ ගාස්තුව	500 0
11	දීර්ඝ කාලීන බලපත්‍ර එකඟතා ලිපියක් නිකුත් කිරීම සඳහා	500 0
12	සැලසුම් කාලය දීර්ඝ කිරීමට වසරකට (නේවාසික/ වාණිජ)	100 0
13	ව්‍යාපාර නාම ලියාපදිංචි නිර්දේශ ලිපියකට	300 0
14	ගොඩනැගිලි අයදුම්පත්-නේවාසික/වානිජ	200 0
15	ගොඩනැගිලි සැලසුම අනුමත කිරීම (පළමු ව. අ. 1000 ට රු. 1.00 බැගින් හා වැඩිවන සෑම වර්ග අඩියක් සඳහා රු. 2.00 බැගින්)	
16	අනුබෙදුම් අයදුම්පත්‍රයකට	200 0
17	අනුකූලතා සහතික පෝරමයකට	200 0
18	නාමය වෙනස් කිරීමේ පෝරමයකට	100 0
19	තක්සේරු දැන්වීම් පිටපතක් සඳහා	10 0
20	ප්‍රාදේශීය සභාවට අයත් කඩකාමර පැවරීම සඳහා ගාස්තුව	5,000 0
21	පුස්තකාල සාමාජික ගාස්තුව	100 0
22	සුසාන භූමියක මෘත දේහයක් තැන්පත් කිරීම සඳහා වර්ග අඩියකට	50 0

11-321/4

රාජාංගනය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

134 (3) වගන්තිය යටතේ අක්කර බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තිය ප්‍රකාර රාජාංගනය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටියා වූ ද, ස්ථීර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ ද, එක් එක් ඉඩම් හෙක්ටයාරය මත පහත දක්වා ඇති උපලේඛනය ප්‍රකාර අනුප්‍රමාණ නොඉක්මවන අක්කර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීම, 2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින ප්‍රාදේශීය සභාවේ පැවති පරිපාලන කමිටු රැස්වීමේ දී තීරණ අංක RPS/2023/10/11/118 යටතේ සභා සම්මත වූ බැවින් ඒ බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය අනුව රාජාංගනය ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. එම්. සිසිල් විජේසිංහ වන මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී බද්ද ගෙවීමේ දී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තිය ප්‍රකාරව 2024 ජනවාරි මස 31 වැනි දිනට පෙර එකවර ගෙවන්නේ නම් සියයට දහයක (10%)ක වට්ටමක් ද, පිළිවෙළින් 2023 මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තුවල මුල් මාසය තුළ ගෙවන්නේ නම් සියයට පහක (5%)ක වට්ටමක් ද දෙනු ලැබේ. මෙම අක්කර බද්ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 135 වගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි යම් සීමා කිරීම්

හා නිදහස් කිරීම්වලට යටත් වන අතර, කාර්තුවලට අදාළ අක්කර බද්ද නියමිත කාලය තුළ ගෙවනු නොලබන්නේ නම් සියයට දහයක (10%)ක අමතර අධි ගාස්තුවක් අය කරනු ලැබිය යුතුය.

ඩබ්. එම්. සිසිල් විජේසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

අනු. අංකය	*ඉඩම් ප්‍රමාණය*	*බදු අනුප්‍රමාණය වර්ෂයකට රු. ශත*
01.	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු අවස්ථාවක	50 0
02.	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට හෝ ඊට වැඩිවන අවස්ථාවක වැඩිවන සෑම හෙක්ටයාර් එකක් වෙනුවෙන්	10 0

11-321/5

රාජාංගනය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

150 (1) වගන්තිය යටතේ වාහන හා සතුන් පිළිබඳ බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය ප්‍රකාරව රාජාංගනය ප්‍රාදේශීය සභාව විසින් වාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමටත්, එකී පනතේ 148 (1) වගන්තිය ප්‍රකාරව පහත උපලේඛනයෙහි සඳහන් බදු අනුප්‍රමාණයන් අයකිරීම 2023 ක්වූ ඔක්තෝබර් මස 11 වැනි දින ප්‍රාදේශීය සභාවේ පැවති පරිපාලන කමිටු රැස්වීමේ දී තීරණ අංක RPS/2023/10/11/118 යටතේ සභා සම්මත වූ බැවින් ඒ බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය අනුව රාජාංගනය ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. එම්. සිසිල් විජේසිංහ වන මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 (3) අනුව එකී බදු මුදල් 2024 දෙසැම්බර් මස 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවා අවසන් කළ යුතු වන්නේ ය.

ඩබ්. එම්. සිසිල් විජේසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2023 ක්වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

කාරණය	*බදු මුදල රු. ශත*
1. වාහන නැවතුම්පොළ ගාස්තුව (වසරකට)	5,000 0
2. ත්‍රීවීලර්	250 0
3. වෑන්	3,000 0
4. ටිපර් ලොරි	3,000 0

11-321/6

රාජාංගනය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

147 වගන්තිය යටතේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 (1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර උතුරු මැද පළාතේ ප්‍රාදේශීය සභා ගරු ප්‍රධාන අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද 1960/35 අංක හා 2016.03.30 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කර 2016.11.29 වැනි දින පළාත් සභාවේ අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවට අනුව ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳව අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර රාජාංගනය ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට/ පාරකට/ඇළකට/මුහුදකට හෝ අහසට පෙනෙන පරිදි වර්ග අඩියකට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2024.01.01 වැනි දින සිට අයකිරීම සුදුසු බව ද එම මුදල 2024 මාර්තු මස 31 වැනි දිනට පෙර අයකිරීමට රාජාංගනය ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මම තීරණය කරමි. එසේම උපලේඛනයේ 1 සිට 3 දක්වා වූ දැන්වීමක් දෙපැත්තම ප්‍රදර්ශනය වන්නේ නම් මෙම ගාස්තු දෙගුණ වනු ඇත.

ඩබ්. එම්. සිසිල් විජේසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2023 ක්වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

අනු. අංකය	*විස්තරය*	*එක් වර්ග අඩියකට වන ගාස්තුව මාස 03කට රු. ශත*	*එක් වර්ග අඩියකට වන ගාස්තුව මාස 06කට රු. ශත*	*එක් වර්ග අඩියකට වන ගාස්තුව වසරකට රු. ශත*
01	බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරණය කරන දැන්වීම්	50 0	80 0	100 0
02	රෙදි හෝ ඩිජිටල් බැනර්	50 0	750 0	100 0
03	තහඩු හෝ දැව පුවරුවක ප්‍රදර්ශනය කරන දැන්වීම්	-	-	150 0
04	ඉටි රෙදි හෝ කාඩ්බෝඩ් මගින් සකසා ප්‍රදර්ශනය කරන දැන්වීම්	50 0	-	-
05	ප්ලාස්ටික් හෝ ෆයිබර් මගින් සකසා ප්‍රචාරණය කරන දැන්වීම්	-	-	150 0
06	විදුලිය යොදා හෝ විද්‍යුත් පරිපථ උපයෝගී කරගෙන සිදුකරන ප්‍රචාරක දැන්වීම්	-	-	200 0

11-321/7

රාජාංගනය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

154 (1) වගන්තිය යටතේ ඉඩම් විකිණීම මත බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තිය අනුව නියම කර ඇති පරිදි අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවේ දී ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් රාජාංගනය

ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට, 2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින ප්‍රාදේශීය සභාවේ පැවති පරිපාලන කමිටු රැස්වීමේ දී තීරණ අංක RPS/2023/10/11/118 යටතේ සභා සම්මත වූ බැවින් ඒ බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය අනුව රාජාංගනය ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. එම්. සිසිල් විජේසිංහ වන මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එම්. සිසිල් විජේසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2023ක්වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

11-321/8

රාජාංගනය ප්‍රාදේශීය සභාව

147 වගන්තිය යටතේ විනෝද බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය ප්‍රකාරව විනෝද බදු ආඥාපනතේ II වැනි වගන්තියේ I වැනි උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව රාජාංගනය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා විනෝද බද්ද 2024 වර්ෂයට අදාළව නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව තීරණය කර ඇති බව නිවේදනය කරමි.

රාජාංගනය ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. එම්. සිසිල් විජේසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය ප්‍රකාරව විනෝද බදු ආඥාපනතේ II වන වගන්තියේ I වන උප වගන්තියෙහි ප්‍රකාරව මුදල් උපයන විනෝද කටයුතු වශයෙන් ගැනෙන ආධාර චිත්‍රපට දර්ශනයක්, සර්කස් දර්ශනයක් හා සෑම සංගීත ප්‍රදර්ශනයක්, විනෝද මේලා සැණකෙළියක්, වෙළෙඳ ප්‍රදර්ශනයක් සඳහාම නිකුත් කරනු ලබන ප්‍රවේශපත්‍ර සඳහා පහත උපලේඛනයේ සඳහන් විනෝද බද්දක් අයකිරීමට 2023ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින ප්‍රාදේශීය සභාවේ පැවති පරිපාලන කමිටු රැස්වීමේ දී තීරණ අංක RPS/2023/10/11/118 යටතේ 2024 වසරට පනවා අය කිරීමට තීරණය කරමි.

	කාණ්ඩය	*විනෝද කටයුත්තේ ස්වභාවය*	*අය කිරීමට යෝජිත ප්‍රතිශතය*
01	A	* සිනමා ශාලා	10%
02	B	* විදේශීය කලාකරුවන්ගේ සියලු ප්‍රසංග සඳහා Carnival සැණකෙළි	10%
03	C	* වාණිජ පරමාර්ථයෙන් පවත්වනු ලබන දේශීය ශිල්පීන් සහභාගි වන සියලු ප්‍රසංග සඳහා	10%
04	D	* දේශීය ශිල්පීන් සහභාගි වන ආහාරපාන රහිතව මිල වන ඩීජේ ප්‍රසංග, නැටුම් සංදර්ශන, Sing Alone සහ වෙනත් නැටුම් වැයුම් සහිත ප්‍රසංග * අන්තර් ජාතික ක්‍රීඩා තරග * සුබසාධක සංගම්, ආදී ශිෂ්‍ය සංගම් සහ එවැනි සමිති සංවිධාන විසින් පවත්වනු ලබන ප්‍රසංග	10%
05	E	* ක්‍රියාත්මක මට්ටමේ පවතින කලාකරුවන්ගේ සංගමයක් මූලිකව පවත්වනු ලබන ප්‍රසංග (වර්ෂයකට උපරිම ප්‍රසංග තුනකි) * දේශීය ක්‍රීඩා තරග * දේශීය චේදිකා නාට්‍ය ගීත සහිත ප්‍රසංග	8%

	කාණ්ඩය	*විනෝද කටයුත්තේ ස්වභාවය*	*අය කිරීමට යෝජිත ප්‍රතිශතය*
06	F	* දැනට ප්‍රසිද්ධ කලාකරුවෙකු විසින් තම ජීවිතයේ විශේෂ අවස්ථාවක් ලෙස පවත්වනු ලබන ප්‍රසංගයක් සඳහා (ජීවිත කාලය තුළ එක්වරක් සඳහා පමණක්) * පාසලක් විසින් පාසලේ සුබසාධනය සඳහා පවත්වනු ලබන අයදුම්කරු විදුහල්පති වන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිත ප්‍රසංග * පාසලක් හෝ ආදි ශිෂ්‍ය සංගමයක් හෝ විද්‍යාලයීය සංගමයක්, පාසලක් වෙනුවෙන් පවත්වන ක්‍රීඩා තරග හා පාසල් ක්‍රීඩා සංගම් විසින් පවත්වන තරගාවලි * උසස් අධ්‍යාපන ආයතනයක ශිෂ්‍ය සංගමයක් විසින් ශිෂ්‍ය සුබසාධනය සඳහා පවත්වන ප්‍රසංග	7%
07	G	* Dinner Dance/Sing Alone (ආහාරපාන සමග මිල වන රු. 3,000 ට වැඩි ප්‍රවේශයක්)	7%
08	H	* දැනට ජීවත්ව සිටින අවු. 75 ඉක්ම වූ දැඩිව රෝගාතුරව සිටින ප්‍රවීණ කලාකරුවෙකු සඳහා වෛද්‍යාධාර පිණිස හෝ ප්‍රවීණ කලාකරුවෙකුගේ අවසාන ප්‍රසංගය සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් විනෝද බදු නිදහස් කළ ප්‍රසංගයක් (ජීවිත කාලය තුළ එක් වරක්)	0%

ඩබ්. එම්. සිසිල් විජේසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 11 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

11-321/9

රාජාංගනය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය යටතේ

සේවා සඳහා ගාස්තු අය කිරීම

රාජාංගනය ප්‍රාදේශීය සභාව විසින් සේවා සැපයීම සඳහා ගාස්තු පනවා අයකිරීම පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අනුප්‍රමාණයෙන් 2024.01.01 වැනි දින සිට අය කිරීමට 2023ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින ප්‍රාදේශීය සභාවේ පැවති පරිපාලන කමිටු රැස්වීමේ දී තීරණ අංක RPS/2023/10/11/118 යටතේ සභා සම්මත වූ බැවින් ඒ බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය අනුව රාජාංගනය ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. එම්. සිසිල් විජේසිංහ වන මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එම්. සිසිල් විජේසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභාව,

උපලේඛනය

	කාරණය	*ගාස්තුව රු. ශත*	
ප්‍රසිද්ධ ස්ථාන හෝ පොදු ක්‍රීඩාංගන වෙන් කිරීම			
01	වාණිජ කටයුතු සඳහා	දිනකට අවමය රුපියල් 10,000.00	
02	පොදු කටයුතු සඳහා	දිනකට රුපියල් 1,000.00-3,000 දක්වා	
සතිපොළ ගොඩනැගිලි කුළියට ලබාදීම		විදුලිය සහිතව	විදුලිය රහිතව
01	5 කණුව සතිපොළ	7,500 0	5,000 0
02	යාය 08 සතිපොළ	-	2,500 0
03	පුත්තලම් හන්දිය සතිපොළ	7,500 0	5,000 0
ට්‍රැක්ටර් ජල බවුසරය ඉන්ධන සහිතව			
01	දිනකට සේවය යෙදවීමට	9,000 0	උපරිමය මීටර් පැය 05
02	ජල බවුසර් 01	3,000 0	මීටර් පැය 01ක් ඇතුළත වන අතර වැඩිවන සෑම මීටර් පැය 01ක් සඳහා රු. 1,500.00 ගෙවිය යුතුය
ට්‍රැක්ටරය සහ ට්‍රේලරය ඉන්ධන සහිතව			
01	ට්‍රැක්ටරය සහ ට්ලරය දිනකට	10,000 0	උපරිමය මීටර් පැය 05
02	ට්‍රැක්ටරය සහ ට්ලරය එක්වරක් සේවයට යෙදවීම	2,000 0	මීටර් පැය 01ක් ඇතුළත වන අතර වැඩිවන සෑම මීටර් පැය 01ක් සඳහා රු. 1,500.00 ගෙවිය යුතුය
තණකොළ කපන යන්ත්‍රය ඉන්ධන සහිතව			
01	පැය 01ක් සේවයට	6,000 0	ප්‍රවාහනයට පැය 01ක් සඳහා රු. 1,500.00 ගෙවිය යුතුය
ලොරි ජල බවුසරය LL3241			
01	දිනකට සේවයට	20,000 0	උපරිමය 120km
02	එක් ජල බවුසරයක්	8,500 0	උපරිමය 50km හා වැඩිවන සෑම 1km කටම රු. 150.00
ලොරි ජල බවුසරය LL7326 ඉන්ධන සහිතව			
01	දිනකට සේවයට	23,000 0	උපරිමය 150km
02	එක් ජල බවුසරයක්	10,000 0	උපරිමය 50km හා වැඩිවන සෑම 1km කටම රු. 150.00

	කාරණය	*ගාස්තුව රු. ශත*	

ටිපර් රථය LL7045 ඉන්ධන සහිතව

01	දිනකට සේවයේ යෙදවීමට	25,000 0	උපරිමය 150km
02	එක් වරක් ප්‍රවාහනයට	10,000 0	උපරිමය 50km හා වැඩිවන සෑම 1km කටම රු. 150.00

බැකෝ ලෝඩරය ZA5208

01	මීටර් පැය 01ක් සඳහා	6,500 0	ප්‍රවාහන ගාස්තු ඇතුළත්ව
02	සුභ සාධක කටයුතු සඳහා පළමු මීටර් පැය 03 රු. 3,500.00 බැගින් හා වැඩිවන මීටර් පැය සඳහා රු. 6,500.00 බැගින් අය කරයි.		ප්‍රවාහන ගාස්තු ඇතුළත්ව

මෝටර් ග්‍රේඩරය ZA5292

	මීටර් පැය 01ක් සඳහා	7500 0	ප්‍රවාහන ගාස්තු ඇතුළත්ව
	සුභ සාධක කටයුතු සඳහා පළමු මීටර් පැය 03 රු. 3,500.00 බැගින් හා වැඩිවන මීටර් පැය සඳහා රු. 7,500.00 බැගින් අය කරයි.		ප්‍රවාහන ගාස්තු ඇතුලත්ව

ගාබේජ් කම්පැක්ටරය LM 5619

	මාසයකට	1,50,00 0	ඉන්ධන රහිතව හා කොන්දේසි සහිතව

කොම්පෝස්ට් කැබලි කිරීම යන්ත්‍රය

01	දිනකට	5,000 0	ට්‍රැක්ටරය රහිතව
02	දිනකට	15,000 0	ට්‍රැක්ටරය සහිතව

පුස්තකාල සේවා

01	පුස්තකාල අයදුම්පත්‍ර	20 0	
02	පුස්තකාල ආරක්ෂණ ඇප මුදල්	200 0	
03	පුස්තකාල පොත් ප්‍රමාද ලැබීම්	5 0	දිනකට එක් පොතක් සඳහා
04	සාමාජිකත්වය අලුත් කිරීම	100 0	

සුසාන භූමි

01	මෘත දේහ භූදාන කිරීම නිදහස්		
02	මෘත දේහ තැන්පත් කිරීම	1,050 0	
03	ස්මාරක ඉදිකිරීම	5,000 0	

	කාරණය	*ගාස්තුව රු. ශත*	
අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්			
01	අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්	පැය 12	4,000 0
02	අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්	පැය 06	2,000 0
03	කුඩ ආවරණ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්	පැය 12	500 0
වෙනත් ගාස්තු			
01	තාවකාලික වෙළඳ කුටි	1,000 0	වාර්ෂිකව
02	සංචාරක වෙළඳ වාහන	1,000 0	වාර්ෂිකව

11-321/10

රාජාංගනය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

ජල ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය ප්‍රකාරව එකී පනතේ 126 (xiii) වන වගන්තියෙන් හෝ එම විධිවිධාන ප්‍රකාරව පළමුවන උපවගන්තියේ (ආ) ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂයට ජල ගාස්තු අය කිරීම 2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින පැවති ප්‍රාදේශීය සභාවේ පැවති පරිපාලන කමිටු රැස්වීමේ දී තීරණ අංක RPS/2023/10/11/118 යටතේ සභා සම්මත වූ බැවින් ඒ බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය අනුව රාජාංගනය ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. එම්. සිසිල් විජේසිංහ වන මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද එකී මාසික ජල ගාස්තු ඊළඟ මස 15 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එම්. සිසිල් විජේසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

අනු. අංකය	*ඒකක ප්‍රමාණය*	*ඒකකයට අයකළ යුතු මුදල රු. ශත*
01	1-10	20 0
02	11-20	25 0
03	21-30	35 0
04	31-40	50 0
05	41-50	80 0
06	51-60	85 0
07	61-70	150 0
08	71 සිට ඉහළට	200 0

* ඒකක 1 සිට ඒකක 30 දක්වා සෑම බිල්පතක් සඳහා ම රු. 150.00 ක ස්ථාවර ගාස්තුවක් අය කරයි.
* ඒකක 31 සිට ඉදිරියට වැඩිවන සෑම බිල්පතක් සඳහා ම රු. 250.00 ක ස්ථාවර ගාස්තුවක් අය කරයි.
* නව ජල සම්බන්ධතා ගාස්තුව රු. 40,000.00
* විසන්ධිකර නැවත ලබාදීමේදී හිඟ මුදල් ගෙවා නැවත සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා ගාස්තු රු. 5,000.00 ක් අය කරයි.
* පිරිපහදුකර ඇති ජලය 1Lක් රු. 2.00.

11-321/11

රාජාංගනය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තිය යටතේ

වාහන නතර කිරීම/වාහන හැසිරවීම සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.03.30 වැනි දින අංක 1960/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උතුරු මැද පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 07 වැනි කොටසේ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර, රාජාංගනය ප්‍රාදේශීය සභා සීමාවේ පොදු රථ ගාල් තුළ රථවාහන ගාල් කිරීම, නවතා තැබීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් අය කිරීමට 2023 ඔක්තෝබර් මස 11 වැනි දින ප්‍රාදේශීය සභාවේ පැවති පරිපාලන කමිටු රැස්වීමේ දී තීරණ අංක RPS/2023/10/11/118 යටතේ සභා සම්මත වූ බැවින් ඒ බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය අනුව රාජාංගනය ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. එම්. සිසිල් විජේසිංහ වන මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එම්. සිසිල් විජේසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

පොදු රථවාහන ගාල් තුළ නවතා තැබීම/ගාල් කිරීම	ගාස්තුව පැයක් සඳහා රු. ශත	ගාස්තුව වැඩිවන සෑම පැයකටම රු. ශත
1. බස් රථයක් සඳහා	100 0	30 0
2. වෑන් රථ හා කාර් රථ සඳහා	50 0	20 0
3. ත්‍රීරෝද රථ හා බයික් සඳහා	30 0	10 0
4. ඩීමෝ බට්ටා රථ සඳහා	30 0	10 0
5. වෙනත් ඕනෑම රථ වාහනයක් සඳහා	20 0	10 0
7. ත්‍රී රෝද රථ සංගමයකට නම් ලියාපදිංචිය (වසරකට)	250 0	

11-321/12

රාජාංගනය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය යටතේ ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය ප්‍රකාරව එකී පනතේ 52 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂයට ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ ගාස්තු අය කිරීමට නියම කිරීම 2023 ඔක්තෝබර් මස 11 වැනි දින ප්‍රාදේශීය සභාවේ පැවති පරිපාලන කමිටු රැස්වීමේ දී තීරණ අංක RPS/2023/10/11/118 යටතේ සභා සම්මත වූ බැවින් ඒ බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය අනුව රාජාංගනය ප්‍රාදේශීය සභාවේ සභාපති ඩබ්. එම්. සිසිල් විජේසිංහ වන මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද පහත සඳහන් එකී ගාස්තු ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එම්. සිසිල් විජේසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2023 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

අනු. අංකය	විස්තරය	ගාස්තුව රු. ශත
01.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු පළමු වර්ග අඩි 1,000 දක්වා	එක් වර්ග අඩියකට 1 00 බැගින්
02.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු පළමු වර්ග අඩි 1000 ට වඩා වැඩිවන සෑම වර්ග අඩියක් සඳහාම	2 00 බැගින්
03.	ගොඩනැගිලි අයදුම්පත් එකක් නේවාසික/වාණිජ	200 00

11-321/13

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මා විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වැනි දින තීරණ අංක 390 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වයි. පී. මහේන්ද්‍ර ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව හා
මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකරව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මිල්ලනිය ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පිහිටියා වූ ද ස්ථිර හෝ නීතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර් එකක් මත 2024 වර්ෂය සඳහා රු. 10.00 ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළ යුතු බවටත් මම තීරණය කරමි.

තවද, ඉහත කී පනතේ 134 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හෙක්ටයාර් එක හෝ එකට වැඩි සෑම ඉඩමක් වෙනුවෙන් එක් එක් ඉඩම් හෙක්ටයාරය මත 2024 වර්ෂය සඳහා රු. 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට මම තීරණය කරමි.

තවද, 2024 වර්ෂයේ පහත උපලේඛනයේ සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත අවසාන දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද මිල්ලනිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2024 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උප ලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදළ අක්කර බදු මුදල රු. 10.0 ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට මුදලින් 5% ක වට්ටමක් ද, මිල්ලනිය ප්‍රාදේශීය සභාව ලබාදිය යුතු බව ද මම තීරණය කර සිටිමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම් සඳහා හිමිකම්*
පළමුවන කාර්තුව	2024 මාර්තු 31 දින පෙර	ජනවාරි 31
දෙවන කාර්තුව	2024 ජූනි 30 දින පෙර	අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2024 සැප්තැම්බර් 30 දින පෙර	ජූලි 31
හතරවන කාර්තුව	2024 දෙසැම්බර් 31 දින පෙර	ඔක්තෝබර් 31

11-358/2

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු ගාස්තු පැනවීම

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මා විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වන දින තීරණ අංක 391 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වයි. පී. මහේන්ද්‍ර ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව හා
මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකරව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මිල්ලනිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2251 හා 2021.10.22 දිනැති ගැසට් පත්‍රය යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2024 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යාක්ෂණ වර්ෂය

සඳහා තක්සේරුව/සත්‍යාක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 134(1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවත්,

තවද, 2024 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද මිල්ලනිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2024 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල මිල්ලනිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද මිල්ලනිය ප්‍රාදේශීය සභාව විසින් ලබාදිය යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම් සඳහා නිමිකම් ලබන දිනය*
පළමු කාර්තුව	2024 මාර්තු 31 දිනට පෙර	2024 ජනවාරි 31
දෙවන කාර්තුව	2024 ජුනි 30 දිනට පෙර	2024 අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2024 සැප්තැම්බර් 30 දිනට පෙර	2024 ජූලි 31
හතරවන කාර්තුව	2024 දෙසැම්බර් 31 දිනට පෙර	2024 ඔක්තෝබර් 31

11-358/3

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මා විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වන දින තීරණ අංක 392 යටතේ පහත දක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වයි. පී. මහේන්ද්‍ර ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව හා
මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවට අනුව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා මිල්ලනිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2024 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවෙන් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විටදී ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2023 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

2024 වර්ෂය සඳහා පනවන ලද වෙළෙඳ බලපත්‍ර ගාස්තු 2024 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරමි.

I වැනි තීරුව *බලපත්‍රයේ ස්වභාවය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
බලය දෙනු ලබන කාර්යය	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 751.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,501.00 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
01. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
02. සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
03. සම් විකිණීම	500 0	750 0	1,000 0
04. සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
05. ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
06. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
07. විකිණීම සඳහා නරක්වනසුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
08. කරවල, ලුණු, මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
09. පොල් කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම හෝ ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
10. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11. සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාඩවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12. පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13. සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
14. සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
15. අලුත් හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
16. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
18. වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
බලපත්‍රයේ ස්වභාවය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
බලය දෙනු ලබන කාර්යය	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501.00 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
19. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20. සිරප් හෝ පලතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
21. රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
22. පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
23. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
24. දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
25. රා එකතු කිරීම	500 0	750 0	1,000 0
26. විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
27. යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දෑව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
28. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
29. සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
30. සම්භාණ්ඩ නිපදවීම			
31. පලතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
32. මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශ භෝග, කුළු බඩු හෝ කිරිපිටි ඇඹරීම හා ඇඹරුම් හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
33. ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
34. කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
35. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
36. රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
37. ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
38. සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39. පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
40. ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
41. ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
42. ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
43. සිමෙන්ති කිලෝග්‍රෑම් 1,000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
44. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
45. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
46. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
47. පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
48. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
49. ධාන්‍ය හෝ මාංශ බෝග කිලෝග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
50. සැරසිලි කිරීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව *බලපත්‍රයේ ස්වභාවය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
බලය දෙනු ලබන කාර්යය	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501.00 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
අන්තරාදයක :			
51. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු, සීනි කිලෝග්‍රෑම් 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
52. මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
53. මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
54. කුකුළන් 100 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු ගාලක් හෝ කුකුළු කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55. එළුවන්, ඌරන් 10 ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56. ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
57. දැව ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
58. කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
59. සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
60. අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
61. පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම	500 0	750 0	1,000 0
62. ගිනි පෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම	500 0	750 0	1,000 0
63. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
64. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
65. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
66. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
67. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
68. හිස්ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
69. පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වා ගැනීම	500 0	750 0	1,000 0
70. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
71. විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වා ගැනීම	500 0	750 0	1,000 0
72. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤ ගබඩා කිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0
73. පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
74. ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
75. දැව ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
ජීඩාකාරී හා අන්තරාදයක :			
76. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් පැකට් කිරීම	500 0	750 0	1,000 0
77. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
78. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
79. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
බලපත්‍රයේ ස්වභාවය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
බලය දෙනු ලබන කාර්යය	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501.00 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
80. හුණු ගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අළු හුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
81. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82. මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
83. මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
84. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
86. ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
87. ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
88. වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
89. ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
90. කිලෝග්‍රෑම් 150 ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
91. වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
92. ලියවන පට්ටලයක් භාවිත කරමින් වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
93. පෙට්‍රල්, ඩීසල්, තෙල් හෝ වෙනත් ඛණිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
94. කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
95. වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
96. විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
සාමාන්‍ය :			
97. බේකරියක් පවත්වාගෙන යාම			
98. හෝටලයක් හා ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99. භෝජන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
100. මාළු විකිණීම	500 0	750 0	1,000 0
101. කිරි ශීතකිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
102. මස් විකිණීම	500 0	750 0	1,000 0
103. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
104. තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
105. ශීතකරණ ලද ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
106. බාබර් සැප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මා විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වන දින තීරණ අංක 393 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වයි. පී. මහේන්ද්‍ර ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව හා
මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මිල්ලනිය ප්‍රාදේශය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව *කර්මාන්තය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	*රු. 751.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1501.00 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
1. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2. මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
3. මෙට්ට නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
4. බීඩි හෝ සුරුට්ටු එතීම	500 0	750 0	1,000 0
5. පින්තූර රාමු කිරීම	500 0	750 0	1,000 0
6. ගමන් මලු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
7. කලාත්මක භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
8. ඔරලෝසු අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
9. ගුවන් විදුලි, රූපවාහිනී අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මා විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වැනි දින තීරණ අංක 394 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වයි. පී. මහේන්ද්‍ර ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව හා
මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 152 වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මිල්ලනිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් මිල්ලනිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත 2024 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම මෙහි පහත උපල්ඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව *2023 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *රු. ශත*
රු. 6,000.00 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු.6,001.00 ඉක්මවන එහෙත් රු.12,000 0 නොඉක්මවන අවස්ථාවක	90 0
රු.12,001.00 ඉක්මවන නමුත් රු.18,750 0 නොඉක්මවන විට	180 0
රු.18,751.00 ඉක්මවන නමුත් රු.75,000 0 නොඉක්මවන විට	360 0
රු.75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 0 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,001.00 ඉක්මවන විට	3,000 0

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මා විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වැනි දින තීරණ අංක 395 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වයි. පී. මහේන්ද්‍ර ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව හා
මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව වාහන හා සතුන් පිළිබඳ බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධි විධානවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම සතෙකු මතම එහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බව මම තීරණය කරමි.

2024 වර්ෂය සඳහා පනවන ලද වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම 2024 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව නිවේදනය කරමි.

උපලේඛනය

	I වැනි තීරුව *වාහනය හෝ සත්ත්ව වර්ගය*	*II වැනි තීරුව* *රු. ශත*
(I)	මෝටර් රථයක් , මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් සයිකලයක්, කරත්තයක් , ජීන් රික්ෂෝවක් , බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
(II)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
	(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
(III)	සෑම කරත්තයක් සඳහා	20 0
(IV)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
(V)	සෑම රික්ෂෝවක් සඳහා	7.00
(VI)	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
(VII)	සෑම ඇතෙකු සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත හා වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්කරුවන් සම්බන්ධව ගාස්තු අය කිරීම

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මා විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වැනි දින තීරණ අංක 396 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වයි. පී. මහේන්ද්‍ර ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව හා
මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු 1989 අංක 15 දරන වෙන්දේසිකරුවන්, බ්‍රෝකර්කරුවන් පිළිබඳ ආඥාපනතේ විධිවිධානවලට අනුව වෙන්දේසිකරුවෙකු, බ්‍රෝකර්කරවකු හෝ වෙන්දේසිකරුවෙකු හා බ්‍රෝකරුකරුවෙකු වශයෙන් කටයුතු කරයි නම් මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අනුකූලව බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු 1989 අංක 15 දරන වෙන්දේසිකරුවන්, බ්‍රෝකර්කරුවන් පිළිබඳ ආඥාපනතේ විධිවිධානවලට අනුව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙන්දේසිකරුවෙකු, බ්‍රෝකර්කරවෙකු හෝ වෙන්දේසිකරුවෙකු හා බ්‍රෝකර්කරුවෙකු වශයෙන් කටයුතු කරයි නම් 2024 වර්ෂය සඳහා පහත දක්වා ඇති පරිදි ගාස්තුවක් පනවා අය කිරීමට මම තීරණය කරමි.

		රු. ශත
1.	වෙන්දේසිකරුවෙකු හා බ්‍රෝකර්වරයෙකු	60 0
2.	වෙන්දේසිකරුවෙකු	50 0
3.	බ්‍රෝකර්වරයෙකු	50 0

11-358/8

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඛනිජ තෙල් ආඥාපනත යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මා විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වැනි දින තීරණ අංක 397 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වයි. පී. මහේන්ද්‍ර ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව හා
මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු 1937 ඛනිජ තෙල් (භූමිතෙල්, පෙට්‍රල් හා ඩීසල්) බඩා කිරීමේ බලපත්‍ර ගාස්තුවක් වශයෙන් අමාත්‍යවරයා විසින් සාදා ඇති 1937 ඛනිජ තෙල් සේවා ස්ථාන රීති මාලාවේ 9 වැනි රීති ප්‍රකාරව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ඛනිජ තෙල් බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

මිල්ලනිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක එක් අවස්ථාවකදී ළඟ තබා ගනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත ඛනිජ තෙල් (භූමිතෙල් පෙට්ට්‍රල් හා ඩීසල්) ගැලුම් ප්‍රමාණයන් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක ඛනිජ තෙල් (භූමිතෙල්, පෙට්ට්‍රල් හා ඩීසල්) ගබඩා කිරීමේ බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

2024 වර්ෂය සඳහා පනවන ලද ඛනිජ තෙල් ආඥා පනත යටතේ බලපත්‍ර ගාස්තු 2024 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරමි.

උපලේඛනය

	I වැනි තීරුව *එක් අවස්ථාවක දී ළඟ තබා ගනු ලබන ප්‍රමාණය*	*II වැනි තීරුව* *ගාස්තුව* *රු. ශත*
(*අ*)	ගැලුම් 160 නොඉක්මවන විට	5 0
(*ආ*)	ගැලුම් 161 ඉක්මවන එහෙත් 500 නොඉක්මවන විට	10 0
(*ඇ*)	ගැලුම් 501 ඉක්මවන එහෙත් ගැලුම් 2,000 නොඉක්මවන විට	30 0
(*ඈ*)	ගැලුම් 2,000 ඉක්මවන විට	
	1. ප්‍රථම ගැලුම් 2000 සඳහා	30 0
	2. එක් එක් අතිරේක ගැලුම් 2000 ක ප්‍රමාණයක් සඳහා හෝ එහි කොටසකට	30 0

11-358/9

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මා විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වැනි දින තීරණ අංක 398 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වයි. පී. මහේන්ද්‍ර ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව හා
මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව මිල්ලනිය ප්‍රාදේශීය සභා සීමා තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 1%ක් වන බද්දක් නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මිල්ලනිය ප්‍රාදේශීය සභා සීමා තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 1% ක් වන බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත් එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) (ආ) ඡේදය යටතේ වන ''සමානුපාතය'' වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 2/4ක් විය යුතු බවටත් මම තීරණය කරමි.

11-358/10

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මා විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වැනි දින තීරණ අංක 399 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වයි. පී. මහේන්ද්‍ර ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව හා
මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු විනෝද බදු ආඥා පනතේ 2 වැනි වගන්ති ප්‍රකාරව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අනුකූලව විනෝද බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට සිදුවිය යුතු බව මම තීරණය කරමි.

එනම්, 1984 අංක 27 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥු පනතේ ප්‍රකාශිත සියලු විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 10% ක විනෝද බද්දක් 1946 අංක 12 දරන විනෝද බදු ආඥුපනතේ 2 (1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදළව විනෝද බදු නියම විය යුතු බවට මම තීරණය කරමි.

11-358/11

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මා විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වැනි දින තීරණ අංක 400 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වයි. පී. මහේන්ද්‍ර ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව හා
මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වයි. පී. මහේන්ද්‍ර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්ති විධිවිධාන ප්‍රකාරව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව සම්මත අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් සාදන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1888/47 හා 2014.11.14 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා. 1989 අංක 12 දරන පළාත් සභා අනුශාංගික විධිවිධාන පනතේ 2 වන වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලදුව ඒ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 හා 2015.12.28 දිනැති *ගැසට් පත්‍රය* යටතේ නිවේදනය කර ඇත.

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) යතේ 3 වන වගන්තිය යටතේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව එකී සම්මත අතුරු ව්‍යවස්ථා මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024.01.01 දින සිට අදාල විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව යෝජනා කර සිටිමි.

තවද, මෙම යෝජනාව සම්මත කර ගනු ලබන මෙදින වන විට මිල්ලනිය ප්‍රදේශීය සභා බල ප්‍රදේශය සඳහා 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුර ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ අදාල කරගනිමින් බලාත්මක කිරීම සඳහා පහත උපලේඛන ගත නාමයන් යටතේ විස්තර කරන සම්මත අතුරු ව්‍යවස්ථා එම සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ එතෙක් ගනු ලබන ක්‍රියාමාර්ග වලට අගතියක් නොවන පරිදි 2024.01.01 වැනි දිනයෙන් පසුවට මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා අදාළ විය යුතු බවට ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කර සිටිමි.

උපලේඛනය

01. ත්‍රී රෝද රථ නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාව
02. සැරසිලි විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව
03. බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
04. පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
05. හෝටල් හා ලැගුම් හල් පිළිබඳ වන අතුරු ව්‍යවස්ථාව
06. ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
07. භෝජන ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
08. මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
09. සභා බල ප්‍රදේශයන් හි මාර්ගවල වාහන පාලනය කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව
10. සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව
11. සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
12. ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
13. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
14. අවමංගල සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
15. පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
16. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාර ව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව අක්කර බදු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/541 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූද ස්ථීර හෝ නීතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2024 වර්ෂය සඳහා රුපියල් දහයක් (10/- ක්) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ 2024 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට තීරණය කරමි.

2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2024 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බද්දෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවන බවට තීරණය කරමි.

11-371/1

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාර ව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/542 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

ඉහත කී තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (අ) හා 122-126 වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ IV (ඇ) ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්, දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.05.17 වැනි දින අංක 1811 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 වැනි දින අංක 1878 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවල i-xxx (iv හැර) දක්වා වූ කාණ්ඩවල ඇතුළත් xxviii වන ප්‍රචාරක දැන්වීම්, පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් යක්කලමුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, ගඟකට, මුහුදකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ I වැනි තීරුවේ විස්තර පරිදි II වැනි තීරුවේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට අය කළ යුතු බවට තීරණය කරමි.

උපලේඛනය 01

	I වැනි තීරුව *විස්තරය*	*II වැනි තීරුව* *බලපත්‍ර ගාස්තුව මසක් හෝ ඉන් කොටසක් සඳහා* *රු. ශත*
I.	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන, ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග මීටරයකට ම	150 0
II.	ලෑල්ලක් හෝ ආධාරකයක් හෝ බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන, ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග මීටරයකට ම	150 0
III.	චිත්‍රපට දර්ශන ප්‍රචාරය සඳහා ප්‍රදර්ශනය කරන දැන්වීමක් සඳහා සෑම වර්ග මීටරයකට ම	120 0
IV.	බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රතිදීප්ත දැන්වීමක් සඳහා සෑම වර්ග මීටරයකට ම	150 0
V.	තාවකාලික ප්‍රදර්ශන පුවරු (කටවුට්) සඳහා සෑම වර්ග මීටරයකට ම	150 0

තව ද, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් ලිත් වර්ෂයකට වර්ග මීටරයකට රු. 400 0 ක මුදලක් අය කරනු ලැබේ.

11-371/2

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව කර්මාන්ත බදු සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/543 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

ඉහත කී තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2024.03.31 වැනි දිනට පෙර යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තීරණය කරමි."

උපලේඛනය

අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
			වාර්ෂික වටිනාකම රුපියල්	
		වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට	*වාර්ෂික වටිනාකම රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	ඇලුමිනියම්, නිකල් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
03.	තේ කුඩු, කුළු බඩු පැකට් කර විකිණීම	500 0	750 0	1,000 0
04.	පා පැදි, යතුරු පැදි, ත්‍රීවීල් හා මෝටර් රථ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
05.	වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	පාවහන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
07.	සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
08.	ටයර් හා ටියුබ් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
09.	විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ඩිජිටල් තාක්ෂණයෙන් මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	බීරළු ලී කැටයම් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	වායු සමීකරණ, ශීතකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ඉදල්, පාපිසි, කොහු ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
20.	රන් රිදී ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	මැණික් කැපීමේ හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ශීත කළ මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	හුණු පිළිස්සීම, විකිණීම හා ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	කොප්පරා නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	පොල්තෙල් සෑදීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තයේ ස්වභාවය	*I වැනි තීරුව* වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට	*II වැනි තීරුව* වාර්ෂික වටිනාකම රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
26.	ගල් වලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	ගල් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	වෙල්ඩින් වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
29.	යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ලී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	කුළුබඩු ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	බිම්මල් නිපදවීම	500 0	750 0	1,000 0
33.	වානේ වැහිපීළි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

11-371/3

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/544 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

ඉහත කී තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2024.03.31 වැනි දිනට පෙර යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තීරණය කරමි.

උපලේඛන අංක - 01

I වැනි තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
(i) රු. 1 සිට රු. 6,000 දක්වා	-
(ii) රු. 6,001 සිට රු. 12,000 දක්වා	90 0
(iii) රු. 12,001 සිට රු. 18,750 0 දක්වා	180 0
(iv) රු. 18,751 සිට රු. 75,000 දක්වා	360 0
(v) රු. 75,001 සිට රු. 1,50,000 දක්වා	1,200 0
(vi) රු. 1,50,001 ට වැඩි	3,000 0

11-371/4

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව වෙළෙඳ බලපත්‍ර සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/545 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග තිබිය යුතු 149 වැනි වගන්තිය යටතේ යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ ඇති පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති පරිදි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලපත්‍ර දෙමින් 2024 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා, 2024 වර්ෂය සඳහා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර අතරින් ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපනශාලාවක් හෝ නවාතැන්පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම් වලින් සියයට එකකට (1%) සමාන මුදල් ප්‍රමාණයක් හෝ උපලේඛනයේ II නිරූපිත ප්‍රමාණය යන මුදල් ප්‍රමාණය යන මුදල් ප්‍රමාණ දෙකෙන් වැඩි මුදලට සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් නියම කර අය කිරීමටත් තීරණය කරමි.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	වෙළෙඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 ඉක්ම නොයන විට රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 751 - රු.1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත*
01.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	බත් කඩය, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
04.	ලැගුම් හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
05.	කොණ්ඩා සැකසීමේ සැලුන් හා බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	අයිස් කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
07.	මස් වෙළෙඳසල්	500 0	750 0	1,000 0
08.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
09.	සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
10.	සිසිල් බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
11.	කිරි පට්ටි හා කිරි වෙළෙඳාම	500 0	750 0	1,000 0
12.	ඝාතක මඩු	500 0	750 0	1,000 0
13.	හෝටල්	500 0	750 0	1,000 0

11-371/5

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර නම් කිරීම හා ඒ සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව අන්තරායදායක හා අප්‍රසනන ව්‍යාපාර සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/546 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

1952 අංක 6 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 21 වන අතුරු ව්‍යවස්ථාවේ (1) වන උප වගන්තියෙන් පළාත් පාලන ආයතනවලට පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාර අන්තරායදායක ව්‍යාපාර, අප්‍රසන්න

ව්‍යාපාර සහ අන්තරාදායක සහ අප්‍රසන්න ව්‍යාපාර ලෙසට නම් කිරීමට සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනත් 147 වැනි වගන්තියේ (1) උප වගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, මෙහි පහත උපලේඛනයේ I වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2024 වර්ෂයේ දී පවත්වාගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II වැනි තීරයේ නිරූපිත යම් සීමාවක් ඇතුළත වන අවස්ථාවක ඊට අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු බවත්, එකී බලපත්‍ර ගාස්තුව 2024.03.31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවා බලපත්‍රය ලබාගත යුතු බවත් තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
	වෙළෙඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 ඉක්ම නොයන විට රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 751 - රු.1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත*
අන්තරායදායක ව්‍යාපාර :				
01.	පොහොර වර්ග, කොම්පෝස්ට් පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම, සත්ත්ව ආහාර වර්ග නිපදවීම, ගබඩා කර තැබීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	සත්ත්ව ආහාර වර්ග ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	ත්‍රීරෝද රථ, මෝටර් සයිකල් සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	වාහන, යතුරු පැදි හා ත්‍රීරෝද රථ පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	දන්ත චිකිත්සාගාරයක්, දත් බඳින ස්ථානයක්, එක්ස් රේ යන්ත්‍රයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	පශු වෛද්‍ය ගිලන්හලක් හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	ඇසිඩ් වර්ග නිෂ්පාදනය හා වෙළඳාම	500 0	750 0	1,000 0
08.	ෆයිබර් ග්ලාස් නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ගිනිකෙළි භාණ්ඩ, රතිඤ්ඤා නිපදවීම, විකිණීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අප්‍රසන්න ව්‍යාපාර :				
01.	කුල්ස්පොට් එකක් හෝ කිරිහලක් හෝ ස්නැක් බාර් එකක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	රස කැවිලි, කේක් වර්ග නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
03.	ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	අවමංගල සේවා සපයන ස්ථානයක් (මල් ශාලාවක්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	පොහොර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වාහන හා සතුන් සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/547 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධාන'' වලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, රුපියල් 20.00ක සේවා ගාස්තුවක් අය කළ යුතු බව තීරණය කරමි.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන ඕනෑම වාහනයක් සඳහා	25 0
(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
	(අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළඳ කාර්යය නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
(iv)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi)	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
(vii)	සෑම ඇතෙකු හෝ අලියෙකු සඳහා	50 0

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා විනෝද බදු හා සංදර්ශන බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව විනෝද බදු හා සංදර්ශන බලපත් සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/548 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය ප්‍රකාර යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත චිත්‍රපට දර්ශනයක්, මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක් සහ සෑම සංගීත සංදර්ශනයක් සඳහා මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍ර වටිනාකමින් 10% ක විනෝද බද්දක් අය කිරීමට තීරණය කරමි."

11-371/8

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා බිම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව බිම් බදු සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/549 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට අයත් යක්කලමුල්ල වෙළෙඳ සංකීර්ණය හා බස් නැවතුම්පොළ අවට භූමිය තාවකාලික වෙළෙඳ කුටි, ප්‍රචාරක වැඩ සටහන් සඳහා කුළියට දීම වෙනුවෙන් සෑම වර්ග අඩියකටම, පහත උපලේඛනයේ සඳහන් පරිදි 2024.01.01 වැනි දින සිට බිම් බදු අයකිරීමට තීරණය කරමි.

උපලේඛනය

තාවකාලික වෙළෙඳ කුටි සඳහා :

- බදු දීම දිනක් වන විට රු. 20 0 ක්ද;
- බදු දීම දින දෙකක් වන විට රු. 18 0 ක් ද;
- බදු දීම දින තුනක් වන විට රු. 17 0 ක්ද;
- බදු දීම දින හතරක් හෝ ඊට වඩා වැඩිවන විට රු. 15 0 ක්ද.

ප්‍රචාරණ වැඩසටහන් සඳහා :

- බදු දීම දිනක් වන විට රු. 50 0 ක්ද;
- බදු දීම දින දෙකක් වන විට රු. 45 0 ක්ද;
- බදු දීම දින තුනක් වන විට රු. 40 0 ක්ද;
- බදු දීම දින හතරක් හෝ ඊට වඩා වැඩිවන විට රු. 35 0 ක්ද.

මීට අමතරව ක්‍රීඩාපිටි බදු දීමේ දී,

නැවත නිදහස් කරන ඇප තැන්පත් :

සාමාන්‍ය කටයුත්තක දී :

- යක්කලමුල්ල ක්‍රීඩාංගනය රු. 15,000 0
- නාකියාදෙනිය ක්‍රීඩාංගනය රු. 10,000 0
- වාඩියවත්ත ක්‍රීඩාංගනය රු. 5,000 0

විනෝද කටයුත්තක දී : (සංදර්ශන, සැණකෙළි, නොමිලේ පෙන්වන සංගීත ප්‍රසංග)

- යක්කලමුල්ල ක්‍රීඩාංගනය රු. 20,000 0
- නාකියාදෙනිය ක්‍රීඩාංගනය රු. 15,000 0
- වාඩියවත්ත ක්‍රීඩාංගනය රු. 5,000 0

විනෝද කටයුත්තක දී : (ප්‍රවේශ පත්‍ර අයකර පෙන්වන සංගීත ප්‍රසංග)

- යක්කලමුල්ල ක්‍රීඩාංගනය රු. 20,000 0
- නාකියාදෙනිය ක්‍රීඩාංගනය රු. 15,000 0
- වාඩියවත්ත ක්‍රීඩාංගනය රු. 10,000 0

ක්‍රීඩාපිටි සඳහා බිම් බදු :

සාමාන්‍ය කටයුත්තක දී, [අවුරුදු උත්සව, ක්‍රීඩා තරග (පාසල් හැර) හා රැස්වීම් (සියලුම සැණකෙළි හා සංගීත ප්‍රසංග හැර)].

- යක්කලමුල්ල ක්‍රීඩාංගනය රු. 5,000 0
- නාකියාදෙනිය ක්‍රීඩාංගනය රු. 3,500 0
- වාඩියවත්ත ක්‍රීඩාංගනය රු. 1,000 0

විනෝද කටයුත්තක දී :

- නොමිලයේ පෙන්වන සංගීත ප්‍රසංග සඳහා රු. 12,500 0 බිම් බද්දක් ද, වෙළඳ ප්‍රචාරණ කටයුතු සඳහා රු. 12,500 0 බිම් බද්දක් ද, ප්‍රවේශ පත්‍ර අයකර පෙන්වන සංගීත ප්‍රසංග සඳහා රු. 12,500 0 ක බිම් බදු මුදලක්ද 2024.01.01 දින සිට අය කරනු ලැබේ.

රැස්වීම් ශාලාව වෙන් කිරීමේ දී :

- රැස්වීම් ශාලාව වෙන් කිරීම සඳහා රු. 8,000 0 ක ඇප තැන්පතු මුදලක් හා දිනකට රු. 12,000 0 ක මුදලක් ද, අය කරනු ලැබේ. (ජලය හා විදුලිය පුටු හා ශාලා පහසුකම් පමණක් අදාළ වේ.)

- රැස්වීම් සහ සම්මන්ත්‍රණ ආදිය සඳහා රැස්වීම් ශාලාව වෙන් කිරීමේ දී :

  පාසලකට හෝ ආගමික කටයුත්තකට දිනකට රු. 4,000 0 ද වෙනත් ඕනෑම රාජ්‍ය ආයතනයකට දිනකට රු. 5,500 0 ක මුදලක් ද අයකරනු ලැබේ. (මෙම ගාස්තුව සඳහා ජලය හා විදුලිය, පුටු හා ශාලා පහසුකම් සඳහා පමණක් අදාළ වේ.)

- ශබ්ද පරිපාලන පද්ධතිය ලබා ගැනීම සඳහා දිනකට රු. 2,000 0 ක මුදලක් ද, ප්‍රොජෙක්ටර් යන්ත්‍රය සඳහා පැය 01 කට රු. 1,000 0 ක මුදලක් අය කරනු ලැබේ.

කොට්ටව නාන තටාකය සඳහා ගාස්තු පහත පරිදි අය කරනු ලැබේ :

	රු. ශත
• එක් අයෙකුට පැය 01 ක් සඳහා,	
දේශීය පුද්ගලයෙකුට :	
* වැඩිහිටි (වයස අවුරුදු 12ට වැඩි)	100 0
* ළමා	50 0
විදේශීය පුද්ගලයෙකුට :	300 0
• තටාකය වෙන් කිරීම සඳහා එක් දිනකට	30,000 0
• තටාකය සහ අවට පරිසරය තුළ මංගල ඡායාරූප ගැනීම සඳහා	500 0
• සිංහල අලුත් අවුරුදු කාලය හා නත්තල් කාලය සඳහා තටාකය වෙන් කිරීමට :	
අප්‍රේල් 12 දින සිට සතියක කාලයක් තුළ දිනකට	40,000 0
දෙසැම්බර් 24 දින සිට සතියක කාලයක් තුළ දිනකට	40,000 0

බදු කුලී -

සභාව සතු වත්කම් සභාව විසින් තීරණය කරනු ලබන අවම ලංසුව අනුව ටෙන්ඩර් කර කුලියට දීමට කටයුතු කරනු ඇත.

- ටෙන්ඩර් අයදුම්පත්‍ර ගාස්තුව රු. 1,250 0

11-371/9

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර වෙනුවෙන් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/550 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1533/16 දරන වර්ෂ 2008 ක්වූ ජනවාරි මස 25 දිනැති *ගැසට් පත්‍රයේ* (ඇ) උපලේඛනයෙන් හා 2008 ක්වූ පෙබරවාරි මස 01 දිනැති අංක 1534/18 දරන *ගැසට් පත්‍රයේ* සඳහන් පරිදි පැවරී ඇති බලය අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරා දී ඇති බලතල ප්‍රකාරව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර හා කර්මාන්ත සඳහා එකවර වසර තුනක කාල පරිච්ඡේදයක් සඳහා රු. 4,000 0 ක් වූ පරිසර බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට තීරණය කරමි."

එසේම පරිසර බලපත්‍ර සඳහා වන පරීක්ෂණ ගාස්තු නව කර්මාන්ත සඳහා හා නැවත බලපත්‍ර අලුත් කිරීමේදී පහත පරිදි ගෙවිය යුතු ය :-

මූලික ආයෝජනය	*පරීක්ෂණ ගාස්තුව* *රු. ශත*
රු. 2,50,000 දක්වා	3,000 0
රු. 2,50,001 - රු. 5,00,000 දක්වා	3,750 0
රු. 5,00,001 - රු. 10,00,000 දක්වා	5,000 0
රු. 10,00,000 ට ඉහළ	10,000 0

11-371/10

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/551 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සිදු කරන අතර, එක් සැපයුම්කරුවෙකුගෙන් පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් සැපයුම්කරුවන්ගෙන් II වැනි තීරුවේ සඳහන් පරිදි ලියාපදිංචි ගාස්තුවක් අයකිරීමට තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
• ලිපිද්‍රව්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• විදුලි උපකරණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
• වාහන අලුත්වැඩියාවට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• වාහන සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• සියලුම වර්ගයේ හාඩ්වෙයාර් බඩු සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• පරිගණක හා උපාංග සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• කාර්යාලීය උපකරණ (රෝනියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ගණක යන්ත්‍ර ආදිය සැපයීම) සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• වාහන අමතර කොටස්, ටයර් හා ටියුබ් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• කොන්ක්‍රීට් භාණ්ඩ හා හියුම් පයිප්ප සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• සනීපාරක්ෂක උපකරණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• පරිගනක අලුත්වැඩියාව හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• කාර්යාලීය ලී බඩු හා වානේ කබඩ් ඇතුළු අනෙකුත් උපකරණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• මුද්‍රණ සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• පුස්තකාල පොත් හා ප්‍රකාශන සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• රබර් මුද්‍රා හා දින මුද්‍රා, නාම පුවරු, දැන්වීම් පුවරු සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• සමරු තිළිණ හා පදක්කම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• පළිබෝධනාශක හා වල්නාශක සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• සත්ත්ව ආහාර සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• ආදාහනාගාර අලුත්වැඩියා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• සිල්ලර භාණ්ඩ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• කොන්ත්‍රාත්කරුවන් සැපයුම්කරුවන් ලියාපදිංචි කරීම	1,000 0
• බේකරි නිෂ්පාදන (උත්සව අවස්ථා සඳහා) සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• ගොඩනැගිලි ද්‍රව්‍ය බදු පදනමින් ලබා ගැනීමේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• අපහරණය කරන පුවත්පත් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• අමු තේ දළු ලබාගන්නා ආයතන සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
• සතුන් මිලදී ගන්නා පුද්ගලයින් හා ආයතන සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0

11-371/11

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සහතිකපත් සහ වෙනත් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව සහතික පත් සහ වෙනත් ගාස්තු සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/552 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට අයත් නිශ්චල සහ චංචල දේපළ දෛනික කුළී පදනම මත වෙනත් ආදායම් සඳහා 2024 වර්ෂය සඳහා පහත උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් අයිතමය සඳහා II වැනි තීරයේ සඳහන් ගාස්තුවක් පනවා අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

	I වැනි තීරුව	*II වැනි තීරුව*
		රු. ශ
•	අනතුරුදායක ගස් සඳහා වන අයදුම්පත්‍ර ගාස්තු	1,750 0
•	නඩුවක් පවතින විට අනතුරුදායක ගස් සඳහා වන අයදුම්පත්‍ර ගාස්තු	2,000 0
•	**අනතුරුදායක ගස් සඳහා වන පරීක්ෂණ ගාස්තු :**	
	* කොස්, දෙල්, නැදුන්, තෙක්ක, බුරුත, මහෝගනී ගසක් සඳහා	2,000 0
	* වෙනත් ගස් සඳහා	1,500 0
	* පඳුරු සහිත ගස් (උණ, බට පඳුරු ආදිය)	
	01-05ත් අතර	500 0
	06-10ත් අතර	900 0
	11-20ත් අතර	2,000 0
	21-40ත් අතර	2,500 0
	40ට වැඩි	3,000 0
•	පෙර පාසල් අයදුම්පත් ගාස්තු	100 0
•	පෙර පාසල් සඳහා ඇතුළත් වීමේ ගාස්තු	200 0
•	වීථිරේඛා සහ නොපවරා ගැනීමේ සහතික ලබා ගැනීම සඳහා :	
	* අයදුම්පත් ගාස්තු	500 0
	* පරීක්ෂණ ගාස්තු	1,000 0
	1998 ට පෙර නිවාස සැලසුම් අනුමත කරවා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තු	3,000 0
	* පරීක්ෂා කර සහතික නිකුත් කිරීමේ ගාස්තුව	1,000 0
•	අනුකූලතා සහතික නිකුත් කිරීම	2,000 0
	කාලය දීර්ඝ කිරීමේ ගාස්තු :	
	* වසරකට	1,500 0
	* අයදුම්පත්‍ර ගාස්තු	500 0
•	වෙනත් සහතික නිකුත් කිරීම	500 0
	නාකියාදෙණිය සුසාන භූමිය සඳහා :	
•	ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය සඳහා වන,	
	*අයදුම්පත් ගාස්තු	250 0
	*ආදාහනය කිරීමේ ගාස්තු,	
	බල ප්‍රදේශය තුළ	10,000 0
	බල ප්‍රදේශයෙන් පිටත	13,000 0
•	නාකියාදෙණිය ග්‍රාමසේවා වසම තුළ පදිංචි අයට පමණක් මෘත ශරීරයක්	
	* තැන්පත් කිරීම සඳහා මුදල	50,000 0
	* අයදුම්පත් ගාස්තු	2,000 0

- නාකියාදෙණිය ග්‍රාමසේවා වසම තුළ පදිංචි අයට පමණක් මෘත ශරීරයක්

		රු. ශත
*	මිහිදන් කිරීම සඳහා	5,000 0
*	අයදුම්පත්‍ර ගාස්තුව	250 0

- නාකියාදෙණිය ග්‍රාම නිලධාරී වසමෙන් පිටත ඉඩම් නොමැති අයගෙන් ලැබෙන ඉල්ලීම් පදනම් කරගෙන මිහිදන් කිරීම 10,000 0

- පරිසර බලපත්‍ර අයදුම්පත්‍රය හා අලුත්වැඩියා කිරීමේ අයදුම්පත්‍රය 250 0

- උත්සව කාලයේ දී යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ශබ්ද විකාශන යන්ත්‍රය භාවිතය සඳහා දිනකට, 1,500 0

- කොම්පෝස්ට් පොහොර :

5 Kg පැකට් 1 ක් සඳහා	150 0
10 Kg පැකට් 1 ක් සඳහා	300 0
25 Kg පැකට් 1 ක් සඳහා	750 0
50 Kg පැකට් 1 ක් සඳහා	1,500 0

11-371/12

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා යක්කලමුල්ල ප්‍රාදේශීය සභා පුස්තකාලය සඳහා අයකරනු ලබන ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව යක්කලමුල්ල ප්‍රාදේශීයසභා පුස්තකාලය සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/553 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

කාරණය

"1988.08.23 වැනි දින අංක 520/7 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 36 කොටසේ සඳහන් පරිදි පහත සඳහන් පුස්තකාල ගාස්තු අය කළයුතු බවට තීරණය කරමි.

ළමා	-	රු. 50 0
වැඩිහිටි	-	රු. 75 0

(i) පොත් ආපසු භාර දිය යුතු දිනය ඉක්මවා යන එක් එක් දවස වෙනුවෙන් පහත පරිදි දඩ මුදල් ගෙවිය යුතු ය :

ළමා	-	රු. 1 0
වැඩිහිටි	-	රු. 2 0

මීට අමතරව –

(i) සෑම වසරක් තුළ දී ම පුස්තකාල සාමාජිකත්වය අලුත් කළ යුතු අතර අලුත් කිරීමේ ගාස්තුව ලෙස රු. 100 0 ක මුදලක් 2024.01.01 වැනි දින සිට ගෙවිය යුතු ය.

(ii) සාමාජික ඉල්ලුම්පත් ගාස්තු ලෙස 2024.01.01 වැනි දින සිට රු. 100 0 ක මුදලක් අය කරනු ඇත.

(iii) අලාභ හානිය සඳහා :

(අ) පොත්වල කුරුටු ගෑම හා ලිවීම රු. 30 0

(ආ) පොත් ඉරීම හා පිටු කැඩීම රු. 150 0

(ඇ) පාවිච්චියට ගත නොහැකි පරිදි අලාභ හානි කිරීමක දී එම පොත නැවත සපයා ගැනීමට යන වියදම ගෙවිය යුතු ය.

(ඈ) පොත් අස්ථානගත කිරීමක දී එම පොත නැවත සපයා ගැනීමට යන වියදම ගෙවිය යුතු ය.

11-371/13

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් මත ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/554 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

කාරණය

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 31 හා 78 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර 2024.01.01 වැනි දින සිට යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම් හා අනවසර ඉදිකිරීම් සඳහා පහත පරිදි ගාස්තු අය කළ යුතු බවට තීරණය කරමි.

(i) අයදුම්පත් ගාස්තුව රු. 750 0

(ii) *පෙරසැරි ගාස්තුව :*

		නේවාසික *රු. ශත*	*ව්‍යාපාරික* *රු. ශත*
(අ)	වර්ග අඩි 1 - 750	750 0	2,000 0
(ආ)	වර්ග අඩි 751 - 1500	2,000 0	3,500 0
(ඇ)	වර්ග අඩි 1501 - 2500	5,000 0	8,500 0
(ඈ)	වර්ග අඩි 2501 - 3500	5,500 0	10,000 0
(ඉ)	වර්ග අඩි 3501 - 5000	7,500 0	20,000 0
(ඊ)	වර්ග අඩි 5001 - 10000	9,500 0	30,000 0
(උ)	වර්ග අඩි 10001 - 15000	11,500 0	40,000 0
(ඌ)	වර්ග අඩි 15001 - 20000	13,500 0	50,000 0
(එ)	වර්ග අඩි 20001 සිට ඉහළට	15,500 0	75,000 0

තව ද, ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමට පෙර ඉදිකිරීම් ආරම්භ කර ඇත්නම් පහත සඳහන් පරිදි ගාස්තුවක් අය කරනු ලැබේ :-

	ඉදිකිරීමේ අදියර	*බිම් මහල (වර්ග මීටර් 01ක් හෝ කොටසක් සඳහා)*		*එක් එක් උඩුමහලට (වර්ග මීටර් 01ක් හෝ කොටසක් සඳහා)*	
		නේවාසික රු. ශත	*ව්‍යාපාරික රු. ශත*	*නේවාසික රු. ශත*	*ව්‍යාපාරික රු. ශත*
(i)	අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කොට ඇති විට (කයිරු මට්ටම)	50 0	350 0	50 0	350 0
(ii)	වහල මට්ටම දක්වා ඉදිකොට ඇති විට (වහලය රහිතව)	150 0	400 0	150 0	400 0
(iii)	වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	200 0	475 0	200 0	475 0
(iv)	සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	300 0	600 0	300 0	600 0

11-371/14

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කැබලි සැලසුම් අනුමත කිරීම හා ඉඩම් විකිණීම මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව කැබලි සැලසුම් අනුමත කිරීම හා ඉඩම් විකිණීම සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/555 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ඉඩම් කැබලි අනුමත කිරීමේ දී හා ඉඩම් කැබලිකර විකිණීමේ දී ඊට අදාළව පහත සඳහන් පරිදි ගාස්තු 2024 ජනවාරි මස 01 වැනි දින සිට පනවා අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

(i) කැබලි සැලැසුම් අනුමත කිරීම :

- අයදුම්පත් ගාස්තුව රු. 750 0
- ඉඩම් කැබලි අනුමත කිරීමේ දී පහත පරීක්ෂණ ගාස්තුව සමඟ රු. 1,500 0 ක ස්ථාවර ගාස්තුවක් ගෙවිය යුතුය.
- ප්‍රසිද්ධ වෙන්දේසියේ ඉඩම් විකිණීමක් නොවන අවස්ථාවක, නමුත් ඉඩම් අනුබෙදුමක් සිදුවන අවස්ථාවක පහත පරීක්ෂණ ගාස්තු සමග රු. 2,500 0 ක ස්ථාවර ගාස්තුවක් ගෙවිය යුතුය.

- සම්පූර්ණ ඉඩම හෝ අනුබෙදුම් අනුමත කරවා ගැනීමේ දී අය කරනු ලබන පරීක්ෂණ ගාස්තු පහත දැක්වේ:

(i) පර්චස් 20 හෝ 20ට අඩු ඉඩම් සඳහා ස්ථාවර ගාස්තුව පමණක් වේ.

(ii) පර්චස් 20 ට වැඩි රූඩ් 2ක් හෝ රූඩ් 2කට අඩු ඉඩමක් සඳහා ස්ථාවර ගාස්තුව සමඟ රු. 2,500 0 ක ගාස්තුවක් ගෙවිය යුතුය.

(iii) රූඩ් 2ට වැඩි අක්කරයක් හෝ අක්කරයකට අඩු ඉඩමක් සඳහා ස්ථාවර ගාස්තුව සමඟ රු. 3,500 0 ක ගාස්තුවක් ගෙවිය යුතුය.

(iv) අක්කරයකට වැඩි අක්කර 2ක් හෝ අක්කර 2කට අඩු ඉඩමක් සඳහා ස්ථාවර ගාස්තුව සමඟ රු. 4,000 0 ක ගාස්තුවක් ගෙවිය යුතුය.

(v) අක්කර 2කට වැඩි අක්කර 5ක් හෝ අක්කර 5ට අඩු ඉඩමක් සඳහා අක්කරයකට හෝ කොටසකට ස්ථාවර ගාස්තුව සමඟ රු. 3,000 0 බැගින් ගාස්තුවක් ගෙවිය යුතුය.

(vi) අක්කර 5 කට වැඩි අක්කර 10 ක් හෝ අක්කර 10 කට අඩු ඉඩමක් සඳහා අක්කරයකට හෝ කොටසකට ස්ථාවර ගාස්තුව සමඟ රු. 4,000 0 බැගින් ගාස්තුවක් ගෙවිය යුතුය.

(vii) අක්කර 10 කට වැඩි සෑම අක්කරයක් හෝ කොටසක් සඳහා ම අක්කරයකට හෝ කොටසකට ස්ථාවර ගාස්තුව සමඟ රු. 5,000 0 බැගින් ගෙවිය යුතුය.

ප්‍රසිද්ධියේ ඉඩම් කැබලිකර විකිණීමේ දී, සැලසුම තනි කැබැල්ලකට වඩා වැඩි වන අවස්ථාවේ දී එක් කැබැල්ලකට රු. 1,000 0 ක් සමඟ රු. 10,000 0ක ස්ථාවර ගාස්තුවක් ගෙවිය යුතු ය.

11-371/15

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ජල ටැංකිය ලබා දීමේ ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාලව ජල ටැංකිය සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/556 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු ලීටර් 2000 ක ජල පරිමාවක් ඇති ජල ටැංකිය සඳහා 2024 ජනවාරි මස 01 වැනි දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට ගරු සභාවට තීරණය කරමි :

1. ලීටර් 2000 ක ජල ටැංකිය, ට්‍රැක්ටරය සමග :
ජල ටැංකිය ලබාදීමේ දී නැවත නිදහස් කරනු ලබන ඇප තැන්පතුව සඳහා රු. 500.00ක මුදලක් ගෙවිය යුතුය.

	දිනකට	*රු. ශත*
1.	ජලය නොමැතිව ටැංකිය පමණක්	750 0
2.	අමතරව තබා ගන්නා එක් දිනකට	50 0
3.	දිනකට ජලය සමග ටැංකියක්	2,000 0
4.	අමතරව තබා ගන්නා එක් දිනකට	250 0

11-371/16

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කුළියට දීම සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කුලියට දීම සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/557 යටතේ පහත සඳහන් තීරණය ලබාගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය 2024 ජනවාරි මස 01 වැනි දින සිට කුළියට දීම සඳහා පහත සඳහන් පරිදි ගාස්තු අය කළ යුතු බවට තීරණය කරමි :

01. කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය එක් දිනක් සඳහා රු. 4,700 0

02. කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කුළියට දීමේ දී රු. 3,000ක නැවත නිදහස් කරනු ලබන තැන්පතු මුදලක් තැබිය යුතු ය.

ප්‍රවාහන ගාස්තුව :	*රු. ශත*
1. කි.මී. 00 සිට 05 ඇතුළත ප්‍රවාහනය සඳහා	1,750 0
2. කි.මී. 06 සිට 10 ඇතුළත ප්‍රවාහනය සඳහා	2,250 0
3. කි.මී. 11 සිට 20 ඇතුළත ප්‍රවාහනය සඳහා	2,750 0

4. කි.මී. 20ට වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහා ම රු. 80ක ගාස්තුවක් අයකරනු ලැබේ.

11-371/17

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණ අච්චු කුළියට දීම සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණ අච්චු කුලියට දීම සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/558 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණ අච්චු කුළියට දීම සඳහා 2024 ජනවාරි මස 01 වැනි දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අය කළයුතු බවට තීරණය කරමි."

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණ අච්චු 14ක් කුළියට දීම සඳහා පහත පරිදි ගාස්තු අය කරනු ලැබේ:-

- දිනකට කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණ අච්චු 01 ක් සඳහා රු. 500.00 ක මුදලක් අය කරනු ලැබේ.
- ඊට අමතරව කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණ අච්චු සඳහා පහත පරිදි නැවත නිදහස් කරනු ලබන තැන්පතු මුදලක් තැබිය යුතුය.

කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණ අච්චු 01 -05 දක්වා තැන්පතු මුදල	රු. 2,000 0
කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණ අච්චු 05 ට වඩා වැඩි වන විට තැන්පතු මුදල	රු. 4,000 0

- අමතරව තබා ගන්නා එක් දිනක් වෙනුවෙන් කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණ අච්චු 01 ක් සඳහා රු. 500 ක මුදලක් අය කරනු ලැබේ.

11-371/18

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කොඩි කණු කුළියට ලබාදීම සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව කොඩි කණු කුලියට දීම සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/559 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු කොඩි කණු කුළියට දීම 2024 ජනවාරි මස 01 වැනි දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අය කළයුතු බවට තීරණය කරමි."

1. සභාව සතු කොඩි කණු කුළියට දීමේ දී දිනකට කොඩි කණුවක් සඳහා රු. 20 0ක ගාස්තුවක් අයකරනු ලැබේ.
ඊට අමතරව කොඩි කණු සඳහා පහත පරිදි නැවත නිදහස් කරනු ලබන තැන්පතු මුදලක් තැබිය යුතු ය.

	රු. ශත
* කණු 01 සිට 05 දක්වා තැන්පතු මුදල	1,000 0
* කණු 06 සිට 10 දක්වා තැන්පතු මුදල	2,500 0
* කණු ගණන 10 ට වඩා වැඩි වන විට තැන්පතු මුදල	5,000 0

ප්‍රවාහන ගාස්තුව :

	රු. ශත
01. කි.මී. 00 සිට 05 ඇතුළත ප්‍රවාහනය සඳහා	1,750 0
02. කි.මී. 06 සිට 10 ඇතුළත ප්‍රවාහනය සඳහා	2,250 0
03. කි.මී. 11 සිට 20 ඇතුළත ප්‍රවාහනය සඳහා	2,750 0

04. කි.මී. 20 ට වැඩි වන සෑම කිලෝමීටරයක් සඳහාම රු. 80.00ක ගාස්තුවක් අයකරනු ලැබේ.

11-371/19

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා හෙලිකොප්ටර් යානා ගොඩ බැස්සවීමේ ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව හෙලිකොප්ටර් යානා ගොඩබැස්සවීම සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/560 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩාංගන සඳහා 2024 ජනවාරි මස 01 වැනි දින සිට පෞද්ගලික සමාගමක් යටතේ ඇති හෙලිකොප්ටරයක් ගොඩ බැස්සවීමේ දී පහත පරිදි ගාස්තු අයකළ යුතු වට තීරණය කරමි :

පෞද්ගලික සමාගමක් යටතේ ඇති හෙලිකොප්ටරයක් එක් වරකට ගොඩ බැස්සවීමේ ගාස්තුව රු. 5,000 0

11-371/20

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා මායිම් තාප්ප හා ආරක්ෂක බැමි ඉදිකිරීම සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව මායිම් තාප්ප හා ආරක්ෂක බැමි ඉදිකිරීම සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/561 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

ඉහත කී තීරණය

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව 2024 ජනවාරි මස 01 වැනි දින සිට මායිම් තාප්ප හා ආරක්ෂක බැමි ඉදිකිරීම සඳහා ගාස්තු අයකළ යුතු බවට තීරණය කරමි."

2024.01.01 දින සිට යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මායිම් තාප්ප හා ආරක්ෂක බැමි ඉදි කිරීම අනුමත කිරීම සඳහා පහත සඳහන් ගාස්තු අයකරනු ලැබේ :

මායිම් තාප්ප/ආරක්ෂක බැමි	*ගොඩනැගිලි සීමාවෙන් පිටත* *රු. ශත*	*ගොඩනැගිලි සීමාව තුළ* *රු. ශත*
නේවාසික දික් මීටර් 01ක්	300 0	500 0
වාණිජ හෝ වෙනත් දික් මීටර් 01ක්	400 0	600 0

11-371/21

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ජල බවුසරය කුළියට ලබා දීමේ ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ජල බවුසරය කුලියට දීම සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/562 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු ලීටර් 4000ක ජල පරිමාවක් ඇති ජල බවුසරය 2024 ජනවාරි මස 01 වැනි දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අය කළ යුතු බවට තීරණය කරමි :

ජලය සමග බවුසරය ලබා දීමේ දී එක් දිනකට,

* ජලය සහිතව රු. 3,000 0 ක් ද,
* ජලය රහිතව රු. 2,000 0 ක් ද අය කරනු ලැබේ.

සභා බල ප්‍රදේශය තුළ ප්‍රවාහනය කිරීම සඳහා රු. 1,000 0ක් ද බල ප්‍රදේශයෙන් පිට ප්‍රවාහනය සඳහා රු. 3,000 0 ක මුදලක් ද අය කරනු ලැබේ.

11-371/22

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ටොන් 08ක ගල් රෝල කුළියට ලබාදීම සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ටොන් 08 ක ගල් රෝල කුලියට ලබා දීම සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/563 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි :

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

ඉහත කී තීරණය

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු ටොන් 08 ක ගල් රෝල කුළියට ලබා දීම සඳහා 2024 ජනවාරි මස 01 වැනි දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අය කළයුතු බවට තීරණය කරමි :

* එක් දිනයක් සඳහා රු. 10,000 0 ක මුදලක් ද, සහ ඉන් අනතුරුව වැඩිවන සෑම පැය එකකටම රු. 1000 0 ක ගාස්තුවක් අය කරනු ලැබේ. (එක් දිනක් සඳහා පැය 08ක් අදාළ වේ.)

* ඒ සඳහා නැවත නිදහස් කරනු ලබන ඇප තැන්පත් මුදලක් ලෙස බල ප්‍රදේශය තුළ රු. 10,000 0 ක මුදලක් ද කිලෝමීටර් 10 කට වැඩි දුරක් ඇති වැඩ බිමක් සඳහා රැගෙන යාමේ දී රු. 15,000 0 ක ඇප තැන්පතු මුදලක් ද අය කරනු ලැබේ.

* ගල් රෝල කාර්මික දෝෂයක් හෝ රියදුරුවරයෙකු නොමැති අවස්ථාවක හැර මුදල් ගෙවා ලබා ගන්නා දින ගණනට අමතරව වැඩ බිමෙහි රඳවා ගන්නා එක් දිනක් සඳහා රු. 2000 0ක මුදලක් අය කරනු ලැබේ.

ගල් රෝල ප්‍රවාහනය සඳහා පහත පරිදි ප්‍රවාහන ගාස්තු අය කරනු ලැබේ.

ප්‍රවාහන ගාස්තුව :

1. කි.මී. 00 සිට 05 ඇතුළත ප්‍රවාහනය සඳහා රු. 3,500 0

2. කි.මී. 05 ඇතුළත පමණක් ඉහත ගාස්තු යටතේ ප්‍රවාහනය සභාව විසින් සිදු කරනු ලබන අතර ඊට වැඩි වන අවස්ථාවලදී ප්‍රවාහන පහසුකම් තමා විසින් සපයා ගත යුතුය.

11-371/23

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතය සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතය සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2023.10.13 දිනැති තීරණ අංක 2023/10/13/564 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

තීරණය

* රුපියල් මිලියන 10ක් හෝ ඊට වැඩි ව්‍යාපෘති සඳහා සභාව සතු මාර්ග භාවිතයට ගනු ලබන්නේනම්, එම ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුගත මුදලින් 1% ක මුදලක් සභාවේ තැන්පත් කළයුතුය.

11-371/24

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බද්ද පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/85 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය සහ 148 වන වගන්තිය යටතේ විධිවිධාන ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි. එනම්,

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තියේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකුම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30 සම්පූර්ණ වූ වහාම 2024 වර්ෂය සඳහා මෙම බද්ද ලුණුගල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණය කරමි."

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

උපලේඛනය

			I වැනි තීරය	*II වැනි තීරය*
				රු. ශත
(1)	01.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, රික්ෂෝවක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා		25 0
	02.	සෑම බයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා :		
		(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්		18 0
		(ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්		4 0
	03.	සෑම කරත්තයක් සඳහා		20 0
	04.	සෑම අත්කරත්තයක් සඳහා		10 0
	05.	සෑම රික්ෂෝවක් සඳහා		7 50
	06.	සෑම අශ්වයෙකු, පෝනියෙකු, කොටළුවෙකු සඳහා		15 0
	07.	සෑම ඇතෙකු සඳහා		50 0
	10.	පා පැදියක් සඳහා (තහඩුව සමග) (තහඩු වියදම් සඳහා රු. 50 ක මුදලක් අය කරනු ලැබේ.)		54 0

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/86 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 152(1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි. එනම්,

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ බලපත්‍රයක් හෝ පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හෝ වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී කර ගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2024 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ලුණුගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි."

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද*
	රු . ශත
01. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
02. රු. 6,001 ඉක්මවන නමුත් රු. 12,000 0 නොඉක්මවන විට	90 0
03. රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 0 නොඉක්මවන විට	180 0
04. රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 0 නොඉක්මවන විට	360 0
05. රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 0 නොඉක්මවන විට	1,200 0
06. රු. 1,50,001 ඉක්මන වන විට	3,000 0

ලුණුගල ප්‍රාදේශීය සභාව

ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට අදාළ සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ 2024 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/87 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය සහ 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

"ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3)වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය සහ 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ (I) වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත වාර්ෂික වටිනාකම පදනම්ව බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්, පවත්වාගෙන යන ව්‍යාපාර සඳහා 2024 මාර්තු 31 දිනට පෙර බලපත්‍ර ලබාගත යුතු බවත්,

එසේම, තවදුරටත් එවැනි යම් ස්ථානයක හෝටලයක්, ආපනශාලාවක් හෝ නවාතැන්පළක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නේ ද 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපනශාලාව හෝ නවාතැන්පළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ ද අවස්ථාවක 2024 වර්ෂයට අයකරන බලපත්‍ර ගාස්තු 2023 වර්ෂයේ ඒ හෝටලයේ, ආපනශාලාවේ හෝ නවාතැන්පලේ ආදායමින් සියයට එකක් (1%) විය යුතු බවටත්, එම ගාස්තුව නියම කිරීම සඳහා හෝටලයේ, ආපනශාලාවේ හෝ නවාතැන්පලේ ගත වූ වර්ෂයේ සම්පූර්ණ ආදායම් විස්තරයක් අයිතිකරු, කළමනාකරු හෝ බලයලත් අයෙකු විසින් ලුණුගල ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු බවටත් මම තීරණය කරමි."

පළමු උපලේඛනය

I වැනි තීරය		*II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
පීඩාකාරී ව්‍යාපාර :				
01.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	බත්, තේ සහ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	කොණ්ඩා සැකසීමේ සැලුන් හල් සහ බාබර් සාප්පු	500 0	750 0	1,000 0

අනු. අංකය	*I වැනි තීරය* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
04.	මස් කඩ පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	කිරි පට්ටි හා කිරි වෙළඳාම	500 0	750 0	1,000 0
06.	උකස් ලියාපදිංචි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	අයිස් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	සිසිල් බීම කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
09.	ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	පොදු වෙළඳසැළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	සංචාරක වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	පෞද්ගලික වෙළෙඳපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	අවමංගල්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	ලැගුම් නිවාස හා නවාතැන්පළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අප්‍රසන්න ව්‍යාපාර :				
1.	මිනිරන් සුද්ද කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
2.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
3.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
4.	සත්ත්ව පාලන (මස්, කිරි හෝ බිත්තර සඳහා) සතුන් ඇති කිරීමේ ස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
6.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම	500 0	750 0	1,000 0
7.	පශු වෛද්‍ය ඖෂධ හළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබාගැනීම	500 0	750 0	1,000 0
9.	සම් විකිණීමට තබාගැනීම	500 0	750 0	1,000 0
10.	කරවල, මාළු, ජාඩි කිලෝ 100 ට වඩා වැඩි ප්‍රමාණයක් තබාගැනීම	500 0	750 0	1,000 0
11.	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේළීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
12.	පොල්කටු අඟුරු හෝ දුව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
13.	දුම්කොළ වේළීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
15.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
16.	සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
17.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	ට්‍රන්ක් පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
20.	අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබාගැනීම	500 0	750 0	1,000 0
21.	ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0
22.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
23.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
24.	වඩු කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	සිරප් හෝ පලතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0

අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*I වැනි තීරය*	*II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම*	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
26.	රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
27.	පොල් ලෙලි නිපදවීම හෝ පල් කිරීම	500 0	750 0	1,000 0
28.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
29.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
30.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
31.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
32.	දූව ඉරීම	500 0	750 0	1,000 0
33.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
34.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
35.	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
36.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
37.	පලතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
38.	කෝපි , ධාන්‍ය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
39.	බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
40.	ෆෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0
41.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
42.	පොටි නිපදවීම	500 0	750 0	1,000 0
43.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
44.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
45.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
46.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
47.	සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
48.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
49.	ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
50.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
51.	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීම	500 0	750 0	1,000 0
52.	සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
53.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් නිපදවීම	500 0	750 0	1,000 0
54.	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
55.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
56.	ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
57.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
58.	අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
59.	උළු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
60.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදුකර විකිණීම	500 0	750 0	1,000 0
61.	යන්ත්‍රානුසාරයෙන් බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
62.	නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
63.	කුකුළු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	විෂබීජනාශක නිපදවීම	500 0	750 0	1,000 0
65.	ටයර්/ටියුබ් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
66.	සපත්තු/බෑග්/සම්/භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
67.	දුම්කොළ යොදා කරන සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම	500 0	750 0	1,000 0

දෙවන උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරය* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
	අන්තරාදායක ව්‍යාපාර :	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*
1.	කළුගල් තැනීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
2.	සිසිල් බීම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
3.	අයිස් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
4.	එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
5.	පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
6.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
7.	මෙතිලේටි ස්ප්‍රිතු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
8.	තේ පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
9.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	පිටුරු තබාගැනීම	500 0	750 0	1,000 0
12.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
14.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
15.	හිරිගල් හෝ හුණු ගල් කැණීම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	හිස්ගෝනි හෝ හිස් බෝතල් එකතු කිරීම	500 0	750 0	1,000 0
18.	පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
19.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
20.	විසිතුරු පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
21.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
22.	ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ	500 0	750 0	1,000 0
23.	වෑල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

තුන්වැනි උපලේඛනය

පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :

1.	තලාතු මිනිරන් ශුද්ධ කිරීම	500 0	750 0	1,000 0
2.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
3.	ඩ්‍රයික්ලීන් කිරීම	500 0	750 0	1,000 0
4.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
5.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
6.	තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
7.	හුණුගල් හෝ හිරිගල් නිපදවීම	500 0	750 0	1,000 0
8.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු නිපදවීම	500 0	750 0	1,000 0
9.	මෝර තෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
10.	බෝට්ටු තැනීම	500 0	750 0	1,000 0
11.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12.	ලෝහ වර්ග පෑස්සීම	500 0	750 0	1,000 0

අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*I වැනි තීරය*	*II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම*	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
13.	මෝටර් වාහන අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
14.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
15.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
16.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
19.	කෘමිනාශක, දිලීරනාශක, පැළෑටි හෝ පලිබෝධනාශක නිපදවීම	500 0	750 0	1,000 0
20.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
21.	මදුරු දඟර නිපදවීම	500 0	750 0	1,000 0
22.	දූව ආරක්ෂණ නිපදවීම	500 0	750 0	1,000 0
23.	ගල්තාර, හෝ බිටුමන්මය ද්‍රව්‍ය නිපදවීම	500 0	750 0	1,000 0
24.	වීදුරු භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
25.	වීදුරු කැඩපත් නිපදවීම	500 0	750 0	1,000 0
26.	යකඩ තහඩු ගැල්වනයිස් කිරීම	500 0	750 0	1,000 0
27.	පාස්සන ඊයම් නිපදවීම	500 0	750 0	1,000 0
28.	ඇළුමිනියම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
29.	කටු කම්බි නිපදවීම	500 0	750 0	1,000 0
30.	කම්බි ඇණ නිපදවීම	500 0	750 0	1,000 0
31.	කාබන් කඩදාසි හෝ යතුරුලියන පටි (රිබන්) නිපදවීම	500 0	750 0	1,000 0
32.	බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබනික ටැංකි නිපදවීම	500 0	750 0	1,000 0
33.	ජී. අයි. බාල්දි නිපදවීම	500 0	750 0	1,000 0
34.	වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ, හෝ අධිශීතකරණ නිපදවීම	500 0	750 0	1,000 0
35.	වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
36.	බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම	500 0	750 0	1,000 0
37.	යන්ත්‍රෝපකරණ නිපදවීම	500 0	750 0	1,000 0
38.	විදුලි භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
39.	රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම	500 0	750 0	1,000 0
40.	සංචායන බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
41.	ට්‍රැක්ටර් රථ එකලස් කිරීම	500 0	750 0	1,000 0
42.	රේඩියේටර් නිපදවීම	500 0	750 0	1,000 0
43.	ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
44.	වියළි කෝෂ බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
45.	වී මෝල්	500 0	750 0	1,000 0
46.	මිනී පෙට්ටි තැනීම	500 0	750 0	1,000 0
47.	දුරකථන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
48.	විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම	500 0	750 0	1,000 0
49.	පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
50.	කරදිය මසුන් අළෙවි කිරීම (සංචාරක)	500 0	750 0	1,000 0
51.	මිරිදිය මසුන් අළෙවි කිරීම (සංචාරක)	500 0	750 0	1,000 0
52.	පක්ෂීන් ඇති කිරීම සහ මස් අළෙවිය	500 0	750 0	1,000 0
53.	ඌරු කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/88 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 150 (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2024 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්, ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් ලෙස මම තීරණය කරමි."

උපලේඛනය

I වැනි තීරය		*II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01	කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02	මැටි බඳුන් නිපදවීම සහ අළෙවිය	500 0	750 0	1,000 0
03	පාවහන් සෑදීම සහ අළෙවි කිරීම	500 0	750 0	1,000 0
04	වානේ ගෘහභාණ්ඩ සෑදීම	500 0	750 0	1,000 0
05	ගඩොල් පෝරණු පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06	බ්ලොක් ගල් කර්මාන්තය පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07	ඉදල්, කොහු, පාපිසි නිපදවීම	500 0	750 0	1,000 0

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/89 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා හට ලැබී ඇති බලතල ප්‍රකාර, 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ උඟව පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ සාදන ලද එකී 2013.06.28 වැනි දින අංක 1816/43 දරන *ගැසට් පත්‍රය* පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ යම්කිසි තැනැත්තෙකු විසින් යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි කිසියම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ දී අවසර පත්‍රයක් සඳහා එකී අතුරු ව්‍යවස්ථා පනතේ (3) වන වගන්තියේ (උ) ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් 2024 වර්ෂයේ දී ලුණුගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

	ප්‍රචාරක දැන්වීම් විස්තරය	*රු. ශත*
1.	ප්‍රචාරක වෙළඳ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා කිසියම් ස්ථානයක සවිකිරීමේදී එක් හතරැස් අඩියකට	125 0
2.	යම් තැනැත්තෙකු විසින්, උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවිකර ඇති හෝ මහජනතාවට දැන ගැනීමට හැකි වන පරිදි යම් තැනකට සවිකර තබන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් සඳහා හතරැස් අඩියකට,	
	මසකට	35 0
	වර්ෂයකට	50 0
3.	බිත්තියක හෝ තාප්පයක, පුවරුවක, ලැල්ලක හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට (සෑම වසරකම ගෙවිය යුතුය.)	50 0

11-286/5

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/90 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

දුරකතන කුළුණු/ ඇන්ටනා කුළුණු ඉදිකිරීම සඳහා පෙරසැරි ගාස්තු

		රු. ශත
උස මීටර් 05 සිට 20 දක්වා	-	2,50,000 0
උස මීටර් 21 සිට 40 දක්වා	-	3,75,000 0
උස මීටර් 41 සිට 50 දක්වා	-	5,00,000 0
උස මීටර් 50 ට වැඩිවන සෑම මීටර් 01ක් සඳහා ම	-	12,500 0 බැගින් අයවිය යුතුය.

දුරකතන කුළුණු / ඇන්ටනා කුළුණු ඉදිකිරීම හේතුවෙන් වැසෙන මුළු බිම් ප්‍රමාණය සඳහා මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ පෙරසැරි ගාස්තුව රු. 2,812.50 ක මුදලක් අය කිරීමට මම තීරණය කරමි.

11-286/6

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/91 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාර, ලුණුගල ප්‍රාදේශීය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථීර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2024 වර්ෂය සඳහා රුපියල් 10 0 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (IV) (ආ) කොටසේ 1989 පෙබරවාරි මස 03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2024 වර්ෂය සඳහා රුපියල් 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ 2024 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු වශයෙන් ගෙවිය යුතු වේ.

(ඈ) 2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2024 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු වශයෙන් ගෙවීමට,

විධාන කළ යුතු යැයි මම තීරණය කරමි.

11-286/7

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් සහ බදු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/92 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134(1) වගන්තිය අනුව බදුල්ල දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය අනුව ලුණුගල ප්‍රාදේශීය සභාව *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද දියුණු කළ ප්‍රදේශය ඇතුළත ඇති සියලු නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම් හා ගෙපත්වල 2022 වර්ෂයේ පිළිගෙන ක්‍රියාත්මක කරනු ලැබූ වාර්ෂික වටිනාකම් පිළිබඳ තක්සේරුව 146 (1) වගන්තියේ බලතල ප්‍රකාරව 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් 3.5% ක වරිපනම් බද්දක් ද 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනෙන් අවසන් වන කාර්තුවලට අදාළ වාරික වශයෙන් ගෙවිය යුතු බවට විධානය කිරීමටත්,

2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2024 ජනවාරි මස 31 වැනි දිනට පෙර ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් 10% ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට පෙරාතුව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවීමටත් මම තීරණය කරමි.

11-286/8

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/93 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ විධිවිධාන වලින් මා හට ලැබී ඇති බලතල ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේ දී පහත උපලේඛනයේ සඳහන් පරිදි 2024 වර්ෂයේ දී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද පනවා අය කිරීමටත්, එකී බද්ද 2024 මාර්තු මස 31 වැනි දිනට පෙර ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

උපලේඛනය

ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැනහොන්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

(ආ) ඒ ඉඩම් ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය දෙකට තුනට (2ට 3ට) වඩා අඩු වන්නේ නම්,

(ඇ) ඒ ඉඩම් විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති වන විටක, හෝ

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට එකක (1%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

11-286/9

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අයාලේ යන ගවයින් හා සතුන් අල්ලා ගැනීමේ දී ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/94 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 66 වන වගන්තිය ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සියලුම පොදු මාර්ගවල හෝ පොදු ස්ථාන හා ඒ අවට යම් කරත්තයක බැඳ ඇත්නම් මිස දිගේලි කර අයාලේ යමින් සිට හෝ සැරිසරන ගවයින්, මීගවයින්, එළුවන්, ආදී සතුන් ඇල්ලීමටත් ඒසේ අල්ලා ගනු ලබන සතුන් ගාල් කිරීමටත්, එසේ ගාල් කරනු ලබන සතුන් නිදහස් කිරීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2024 වර්ෂයේ අය කිරීමටත් සහ අයාලයේ යන සතුන් දින 10ක් තුළ අයිතිකරුවන් තම සතුන් නිදහස් කර නොගතහොත් එම කාලයට පසුව එකී සතුන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා අදාළ ගාස්තු සහ වෙන්දේසි කිරීමේ වියදම් අය කිරීමටත් එසේ අය කරන මුදලින් තුනෙන් එකක් ඇල්ලීමට බලය පවරන ලද පුද්ගලයන්ට ගෙවීමටත් මම තීරණය කරමි.

උපලේඛනය

		රු. ශත
01.	ගවයින් හෝ මී ගවයින් ඇල්ලීමට (එක් සතෙකුට)	1,000 0
02.	එළුවන් ඇල්ලීමට (එක් සතෙකුට)	500 0
03.	ගවයින් ආරක්ෂා කිරීමේ ගාස්තු/එක් දිනකට එක් සතෙකුට	500 0
04.	එළුවන් ආරක්ෂා කිරීමේ ගාස්තු/එක් දිනකට එක් සතෙකුට	300 0
05.	ගවයින් නඩත්තු කිරීමේ ගාස්තු එක් දිනකට එක් සතෙකුට	500 0
06.	එළුවන් නඩත්තු කිරීමේ ගාස්තු එක් දිනකට එක් සතෙකුට	300 0

11-286/10

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අයදුම්පත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/95 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

2024.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් පරිදි අයදුම්පත්‍ර හා වෙනත් ගාස්තු පනවා අය කිරීමට ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් වන මම තීරණය කරමි.

උපලේඛනය

	අයදුම්පත්‍ර ගාස්තු	*රු. ශත*
01.	වීථි රේඛා සහතික ගාස්තු	1,500 0
02.	ජල අයදුම්පත් ගාස්තු	250 0
03.	ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු	300 0
04.	පුස්තකාල අයදුම්පත් ගාස්තු	100 0
05.	කට්ටි සැලසුම් අනුමත කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	100 0
06.	වරිපනම් නම් වෙනස් කිරීමේ පෝරම ගාස්තු	150 0
07.	වරිපනම් සහතික නිකුත් කිරීමේ ගාස්තු	250 0
08.	ගොඩනැගිලි පර්යේෂණයට යැවිය යුතු පෝරම ගාස්තු	50 0
09.	පුස්තකාල සාමාජික ඇප තැන්පත් ගාස්තු	100 0
10.	ප්‍රාදේශීය සභා පෙර පාසලකට ළමුන් ඇතුළත් කිරීමේ ගාස්තුව	500 0
11.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
12.	ක්‍රීඩා පිටිය ආදායම් උත්පාදනය නොවන උත්සව සඳහා දිනකට කුලියට දීම (ක්‍රීඩා)	2,500 0
13.	ක්‍රීඩා පිටිය ආදායම් උපයන උත්සව සඳහා දිනකට කුලියට දීම (සැණකෙළි)	5,000 0
14.	බස්නැවතුම්පල අසල දිනකට කුලියට දීම	2,000 0
15.	බැකෝ ලෝඩරය ලබාදීම (පැයකට රියැදුරු සහිතව) ඉන්ධන රහිතව කුළියට දීම	4,000 0

අයදුම්පත්‍ර ගාස්තු	*රු. ශත*
16. බැකෝ ලෝඩරය ලබාදීම (පැයකට රියැදුරු සහිතව) ඉන්ධන සහිතව කුළියට දීම	

කුලී ගාස්තුව + (පැයකට දැවෙන තෙල් ප්‍රමාණය L x වත්මන් ඩීසල් තෙල් 1 L ක මිල)

(පවතින වත්මන් ඩීසල් ලීටරයක මිල අනුව ඉහත ගාස්තුව ගණනය කරනු ලබන අතර ගමන් ආරම්භ කරන ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර අනුව සේවා ස්ථානයට යාමට සහ ඒමට එක් කිලෝමීටරයක් පාසා පවතින වත්මන් ඩීසල් ලීටරයක මිල ඉහත ගාස්තුවලට අමතරව එකතු වේ.)

11-286/11

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඇතැම් ඉඩම් විකිණීම මත ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/96 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 154 වගන්තියේ (I) වැනි උපවගන්තිය ප්‍රකාරව, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ලුණුගල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1% කට (සියයට එකක්) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරුගේ නියෝජිතයා විසින් 2024 වර්ෂය සඳහා ලුණුගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

11-286/12

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා බහුකාර්යය ගොඩනැගිල්ල වෙනුවෙන් ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/97 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ ඌව පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ සාදන ලද සම්මන්ත්‍රණ ශාලා අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2024 වර්ෂය සඳහා අය කිරීමට මම තීරණය කරමි.

උපලේඛනය

		රු. ශත
01.	එක් දිනක් සඳහා ශාලාව කුළියට දීම (පෙ.ව. 8.00 සිට - ප.ව. 5.00 දක්වා) 5% සේවා ගාස්තු සමග	31,500 0
02.	ඇප තැන්පත් මුදල (එක් දින, රාත්‍රී උත්සව, කෙටි රැස්වීම් සඳහා ද අදාළ වේ.)	10,000 0
03.	පැය 4ට අඩු කෙටි රැස්වීමක් සඳහා පැයකට ගාස්තුව	3,000 0
04.	රාත්‍රී උත්සව හා සාද සඳහා (ප.ව. 5.00 සිට රාත්‍රී 12 දක්වා පමණි) (ඉහත උත්සව සඳහා පුටු 100 හා මේස 20 ලබාදෙනු ඇත.) 5% සේවා ගාස්තු සමග	15,750 0
05.	බහු කාර්ය ගොඩනැගිල්ලේ පිටුපස ඇති මුළුතැන්ගේ ඉහළ මාලයේ ඇති කාමරයක් දිනකට කුලියට දීමේ ගාස්තුව රු. 1,500 0 වේ.	

11-286/13

ලුණුගල ප්‍රාදේශීය සභාව

උත්සව භාණ්ඩ කුලියට දීම වෙනුවෙන් ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/98 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උත්සව භාණ්ඩ කුලියට දීම වෙනුවෙන් පහත සඳහන් ගාස්තු අය කිරීමට මම තීරණය කරමි.

අ. අ.	*ද්‍රව්‍ය / භාණ්ඩය*	*දිනකට අය කරන මුදල* *රු. ශත*
1	බුෆේ භාජන කට්ටලය (භාජන 10ක් හැඳි 10ක් සමඟ)	2,000 0
2	පිඟන් 1ක්	15 0
3	චතුර බොන වීදුරු 1ක්	10 0
4	බීම වීදුරු 1ක්	10 0

අ. අ.	*ද්‍රව්‍ය / භාණ්ඩය*	*දිනකට අය කරන මුදල රු. ශත*
5	ගෑස් උඳුන් (ලොකු) 01 ක්	500 0
6	සාස්පාන් 1ක් (30 Kg)	500 0
7	සාස්පාන් 1ක් (20 Kg)	300 0
8	සාස්පාන් 1ක් (10 Kg)	200 0
9	විශාල ප්‍රමාණයේ තාච්චි 1ක්	500 0
10	කුඩා ප්‍රමාණයේ තාච්චි 1ක්	250 0
11	තෙල් හැඳි (ලොකු) 1ක්	30 0
12	විදුලි හිරමණ 01ක්	500 0
13	(10 Kg) රයිස් කුකර් 01ක්	500 0
14	පීරිසි කෝප්ප 01ක්	20 0
15	Sound System	6,000 0
16	කිරිකප් එකක්	10 0
17	උණුසුම් සීතල ජල පෙරනය (ලීටර් 20 හිස් බෝතලය සමග)	1,000 0
18	Coffee Machine 01 ක් (ද්‍රව්‍ය රහිතව, ලීටර් 20 හිස් බෝතලය සමග)	1,500 0
19	එක් කුඩයක් සඳහා දිනකට	250 0
20	ප්ලාස්ටික් මේස 01ක්	250 0
21	කුඩයක් සහිත ප්ලාස්ටික් මේස 01ක්	400 0
22	ඇඳ රහිත ප්ලාස්ටික් පුටු 01ක්	15 0
23	ඇඳ සහිත කුෂන් පුටු එකක්	30 0
24	GI බට 01ක්	50 0
25	තහඩු එකක් දිනකට කුලියට දීම	20 0
26	10x10 කැනපි හට් එකක් කුලියට ලබා දීම	500 0
27	ප්ලාස්ටික් පුටු එකක් කුලියට දීම	15 0

20 **KV විදුලි ජනක යන්ත්‍රය (ඉන්ධන රහිතව) :**

පළමු දිනයට රු. 10,000 0 ක මුදලකට ලුණුගල නගර සීමාව තුළ ඉන්ධන රහිතව (පළමු කි. මී. 02 ඇතුළත) කුලියට දෙනු ලබන අතර පළමු කි. මී. 02 න් පසු වැඩිවන සෑම කි. මී. 01 ක් සඳහාම රු. 250 0 බැගින් අයකරනු ලැබේ. මීට අමතරව රඳවා ගනු ලබන එක් දිනයකට රු. 2,000 0 බැගින් අමතර මුදලක් අය කරනු ලැබේ.

සංදර්ශන වේදිකාව කුලියට දීම :

අඩි 30x20 සන්දර්ශන වේදිකාව පළමු දිනට රු. 60,000 0 ක කුලී පදනම මත ලබා දෙනු ලබන අතර අතිරේක සෑම දිනයක් සඳහාම රු. 10,000 0 බැගින් අය කරනු ලැබේ. මෙම සංදර්ශන වේදිකාව කුළී පදනම මත ලබා ගන්නා අය විසින් ප්‍රවාහන පහසුකම් සපයා ගත යුතු අතර වේදිකාව සවි කිරීම හා ගැලවීම සභාවේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ පුහුණුවලත් කණ්ඩායමක් මගින් සිදු කරනු ලබයි. අයකරනු ලබන කුලී මුදලින් වේදිකාව සවිකිරීම හා ගැලවීම සඳහා පුහුණුවලත් කාර්ය මණ්ඩලයට එක් රු. 20,000 0 ක මුදලක් ගෙවීම සිදු කරනු ලැබේ.

අඩි 30x15 VIP හට් කුලියට දීම :

පළමු දිනයට රු. 10,000 0 ක මුදලකට කුලී පදනම මත ලබා දෙනු ලබන අතර අතිරේක සෑම දිනයක් සඳහාම රු. 2,000 0 ක මුදලක් අය කරනු ලැබේ. පළමු කි. මී. 02 තුළ ප්‍රවාහනය නොමිලේ සිදුකරන අතර වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම රු 250 0 බැගින් අය කරනු ලැබේ. එසේම අංග සම්පූර්ණ පැකේජයක් ලෙස ද මෙම හට් කුලියට ලබා ගත හැකිය. එහිදී මේස කවර සහිත මේස 10ක්, පුටු කවර සහිත පුටු 50ක්, භාජන කට්ටල 10ක බුෆේ සෙට් එකක් ද, ඇතුළත්ව දිනක කුලිය රු. 15,000 0 වේ.

ප්‍රොජෙක්ටරය කුලියට දීම :

පැයකට රු. 1,000 0 ක මුදලකට කුලියට ලබා දෙනු ලැබේ.

පැය හතරකට රු. 4,000 0 මුදලකට කුලියට ලබා දෙනු ලැබේ. (පැය 04ට වැඩි දවස සඳහා කුලී මුදල රු. 4,000 0 වේ.)

11-286/14

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඉඩම්, ගොඩනැගිලි අයදුම්පත් අනුමත කිරීමේ ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/99 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ ප්‍රාදේශීය සභාව සතු පැවරී ඇති බලතල ප්‍රකාරව සහ 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ එම පළාත් සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ ගොඩනැගිලි තැනීම සහ වැඩ කටයුතු අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනයේ දක්වෙන ගාස්තු 2024 වර්ෂයට අයකළ යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

		රු. ශත
01.	නේවාසික හා ආයතනික ගොඩනැගිලි සැලසුමක් අනුමත කිරීමේ ගාස්තු (වර්ග අඩියකට)	2 0
02.	වාණිජ හා කර්මාන්ත ගොඩනැගිලි සැලසුමක් අනුමත කිරීමේ ගාස්තු (වර්ග අඩියකට)	3 0
03.	අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම	1,000 0

11-286/15

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා නිවාස ඉදි කිරීම සඳහා භූමි ප්‍රමාණය නිශ්චය කිරීමේ ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/100 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ගම් ප්‍රදේශයට අයත් වන්නා වූ ඉඩම් තැනිතලා භූමියක ඉඩම් කට්ටිය අවම භූමි ප්‍රමාණය පර්චස් 6 විය යුතු අතර, දියුණු කළ ගම් ප්‍රදේශය පිටත ඉඩම්වල කට්ටියක අවම භූමි ප්‍රමාණය පර්චස් 10 විය යුතුය.

ඉඩමේ ආනතිය 45ට වැඩි භූමි සඳහා ඉඩම් කට්ටියක අවම භූමි ප්‍රමාණය පර්චස් 20 විය යුතු අතර, 45 අඩු ආනතිය ඇති භූමි සඳහා ඉඩම් කට්ටියක අවම භූමි ප්‍රමාණය පර්චස් 15 විය යුතුය.

ඉඩම් කට්ටියක්, සැලැස්මක් අනුමත කිරීමේ ගාස්තු :

එක් කට්ටියක් සඳහා රු. 1,000 0

11-286/16

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා මාර්ගවල ගමන් කරන වාහනවල බර හා සිදුවන හානි සම්බන්ධයෙන් ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/101 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 70 වැනි වගන්තියේ (1), (2), (3) වගන්තිවලට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ එහි 07 වන කොටසේ "මාර්ගවල ගමන් කරන වාහනවල බර සහ වේගය සීමා කිරීම" පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2024 වර්ෂයට අය කළ යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

අ. අ.	*සංවර්ධනය සඳහා වියදම් කරන ලද මුදල*	*අය කළ යුතු ගාස්තුව*
1	ලක්ෂ 01 සිට ලක්ෂ 03 දක්වා	අබලන් වූ කොටස් පමණක් පිළිසකර කිරීම සඳහා තක්සේරු කර අදාළ මුදල පනවා අය කිරීමට තීරණය කරමි.
2	ලක්ෂ 04 සිට ලක්ෂ 07 දක්වා	
3	ලක්ෂ 08 සිට ලක්ෂ 10 දක්වා	
4	ලක්ෂ 11 සිට ලක්ෂ 20 දක්වා	

11-286/17

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/102 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

267 වැනි අධිකාරිය වන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පැවැත්වෙන සෑම චිත්‍රපට දර්ශනයක් මැජික් දර්ශනයක් සැණකෙලි සංදර්ශනයක් සඳහා මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10% විනෝද බද්දක් 2024 වර්ෂය සඳහා අය කිරීමටත් පහත සඳහන් පරිදි අවසර පත්‍ර ගාස්තුවක් ද අය කිරීමටත් මම තීරණය කරමි.

අවසර පත්‍ර ගාස්තුව රු. 1,000 0

11-286/18

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ජල ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.09.21 වැනි දින අංක 2023/09/21/103 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එම පනතේ 118 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ ඌව පළාත් සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ ජල සම්පාදන අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2024 වර්ෂයට අයකළ යුතු බවත්, එය සෑම මාසයක් සඳහා ම ගණනය කරනු ලබන ජල ගාස්තු ඊට පසු මාසයේ අවසන් දිනට පෙර ලුණුගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

උපලේඛනය

ජල මනු සඳහා ගාස්තු පහත සඳහන් පරිදි වේ.

ලුණුගල නාගරික ජල යෝජනා ක්‍රමය

ජල මනු ගාස්තු ලැයිස්තුව - 2024

පරිභෝජනය	*ගෘහස්ථ*	*ව්‍යාපාර*	*පාසල් හා ආගමික*	*රාජ්‍ය ආයතන*	*රජය රෝහල්*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*
0	100 0	200 0	50 0	275 0	275 0
1	110 0	210 0	58 0	333 0	328 0
2	120 0	220 0	66 0	391 0	381 0
3	130 0	230 0	74 0	449 0	434 0
4	140 0	240 0	82 0	507 0	487 0
5	150 0	250 0	90 0	565 0	540 0
6	212 0	315 0	98 0	623 0	593 0
7	224 0	330 0	106 0	681 0	646 0
8	236 0	345 0	114 0	739 0	699 0
9	248 0	360 0	122 0	797 0	752 0
10	260 0	375 0	130 0	855 0	805 0
11	300 0	445 0	138 0	913 0	858 0
12	315 0	465 0	146 0	971 0	911 0
13	330 0	485 0	154 0	1029 0	964 0
14	345 0	505 0	162 0	1087 0	1017 0
15	360 0	525 0	170 0	1145 0	1070 0
16	405 0	650 0	178 0	1203 0	1123 0
17	425 0	675 0	186 0	1261 0	1176 0
18	445 0	700 0	194 0	1319 0	1229 0
19	465 0	725 0	202 0	1377 0	1282 0
20	485 0	750 0	210 0	1435 0	1335 0
21	560 0	880 0	218 0	1493 0	1388 0
22	585 0	910 0	226 0	1551 0	1441 0
23	610 0	940 0	234 0	1609 0	1494 0
24	635 0	970 0	242 0	1667 0	1547 0

පරිභෝජනය	*ගෘහස්ථ*	*වාහපාර*	*පාසල් හා ආගමික*	*රාජ්‍ය ආයතන*	*රජය රෝහල්*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*
25	660 0	1000 0	250 0	1725 0	1600 0
26	740 0	1135 0	258 0	2058 0	1928 0
27	770 0	1170 0	266 0	2116 0	1981 0
28	800 0	1205 0	274 0	2174 0	2034 0
29	830 0	1240 0	282 0	2232 0	2087 0
30	860 0	1275 0	290 0	2290 0	2140 0
31	895 0	1415 0	298 0	2348 0	2193 0
32	930 0	1455 0	306 0	2406 0	2246 0
33	965 0	1495 0	314 0	2464 0	2299 0
34	1000 0	1535 0	322 0	2522 0	2352 0
35	1035 0	1575 0	330 0	2580 0	2405 0
36	1075 0	1720 0	338 0	2638 0	2458 0
37	1115 0	1765 0	346 0	2696 0	2511 0
38	1155 0	1810 0	354 0	2754 0	2564 0
39	1195 0	1855 0	362 0	2812 0	2617 0
40	1235 0	1900 0	370 0	2870 0	2670 0
41	1330 0	2050 0	378 0	2928 0	2723 0
42	1375 0	2100 0	386 0	2986 0	2776 0
43	1420 0	2150 0	394 0	3044 0	2829 0
44	1465 0	2200 0	402 0	3102 0	2882 0
45	1510 0	2250 0	410 0	3160 0	2935 0
46	1555 0	2410 0	418 0	3218 0	2988 0
47	1600 0	2470 0	426 0	3276 0	3041 0
48	1645 0	2530 0	434 0	3334 0	3094 0
49	1690 0	2590 0	442 0	3392 0	3147 0
50	1735 0	2650 0	450 0	3450 0	3200 0
51	1785 0	2720 0	458 0	4058 0	3803 0
52	1835 0	2790 0	466 0	4116 0	3856 0
53	1885 0	2860 0	474 0	4174 0	3909 0
54	1935 0	2930 0	482 0	4232 0	3962 0

පරිභෝජනය	ගෘහස්ථ රු. ශත	ව්‍යාපාර රු. ශත	පාසල් හා ආගමික රු. ශත	රාජ්‍ය ආයතන රු. ශත	රජය රෝහල් රු. ශත
55	1985 0	3000 0	490 0	4290 0	4015 0
56	2035 0	3070 0	498 0	4348 0	4068 0
57	2085 0	3140 0	506 0	4406 0	4121 0
58	2135 0	3210 0	514 0	4464 0	4174 0
59	2185 0	3280 0	522 0	4522 0	4227 0
60	2235 0	3350 0	530 0	4580 0	4280 0
61	2340 0	3440 0	538 0	4638 0	4333 0
62	2395 0	3530 0	546 0	4696 0	4386 0
63	2450 0	3620 0	554 0	4754 0	4439 0
64	2505 0	3710 0	562 0	4812 0	4492 0
65	2560 0	3800 0	570 0	4870 0	4545 0
66	2615 0	3890 0	578 0	4928 0	4598 0
67	2670 0	3980 0	586 0	4986 0	4651 0
68	2725 0	4070 0	594 0	5044 0	4704 0
69	2780 0	4160 0	602 0	5102 0	4757 0
70	2835 0	4250 0	610 0	5160 0	4810 0
71	2995 0	4360 0	618 0	5218 0	4863 0
72	3055 0	4470 0	626 0	5276 0	4916 0
73	3115 0	4580 0	634 0	5334 0	4969 0
74	3175 0	4690 0	642 0	5392 0	5022 0
75	3235 0	4800 0	650 0	5450 0	5075 0
76	3295 0	4910 0	658 0	5508 0	5128 0
77	3355 0	5020 0	666 0	5566 0	5181 0
78	3415 0	5130 0	674 0	5624 0	5234 0
79	3475 0	5240 0	682 0	5682 0	5287 0
80	3535 0	5350 0	690 0	5740 0	5340 0
81	3700 0	5480 0	698 0	5798 0	5393 0
82	3765 0	5610 0	706 0	5856 0	5446 0
83	3830 0	5740 0	714 0	5914 0	5499 0
84	3895 0	5870 0	722 0	5972 0	5552 0

පරිභෝජනය	*ගෘහස්ථ*	*ව්‍යාපාර*	*පාසල් හා ආගමික*	*රාජ්‍ය ආයතන*	*රජය රෝහල්*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*
85	3960 0	6000 0	730 0	6030 0	5605 0
86	4025 0	6130 0	738 0	6088 0	5658 0
87	4090 0	6260 0	746 0	6146 0	5711 0
88	4155 0	6390 0	754 0	6204 0	5764 0
89	4220 0	6520 0	762 0	6262 0	5817 0
90	4285 0	6650 0	770 0	6320 0	5870 0
91	4385 0	6800 0	778 0	6378 0	5923 0
92	4455 0	6950 0	786 0	6436 0	5976 0
93	4525 0	7100 0	794 0	6494 0	6029 0
94	4595 0	7250 0	802 0	6552 0	6082 0
95	4665 0	7400 0	810 0	6610 0	6135 0
96	4735 0	7550 0	818 0	6668 0	6188 0
97	4805 0	7700 0	826 0	6726 0	6241 0
98	4875 0	7850 0	834 0	6784 0	6294 0
99	4945 00	8000 0	842 0	6842 0	6347 0
100	5015 0	8150 0	850 0	6900 0	6400 0

(ඒකක එකක් යනු ජල ලීටර් 1,000)

මනුවට පිටතින් ජලය ලබා ගැනීම හෝ ජල මනුව අක්‍රිය කිරීම හෝ ජල මනුව ඉවත් කළහොත් හෝ එවැනි අයථා ක්‍රියාවන් සඳහා දඩ මුදල රු. 15,000 කි.

විසන්ධි කරන ලද ජල සම්බන්ධතා නැවත සන්ධි කිරීමේ ගාස්තුව	රු. 5,000 0 කි.
නව ජල සම්බන්ධතා ලබාගැනීමේ ඇස්තමේන්තු මුදල	රු. 20,000 0 කි
නව ජල සම්බන්ධතා ලබාගැනීමේ තැන්පත් මුදල	රු. 2,000 0 කි
ජල මීටර් කණු වෙනස් කිරීමේ මුදල	රු. 2,000 0 කි
ජල පොම්පාගාරයට අදාළව විදුලි බිල්පත් වටිනාකම පාරිභෝගික බිල්පතට ඇතුළත් කරනු ලැබේ.	
ජල ටැංකි කුලියට දීමේ (දිනකට) ගාස්තුව	රු. 500 0 කි
ජලය සහිත ජල බවුසරය කුලියට දීමේ ගාස්තුව (පළමු කි. මී. 2 ඇතුළත)	රු. 3,000 0 කි

(නගරය ඇතුළත යනු ප්‍රාදේශීය සභා භූමියේ සිට පළමු කි. මී. 2 ඇතුළතයි. ප්‍රාදේශීය සභා භූමියේ සිට පළමු කි. මී. 2 ඉක්ම වූ විට සෑම කි. මී. 1ක් සඳහා ම රු. 200 0 බැගින් අය කරනු ලබයි.)

යපම්ම ජල යෝජනා ක්‍රමයේ ජල ගාස්තුව	රු. 200 0 කි.
වේල්ලවල ජල යෝජනා ක්‍රමයේ ජල ගාස්තුව	රු. 200 0 කි.
සූරියගොඩ ජල යෝජනා ක්‍රමයේ ජල ගාස්තුව	රු. 200 0 කි.
මඩොල්සිම ජල යෝජනා ක්‍රමයේ ජල ගාස්තුව	රු. 200 0 කි.
ජල සාම්පල් පරීක්ෂා කිරීමේ ගාස්තුව	රු. 3570 0 කි.

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කඩ කාමර පැවරුම් ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023/09/21 වැනි දින අංක 2023/09/21/104 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව ලුණුගල ප්‍රාදේශීය සභාවට අයත් ලුණුගල නගරයේ හා මඩොල්සිම නගරයේ පිහිටි කඩ කාමර බදුකරුවන්ගේ කැමැත්ත මත තම පවුලේ ඥාතියෙකුට පැවරිය හැකි අතර, ඒ සඳහා පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට මම තීරණය කරමි.

1.	ලුණුගල නගරයේ එක් කඩ කාමරයක පැවරුම් ගාස්තුව	රු. 25,000 0
2.	මඩොල්සිම නගරයේ එක් කඩ කාමරයක පැවරුම් ගාස්තු	රු. 25,000 0

11-286/20

ලුණුගල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් එම්. පී. මංජුලා ද සිල්වා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාර ව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023/09/21 වන දින අංක 2023/09/21/105 දරන තීරණය ගනු ලැබූ බවට මෙයින් නිවේදනය කරමි.

එම්. පී. මංජුලා ද සිල්වා,
සභා ලේකම්,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2023 ඔක්තෝබර් මස 26 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනතේ අංක 26 වෙනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනත යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය මගින් පවරා ඇති බලතල ප්‍රකාර ව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් අංක 2264/18 සහ 2022.01.27 දිනැති *ගැසට්* නිවේදනයෙන් හා 2008.02.01 දිනැති අංක 1534/18 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ හා තත්ත්ව) නියෝග සමඟ එහි 2022.01.27 දිනැති අංක 2264/17 දරන *ගැසට්* නිවේදනයෙන් පනවන ලද රෙගුලාසිවලට අනුකූලව එකී ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නන් විසින් අදාළ වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඉදිරියට උපරිම වර්ෂ තුනකට රු. 4,500 ක බලපත්‍ර ගාස්තුවක් මෙම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ක්‍රියාකාරකම් :

01. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්ත ව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත

02. සේවක සංඛ්‍යාව 5 ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින බතික් කර්මාන්ත

03. සේවක සංඛ්‍යාව 5 ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)

04. රෙදි වියන යන්ත්‍ර මැෂින් 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත

05. දිනකට ලීටර් 200 ට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල් තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත

06. පොල් තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත

07. දිනකට ලීටර් 100 කට අඩු නිෂ්පාදන සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත

08. දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්

09. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්

10. සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත

11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත

12. සේවක සංඛ්‍යාව 5 ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත

13. සේවක සංඛ්‍යාව 5 ට වැඩි පිරිසක් සේවයේ නියුක්ත ව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/මුහුවම් කිරීමේ කර්මාන්ත

14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත

15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250 ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රස කැවිලි නිෂ්පාදන කර්මාන්ත

16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500 ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්

17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්

18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25 ක් හෝ ඊට වැඩි සහ 50 ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්

19. වැඩුණු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500 ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය= පක්ෂීන් සංඛ්‍යාව + 50 (ඌරන් සංඛ්‍යාව + ගවයින් සංඛ්‍යාව) + 10 (එළුවන් සංඛ්‍යාව)

20. ගබඩා ධාරිතාවය ඝන මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන

21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත :

22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත

23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20 ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු

24. සේවක සංඛ්‍යාව 5 කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින ප්ලාස්ටර් ඔෆ් පැරිස් අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා ඕනෑම කර්මාන්තයක්

25. බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත

26. උළු සහ ගඩොල් පෝරණු

27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිත ව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත

28. කළු ගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත

29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු

30. දිනකට ඝන මීටර් 25 ට අඩු ඉරුම් ධාරිතාවක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05 සහ ඊට වැඩි සහ 10 කට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත

31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත

32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත

33. සේවක සංඛ්‍යාව 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා

34. පදිංචි සංඛ්‍යාව දිනකට 25 ක් හෝ ඊට වැඩි සහ 100 ට අඩු පුද්ගලයින් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්

35. විසිරි පින්තාරු කිරීම් හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ්

36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත

37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

38. මෘත ශරීර කල් තබා ගැනීමට සකස් කිරීම සහිත මල් ශාලා

39. මෙම උපලේඛනයේ ඈ කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සහ 50 ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/කර්මාන්තයක්.

11-286/21

ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින තීරණ අංක 183 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් ගාස්තු, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු මුදල 2024 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත්, එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් බද්ද එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

ඩී. එම්. එල්. ඩී. දසනායක,
ලේකම්,
ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩ වීදියේ පිහිටි,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත පිහිටි දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද උලපනේ, දොලොස්බාගේ, රාක්ෂාව යන ප්‍රදේශවල පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ගෙපත්වල 2023 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත් ;

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) ක වරිපනම් බද්දක් ද, 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් ; සහ

ඒ වරිපනම් බද්ද, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

11 - 288/1

ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින තීරණ අංක 184 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2024 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

ඩී. එම්. එල්. ඩී. දසනායක,
ලේකම්,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩවීදියේ පිහිටි,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය කිරීම 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නීතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2024 වර්ෂය සඳහා රුපියල් දහය බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වන කොටසේ 1989.02.03 දිනැති අංක 544 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2024 වර්ෂය සඳහා රු. 50 0 බැගින් වූ වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ 2024 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික 04කින් ගෙවීමට විධාන කළ යුතු යයි ද, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

11 - 288/2

ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින තීරණ අංක 185 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. එල්. ඩී. දසනායක,
ලේකම්,
ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩ වීදියේ පිහිටි,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 0 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 0 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	රෙදිපිළි සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තය	I වැනි තීරුව	II වැනි තීරුව	
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	රු. 751 0 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,501 0 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
03.	යකඩ බඩු වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	ඉංග්‍රීසි බෙහෙත් බඩු අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ඩිස්පෙන්සරියක් (අපරදිග) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	ගුවන් විදුලි/රූපවාහිනී/කැසට්/පරිගණක/පාපැදි/යතුරුපැදි/මහන මැෂින් අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	අපනයන ද්‍රව්‍ය එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	රෙදි, හම්වලින් බෑග්/භාණ්ඩ නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	පාවහන්/බෑග් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	පොත්පත්/ලිපි ද්‍රව්‍ය අළෙවිසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	පුවත්පත් බෙදාහැරීමේ හා අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	වීඩියෝ චිත්‍රපට පෙන්වන හා වීඩියෝ කැසට්පට පෙන්වන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
16.	නිමි ඇඳුම් නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
17.	විසිතුරු මසුන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	දේශීය හා විදේශීය දුරකථන ඇමතුම් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ඇඳුම් මසන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
20.	හඳුන්කුරු නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	විදුලි උපකරණ අළෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	වැලි ගොඩ දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	බිම්මල් වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	විදේශ රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	අත්කම් භාණ්ඩ නිෂ්පාදනය හා අළෙවිය	500 0	750 0	1,000 0
26.	තරාදි අළෙවිසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	මහන මැෂින් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	ඇස් කණ්නාඩි අළෙවිසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	කායවර්ධන මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
30.	අභ්‍යාස පොත් නිෂ්පාදනය හා අළෙවිය	500 0	750 0	1,000 0
31.	ජ්‍යොතිෂ්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	කොට්ට, ඇඳ ඇතිරිලි, පාපිසි අළෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	මංගල පෝරු කුළියට දීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
34.	අභ්‍යාස පොත් හා ලියුම් කවර නිෂ්පාදනය හා අළෙවිය	500 0	750 0	1,000 0
35.	සැලසුම් ශිල්පියෙකු ලෙස කටයුතු කිරීම	500 0	750 0	1,000 0
36.	ආයුර්වේද බෙහෙත් ශාලාව	500 0	750 0	1,000 0
37.	අන්තර් ජාල සේවා සැපයීම	500 0	750 0	1,000 0
38.	CCTV කැමරා සවි කරන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	පරිගණක ආශ්‍රිත මෝස්තර නිර්මාණය	500 0	750 0	1,000 0
40.	දර අළෙවිය	500 0	750 0	1,000 0
41.	වළං වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	මල්, විසිතුරු පැල, බෝග පැල තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	පිත්තල භාණ්ඩ අළෙවිසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තය	I වැනි තීරුව	II වැනි තීරුව	
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
44.	තහඩුවලින් මිනුම් උපකරණ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
45.	ලී කුඩුවලින් ජීව ඉන්ධන නිපදවීම	500 0	750 0	1,000 0
46.	රබර් පාවහන් නිපදවීම	500 0	750 0	1,000 0
47.	පොල් ලෙලි ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
48.	තිනර් නිෂ්පාදන කර්මාන්ත නිෂ්පාදන	500 0	750 0	1,000 0
49.	ලිහිසි තෙල් අළෙවිය	500 0	750 0	1,000 0
50.	සිල්ලර කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	රෙදිපිළි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	රෙදි මැසීමේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	තේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	සපත්තු සෑදීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	ගිනි පෙට්ටි කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	පානීය ජල නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාර	500 0	750 0	1,000 0
57.	ටයර් ටියුබ් නැවත පිරවීම	500 0	750 0	1,000 0
58.	වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	ධාන්‍ය වර්ග කුළුබඩු ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	ටයර් ගබඩා කිරීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
63.	ඉටිපන්දම් නිෂ්පාදනය හා අළෙවිය	500 0	750 0	1,000 0
64.	ක්ෂණික ඡායාරූප පිටපත් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	ලොතරැයි කුඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	ව්‍යාපාරික කාර්යයන් සඳහා භාණ්ඩ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0

ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින තීරණ අංක 186 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, 2024 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. එල්. ඩී. දසනායක,
ලේකම්,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩ වීදියේ පිහිටි,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

01. කොමිස් ඒජන්තවරු.
02. වෙන්දේසිකරුවන්.
03. බ්‍රෝකර්වරුන්.
04. මුදල් ණයට දෙන්නන්.
05. උකස් බඩු ගන්නන්.
06. කොන්ත්‍රාත්කරුවන්-සිවිල්-ඉදිකිරීම්.
07. සැපයුම්කරුවන්
08. රියැදුරු පුහුණු ආයතන.
09. ලොතරැයි අළෙවි නියෝජිතයන්
10. රක්ෂණ නියෝජිතයින්
11. මෝටර් රථ වාහන වෙළෙඳාම් කරන්නන්.
12. ගණන් පරීක්ෂකවරුන්
13. පෞද්ගලික අධ්‍යාපන පන්ති පවත්වන්නන්
14. ගණකාධිකාරිවරුන්
15. රැකියා ඒජන්සිකරුවන්
16. වෛද්‍යවරුන්
17. නොතාරිස්වරුන්
18. ඇඟළුම් කර්මාන්ත ශාලා
19. මිනින්දෝරුවරුන්
20. සැර බීම ස්ථාන පවත්වාගෙන යන්නන්
21. ආරක්ෂක සේවා සැපයීම
22. ආනයන සහ අපනයනකරුවන්
23. උත්සව ශාලා පවත්වාගෙන යන්නන්
24. පෙර පාසලක් පවත්වාගෙන යාම
25. ජාත්‍යන්තර පාසල් පවත්වාගෙන යාම
26. නීතිඥවරු
27. සමාගමක උප ඒජන්සි මාර්ගයෙන් භාණ්ඩ අළෙවි කරන්නන්
28. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
29. පිරිසිදු කිරීමේ සමාගමක් පවත්වාගෙන යන්නවුන්
30. තුරඟ තරග ඔට්ටු භාර ගැනීමේ ස්ථාන
31. මිනී පෙට්ටි නිපදවීමේ හා අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32. කෘතිම ඇස් පිහාටු සකස් කිරීම - කොණ්ඩා මෝස්තර සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
33. පූජා භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
34. වැලි හා ගොඩනැගිලි ද්‍රව්‍ය අළෙවිය
35. පාවිච්චි කරන ලද වාහන අමතර කොටස් විකිණීම
36. නිවාස සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම
37. යතුරු පැදි අළෙවිය
38. පස් කැපීමේ යන්ත්‍ර කුලියට දීමේ ස්ථාන
39. උත්සව භාණ්ඩ කුලියට දීමේ ස්ථාන
40. ප්‍රවාහන සේවා සැපයීමේ ස්ථාන
41. වාහනවලින් පැමිණ වෙළෙඳාම් කරන්නන්
42. කුඩ කර්මාන්ත ශාලා

43. සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන
44. බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
45. ඉන්ධන පිරවුම් හලක් පවත්වාගෙන යාම
46. විදේශ සේවා සමාගමක් පවත්වාගෙන යාම
47. පෞද්ගලික සාත්තු නිවාස පවත්වාගෙන යාම
48. ස්වර්ණාභාරණ වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
49. ටයර් නැවත පිරවීමේ, විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානය පවත්වාගෙන යාම
50. මෝටර් රථ අමතර කොටස් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
51. අමු තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
52. පරිගණක මුද්‍රණ, ස්ක්‍රීන් මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. අන්තර්ජාල සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
54. ආනයනය කරන ලද වාහන කොටස් අළෙවි කිරීම
55. නාන කාමර කට්ටල අළෙවිය
56. විදේශ චාරිකා සංවිධානය කිරීම

උපලේඛනය

	1 වැනි තීරය	*11 වැනි තීරය*
	බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශත*
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
02.	රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90
03.	රු. 12,001 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180
04.	රු. 18,751 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360
05.	රු. 75,001 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200
06.	රු. 1,50,001 ඉක්මවන අවස්ථාවක	3,000

11-288/4

ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2024 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින තීරණ අංක 187 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව, කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2024 වර්ෂයේ දී ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මතම ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. එල්. ඩී. දසනායක,
ලේකම්,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩ වීදියේ පිහිටි,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවක් යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂය තුළ දී නිකුත් කරන ලද බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන්පොළක් වන විට එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන්පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එක (1%) ක ප්‍රමාණයක බලපත්‍ර ගාස්තු විය යුතු ය.

හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන්පොළ ක්‍රියාත්මක වන පළමු අවුරුද්ද වන අවස්ථාවක II වැනි තීරුවේ නිරූපිත ප්‍රමාණය බලපත්‍ර ගාස්තුව විය යුතු බවට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	එළවළු හෝ පළතුරු කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	බත් කඩයක්/ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	රෙස්ටුරන්ට් එකක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම			
	එළදෙනුන් 05 ට වැඩි 10 ට අඩු	500 0	750 0	1,000 0
	එළදෙනුන් 02 ට වැඩි 05ට අඩු	500 0	750 0	1,000 0
	එළදෙනුන් 10ට වැඩි 25ට අඩු	500 0	750 0	1,000 0
	එළදෙනුන් 25ට වැඩි	500 0	750 0	1,000 0
8.	ගෝ ඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	අනුමත සත්ත්ව මස් වෙළඳ සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	කඩල, රසකැවිලි නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	සංචාරක වෙළඳාම් කිරීම් (අනුමත කරන ලද)	500 0	750 0	1,000 0
13.	මනාල/මනාලියන් හැඩගැන්වීම/ඇන්දවීම/කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	තේ කොළ/මිරිස්/තුනපහ කුඩු පැකට් කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	බේකරි නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	කිරි ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
17.	කිරි ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය	500 0	750 0	1,000 0
18.	ලී බඩු සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ගෘහ භාණ්ඩ අලෙවි සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	කුළුබඩු පැකට් කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	I වැනි තීරුව	II වැනි තීරුව	
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,501 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
21.	ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	දැව ආශ්‍රිත ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අන්තරාදායක ව්‍යාපාර :				
01.	කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	යන්ත්‍රානුසාරයෙන් වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	දර මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	කුකුල් ගොවිපළක කුකුලන් 50ට සිට 1,000 දක්වා	500 0	750 0	1,000 0
	කුකුළන් 1,000ට වැඩි නම් එක් සතෙකුගෙන් රු. 5 බැගින්	500 0	750 0	1,000 0
	එළුවන් 5කට වැඩි ගොවිපලක එළුවන් 5 ක් සහ ඊට වැඩි ඌරන් 1කට වැඩි ගොවිපලක් සඳහා	500 0	750 0	1,000 0
		500 0	750 0	1,000 0
05.	ගරාජයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	වින්කලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	යෝගට්/අයිස්ක්‍රීම් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	අනුමත කරන ලද මස් හෝ මාළු ශීතකරණවල බහා අළෙවි කිරීම	500 0	750 0	1,000 0
11.	වැලි/බොරළු/කළුගල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	පොල් තෙල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	වාහන සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	මාළු වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
16.	දැව ගබඩාකර තැබීම	500 0	750 0	1,000 0
17.	පරණ ලෝහ/අළුත් ලෝහ ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
18.	වායුසමන යන්ත්‍ර/ශීතකරණ/අධිශීතකරණ නිපදවීම/සර්විස් කිරීම	500 0	750 0	1,000 0
19.	උළු, ගඩොල් ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
20.	ත්‍රී රෝද රථ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
21.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	රෙදි වියන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	අත් යන්ත්‍ර මගින් රෙදි වියන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	රෙදි/හම්වලින් බෑග්/භාණ්ඩ නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	පින්තූර රාමු කිරීම/බෝඩ් ඇඳීම/පින්තාරු කිරීම ආදී ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	සබන්, සුවඳ විලවුන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	සිමෙන්ති ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ජීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :				
01.	හුණු පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	භූමිතෙල්/පැට්‍රල්/ඩීසල් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	II වැනි තීරුව	
අනු. අංකය	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 751 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,501 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
04.	ගුවන් විදුලි /රූපවාහිනී/පරිගණක යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ උණු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	කෘත්‍රිම පොහොර/කෘමිනාශක/බෙහෙත් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	ගල්වලවල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ගල් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ඔරලෝසු/ජංගම දුරකථන/විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ඇලුමිනියම්/බෙලෙක් භාණ්ඩ නිපදවීම හා අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	රන්, රිදී බඩු වර්ග වර්ණ ආලේප කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ගෑස් වර්ග ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
14.	පොහොර ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	රසායනික ද්‍රව්‍ය නිපදවීම/ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	විෂබීජනාශක ද්‍රව්‍ය නිපදවීම	500 0	750 0	1,000 0
17.	ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම	500 0	750 0	1,000 0

11 - 288/5

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින තීරණ අංක 188 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. එල්. ඩී. දසනායක,
ලේකම්,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩ වීදියේ පිහිටි,
ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පිහිටියා වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු, ඔහුගේ සේවකයකු හෝ

අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍ය ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලද මුදලෙන් 1% ක සමාන බද්දක්, 2024 වර්ෂයට පනවා අය කිරීමටත්,

එකී බදු මුදල විකුණුම්කරු විසින් හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් එම ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් ගෙවිය යුතු බවට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

11 - 288/6

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 118 වැනි වගන්තිය ප්‍රකාරව, සහ මෙම සභාව විසින් පිළිගත් පොදු සම්මත අතුරු ව්‍යවස්ථාවේ 34 වන අතුරු ව්‍යවස්ථාව අනුව ජල ගාස්තු අය කිරීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින තීරණ අංක 189 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. එල්. ඩී. දසනායක,
ලේකම්,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩ වීදියේ පිහිටි,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 118 වැනි වගන්තිය ප්‍රකාරව, සහ මෙම සභාව විසින් පිළිගත් පොදු සම්මත අතුරු ව්‍යවස්ථාවේ 34 වන අතුරු ව්‍යවස්ථාව අනුව පහත සඳහන් පරිදි 2024 වර්ෂය සඳහා ජල ගාස්තු අය කිරීමට ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

1. ගුරුත්ව ජල සේවාවලින් ඇති ජල සැපයුම් සඳහා ගාස්තු අය කිරීම - මසකට ගාස්තුව රු. 500 0
2. ලැන්ටන්හිල් ප්‍රදේශයේ ජල සැපයුම් සඳහා ගාස්තු අය කිරීම - මසකට ගාස්තුව රු. 500 0

3. *ජල මීටර් ඇති ජල සේවාවන් සඳහා ගාස්තු අය කිරීම* :

(i) ගෘහ/පාසල්/ආගමික ස්ථාන/රජයේ නිවාස/ පෙර පාසල් - සෑම ජල සේවාවක් සඳහා රු. 250 ක මාසික ස්ථාවර ගාස්තුවක් ගෙවිය යුතු ය.

	රු. ශත
ඒකක 0 සිට ඒකක 10 දක්වා ඒකකයක්	25 0
ඒකක 11 සිට ඒකක 20 දක්වා ඒකකයක්	35 0
ඒකක 21 ට වැඩි වන විට ඒකකයක්	45 0
60 ට වැඩි වන විට ඒකකයක්	100 0

(ii) *වාණිජ ආයතනය/රජයේ ආයතන :*

මාසික ස්ථාවර ජල ගාස්තුව	350 0
සෑම ඒකකයක් සඳහා ම	75 0

(iii) *කාර්මික ආයතන/ඉදිකිරීම් වැඩ භූමි :*

මාසික ස්ථාවර ජල ගාස්තුව	350 0
සෑම ඒකකයක් සඳහා ම	75 0

		රු. ශත
(iv)	ජල මීටර් සවිකොට ජලය සපයන ජලනළ ක්‍රමයක් ඔස්සේ ජල මීටර් සවිකරවාගෙන නොමැති ජල සැපයුමක් සඳහා මසකට ජල ගාස්තුව	750 0
(v)	ජලනළ විසන්ධි කර ඇති අවස්ථාවක නැවත සන්ධි කිරීම සඳහා ගාස්තු	2,000 0

(vi) *ජලනල එලීම සඳහා මාර්ග පළුදු කිරීමේ ගාස්තු :*

ජලනල එලීම සඳහා පළුදු කිරීම - දූනට අය කරනු ලබන මුදල් :

			රු. ශත
01.	පස් පාරක් කැණීමට පළල අඩි 2ක් හා දික් අඩි 1කට	-	500 0
02.	තාර පාරක් හරහා පළල අඩි 2ක් හා දික් අඩි 1කට	-	1,500 0
03.	කොන්ක්‍රීට් මාර්ගයක පළල අඩි 2ක් හා දික් අඩි 1කට	-	1,000 0
04.	මාර්ග උරහිස පළුදු කිරීම 2" x 2" වළක් සඳහා	-	2,000 0
05.	පස් පාරක් මාර්ග උරහිස දිගේ කැණීමට අඩි 25ක් දක්වා වැඩිවන අඩියකට	-	5,000 0 10 බැගින්
06.	කැටගල් සහිත මාර්ගයක පළල අඩි 2ක් හා දික් අඩි 1කට	-	1,500 0
07.	කාපට් පාරක් කැණීමට පළල අඩි 2ක් හා දික් අඩි 1කට	-	7,500 0

11 - 288/7

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා දැන්වීම් පුවරු සඳහා ගාස්තු පැනවීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින තීරණ අංක 190 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. එල්. ඩී. දසනායක,
ලේකම්,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩ වීදියේ පිහිටි,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව හා 2016.02.23 වැනි දිනැති අංක 1955/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019.03.15 දිනැති අංක 2115 දරන *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසෙන් වැළඳගෙන ඇති ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2024.01.01 වැනි දින සිට අයකිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

		රු. ශත
01.	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට	100 0
02.	ලෑල්ලක් හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට	75 0
03.	බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක ප්‍රදර්ශනය කරනු ලබන විදුලි ආලෝක සහිත ප්‍රචාරක දැන්වීමක් සඳහා	100 0

		රු. ශත
04.	ව්‍යාපාරික ස්ථාන අනුබද්ධිතව ප්‍රචාරණය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා වර්ග අඩියකට	85 0
05.	රෙදිවලින් අදිනු ලබන ඩිජිටල් ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට	100 0

11 - 288/8

ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පැනවීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින තීරණ අංක 191 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. එල්. ඩී. දසනායක,
ලේකම්,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩ වීදියේ පිහිටි,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ සඳහන් වෙනත් ගාස්තු 2024 වර්ෂයට අය කිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

	පෝරම හා වෙනත් ගාස්තු	*රු. ශත*
01.	ගොඩනැගිලි සැලසුම අනුමත කර ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් සඳහා	1,250 0
02.	විදුලි යෝග්‍යතා සහතිකයක් නිකුත් කිරීම :	
	නිවසක් සඳහා	500 0
	ව්‍යාපාරික ස්ථානයක් සඳහා	750 0
03.	කර්මාන්ත ගිවිසුම් පත්‍රයක් සඳහා ගාස්තු	250 0
04.	කර්මාන්ත කොන්ත්‍රාත් සමිති ලියාපදිංචි කිරීමේ ගාස්තු	3,000 0
05.	පරිසර ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත්‍රයක් සඳහා ගාස්තු	1,000 0
06.	වීථිරේඛා සහතිකය, නොපවරා ගැනීමේ සහතිකය, ගොඩනැගිලි සීමා පිළිබඳ සහතිකය සඳහා ගාස්තු	3,000 0
07.	පුස්තකාල සාමාජිකත්වය සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තු	25 0
08.	පුස්තකාල සාමාජික ගාස්තු - වැඩිහිටි සඳහා	100 0
	- ළමා සඳහා	50 0
09.	පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීම සඳහා ගාස්තු (අවු. 2 කට වතාවක්)	
	- වැඩිහිටි සඳහා	50 0
	- ළමා සඳහා	25 0
	පුස්තකාල ප්‍රමාද ගාස්තු දිනකට එක් පොතක් සඳහා	10 0
10.	පාපැදි බලපත්‍ර අයදුම්පත් ගාස්තු සඳහා	46 0
11.	දැව කඳන් ප්‍රවාහනය කිරීමේ ගාස්තු (එක් ප්‍රවාහන වාරයක් සඳහා)	5,000 0
12.	සභාව සතු දේපළ, භූමි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ලබාදීමේ දී දිනකට	5,000 0
13.	උත්සවයක් සඳහා සතුන් මැරීම - එක් ගවයෙක් / එක් එළුවෙක් වෙනුවෙන්	3,000 0

14.	ව්‍යාපාර බදු හා වෙළෙඳ බලපත්‍ර අයදුම් පත්‍ර	350 0
15.	නිකුත් කර ඇති ව්‍යාපාර හා වෙළඳ බලපත්‍රයක් නැවත සංශෝධනය කිරීම සඳහා ගාස්තු	500 0
16.	අනතුරුදායක හා අවහිර ගස් අයදුම්පත්‍ර හා පරීක්ෂණ ගාස්තු	1,000 0
17.	ඇත්ගාල හා කුරුඳුවත්ත ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලා කුළියට ලබාදීම දිනකට -	
	(i) ස්වේච්ඡා කටයුතු සඳහා	3,500 0
	(ii) වෙනත් කටයුතු සඳහා	5,500 0
18.	ත්‍රීරෝද රථ ස්ටිකර් ගාස්තු	100 0
19.	පෝස්ටර්, බැනර් ඉවත් කිරීමේ ගාස්තු	500 0
20.	පුටු එකක් කුළියට දීම - දිනකට	25 0
21.	කොඩි කණු එකක් කුළියට දීම - දිනකට	150 0
22.	කුරුඳුවත්ත ක්‍රීඩා පිටිය කුළියට දීම - දිනකට :	
	i. තණනිල්ල සඳහා වන බුමුතුරුණුව රහිතව,	
	a. ක්‍රීඩා පිටිය පමණක් භාවිතා කරයි නම්	10,000 0
	b. ක්‍රීඩා පිටිය සමග නැරඹුම් මධ්‍යස්ථානය භාවිත කරයි නම්	17,500 0
	ii. තණනිල්ල සඳහා වන බුමුතුරුණුව සමග,	
	a. ක්‍රීඩා පිටිය පමණක් භාවිතා කරයි නම්	12,500 0
	b. ක්‍රීඩා පිටිය සමග නැරඹුම් මධ්‍යස්ථානය භාවිත කරයි නම්	20,000 0
23.	ඇත්ගාල ක්‍රීඩා පිටිය කුලියට දීම - දිනකට :	
	i. ක්‍රීඩා පිටිය පමණක් භාවිතා කරයි නම්	7,500 0
	ii. ක්‍රීඩා පිටිය සමග නැරඹුම් මධ්‍යස්ථානය භාවිත කරයි නම්	12,500 0
	iii.පෙර පාසල් සහ ප්‍රාථමික පාසල් සඳහා පමණක් ක්‍රීඩාගාරය භාවිතා කරයි නම්	4,000 0
24.	ජල බවුසරය කුලියට දීම - මූලික ගාස්තුව	6,500 0
	එක් වරකට බවුසරය පැය 4ක් තුළ රඳවා ගැනීමේ ගාස්තුව	3,500 0
	එක් වරකට බවුසරය පැය 6ක් තුළ රඳවා ගැනීමේ ගාස්තුව	5,000 0
	පැය 6 සිට වැඩිවන සෑම පැයක් සඳහා බවුසරය රඳවා ගැනීමේ ගාස්තුව	500 0
	කිලෝමීටර් 1ක් ගමන් කිරීම සඳහා	1,340 0
25.	සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීම	7,500 0
26.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,500 0
27.	ජල සම්බන්ධතා අයදුම්පත්‍ර ගාස්තුව	500 0
28.	ඔප්පු සාරාංශ අයදුම්පත්‍ර	1,000 0
29.	ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීමේ සංවර්ධන බලපත්‍ර ඡායාපිටපතක් සඳහා	1,000 0
30.	කායවර්ධන මධ්‍යස්ථානයේ මාසික සාමාජික ගාස්තුව	1,000 0
31.	සති පොළ පරිශ්‍රය භාවිතය එක් දිනක් සඳහා	100 0
32.	ඊ නැණ පියස පරිගණක පාඨමාලාව සය මාසික	6,000 0
	ත්‍රෛයිමාසික	3,000 0
33.	මැහුම් පාඨමාලාව සාමාජික ගාස්තු	250 0
34.	ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයෙන් නිපදවනු ලබන කාබනික පොහොර වෙළඳපල පවතින මිල අනුව අලෙවි කිරීම	
35.	ගොඩනැගිලි ඉදිකිරීම්/විශේෂ ව්‍යාපෘති හා ඉඩම් අනු බෙදීම් කිරීමේ දී ගාස්තු පැනවීම	

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*භාවිතා කළ යුතු ආකෘති පත්‍රය*	*අයකළ යුතු ගාස්තු රු. ශත*

1. ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම හා අනුමත කිරීමේ ගාස්තු :

(i)	නේවාසික සඳහා - ව. අ. 500ට අඩු නම් ව. අ. 1කට	5 0	බැගින්
	ව. අ. 500ට වැඩි නම් ව. අ. එකක් සඳහා	7 50	බැගින්

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*භාවිතා කළ යුතු ආකෘති පත්‍රය*	*අයකළ යුතු ගාස්තු රු. ශත*
(ii) ව්‍යාපාරික කාර්යක් සඳහා - ව. අ. 500ට ඩු නම් ව. අ. 1ක් සඳහා		15 0 බැගින්
ව. අ. 500ට වැඩි නම් ව. අ. 1ක් සඳහා		17 0 බැගින්
(iii) ගොඩනැගිල්ලක් ඉදිකිරීම දීර්ඝ කිරීමේ ගාස්තු - අවු. 01 ක් සඳහා		3,000 0

පෙරසැරි ගාස්තු

2. සංවර්ධන අවසරපත්‍ර නිකුත් කිරීම :

ඉඩම් අනු කොටස්වලට බෙදීම "අ"

1. බිම් කට්ටිය ප්‍රමාණය	*එක් බිම් කට්ටියකට අයකළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම්කොටස් හැර)*
පර්චස් 6-12	රු. 750 0
පර්චස් 13-24	රු. 1,200 0
පර්චස් 25-40	රු. 1,500 0
පර්චස් 41-160	රු. 7,500 0
අක්කර 1-5	රු. 10,000 0
අක්කර 6-10	රු. 12,500 0
අක්කර 11-15	රු.15,000 0
අක්කර 16-20	රු. 30,000 0
අක්කර 21ට වැඩි	රු. 45,000 0

3. මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය - විශේෂ ව්‍යාපෘති/විශාල ප්‍රමාණයේ ඉඩම් කට්ටි කිරීම්

අක්කර 1-5ත් අතර	රු. 20,000 0
අක්කර 6-10ත් අතර	රු. 22,500 0
අක්කර 10ට වැඩි	රු. 35,000 0

1. ඉඩම් අනුබෙදුම් සඳහා	''ඇ" (1) පර්චස් 40ට අඩු ඉඩම් සඳහා	රු. 3,500 0
පර්චස් 40-200 දක්වා		රු. 12,500 0
පර්චස් 201-400 දක්වා		රු. 15,000 0
පර්චස් 400ට වැඩි		රු. 25,000 0

1. විශේෂ සංවර්ධන ව්‍යාපෘති 01 ක් සඳහා
දුරකථන කුළුණු/කුඩා විදුලිබලාගාර හා වෙනත් රු. 40,000 0

අනුකූලතා සහතික ප්‍රදානය කිරීමේ ගාස්තු :

4. අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදිකිරීමක්/සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතික ලබා ගත යුතු ය.)

I. ඉඩම් අනු බෙදුම් පළමු බිම් කොටසට රු. 1,500 ක් සහ ඊට වැඩි වන සෑම බිම් කට්ටියකටම රු. 1,000 0 බැගින්,

II.	නේවාසික ගොඩනැගිලි අනුකූලතා	වර්ග මීටර් 100ක් සඳහා රු. 2,000.00 බැගින් සහ ඊට වැඩිවන සෑම වර්ගමීටර් සහතිකයක් සඳහා 1කට රු. 25 0 බැගින්
III.	වාණිජ හා වෙනත් ඉදිකිරීම්	ව.මී. 100ට අඩු රු. 6,500ක් සහ ඊට වැඩිවන සෑම වර්ග මීටර් 1 කට රු. 25.00 බැගින්
IV.	මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම	පළමු දික් මීටර් 100 සඳහා රු. 5,000.00 ක් සහ ඊට වැඩි වන සෑම මීටර් 1කටම රු. 50.00 බැගින්,
V.	ඉඩම්/කුඹුරු ගොඩ කිරීම	ව. මී. 150ට අඩු රු. 15,000.00 ක් සහ ඊට වැඩි වන සෑම ව. මී. 1 කට රු. 150.00 බැගින්,
VI.	විශේෂ ව්‍යාපෘති	කුඩා පරිමාණ සඳහා රු. 7,500 0 මධ්‍ය පරිමාණ රු. 15,000 0 මහා පරිමාණ රු. 50,000 0

අනවසර ඉදිකිරීම් ආවරණ අනුමැති ගාස්තු

ඉදිකිරීම් ආදියර

5. නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම/ කොටස් එකතු කිරීම/නැවත ඉදිකිරීම		*නේවාසික ව. අඩි 1ක් සඳහා ගාස්තු*	*වාණිජ හා වෙනත් ව. අඩි 1ක් සඳහා ගාස්තු*
		රු. ශත	*රු. ශත*
පළමු මහල	අත්තිවාරම් වැඩ පමණක් (කයිරු මට්ටම)	6 0	15 0
	ජනෙල් මට්ටම දක්වා	7 0	17 50
	වහල මට්ටම දක්වා	8 0	20 0
	සම්පූර්ණකොට ඇති විට	10 0	25 0
ඉහළ මහල්	ජනෙල් මට්ටම දක්වා	13 0	31 0
	වහල මට්ටම දක්වා	14 0	35 0
	සම්පූර්ණකොට ඇති විට	15 0	60 0
		දික් අඩි 1කට	දික් අඩි 1කට
	තාප්ප ඉදිකිරීමේ දී (වර්ග අඩි 1කට රු. 5.00 බැගින්)	25 0	25 0
	සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු		(5%)

ඉඩම්/කුඹුරු ඉඩම් ගොඩ කිරීම සඳහා	සෑම වර්ග මීටර් 150කට රු. 10,000.00 බැගින්
විශේෂ සංවර්ධන ව්‍යාපෘති	සෑම මිලියන 05 කටම රු. 20,000.00 බැගින්
දුරකතන කුළුණු/විදුලි සංදේශ කුළුණු සඳහා	උස සෑම මීටර් 5කට රු. 30,000.00 බැගින්

6.	I. අනුකූලතා සහතික නොමැතිව පදිංචි වීම, භාවිත කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම (නේවාසික/සුළු වාණිජ)	රු. 4,000 0
	II. අනුකූලතා සහතිකය නොමැති විශේෂ ව්‍යාපෘති ආදායම් ඉපදවීම/ඉඩම් කට්ටි කර විකිණීම	රු. 20,000 0

විශේෂ ව්‍යාපෘති	*මිලියන 05 සිට 10 දක්වා රු. ශත*
I. රුපියල් මිලියනය දක්වා වූ ඉදි කිරීම් (කුඩා පරිමාණ)	12,000 0
II. රුපියල් මිලියන 01 සිට 10 දක්වා (මධ්‍යම පරිමාණ)	17,500 0
III. රුපියල් මිලියන 10ට වැඩි (මහා පරිමාණ)	350,000 0

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත ලබාදීම සඳහා ගාස්තු අය කිරීම

උක්ත පනතින් නියම කර ඇති විධිවිධාන අනුව තොරතුරු ලබාදීම සඳහා පහත පරිදි ගාස්තු අය කරනු ලැබේ :-

I. ඡායා පිටපත් ගැනීම :

(අ) A 4 (සෙ.මී. 21x සෙ.මී. 29.7) කඩදාසියක හෝ ඊට වඩා කුඩා ප්‍රමාණයේ කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු. 2 0 ක් සහ එකම කොළයේ දෙපැත්ත රු. 4 0 ක් වේ.

(ආ) ලීගල් ප්‍රමාණයේ (සෙ.මී. 21.59 x සෙ.මී. 35.56) කඩදාසියක සහ A3 ප්‍රමාණයේ (සෙ.මී. 29.7 x සෙ.මී. 42) කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු. 4 0 සහ එකම කොළයේ දෙපැත්ත රු. 8 0ක් වේ.

(ඇ) ඉහත සඳහන් කළ ප්‍රමාණයට වඩා විශාල කඩදාසියක සපයනු ලබන තොරතුරක් සඳහා සැබෑ වියදම අය කෙරේ.

II. මුද්‍රිත පිටපත් ලබාගැනීම :

(අ) A 4 (සෙ.මී. 21 x සෙ.මී. 29.7) කඩදාසියක හෝ ඊට වඩා කුඩා ප්‍රමාණයේ කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු. 4 0 සහ එකම කොළයේ දෙපැත්ත රු. 8 0ක් වේ.

(ආ) ලීගල් ප්‍රමාණයේ (සෙ.මී. 21.59 x සෙ.මී. 35.56) කඩදාසියක සහ A3 (සෙ.මී. 29.7 x සෙ.මී. 42) කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු. 4 0 සහ එකම කොළයේ දෙපැත්ත රු. 8 0ක් වේ.

(ඇ) ඉහත සඳහන් කළ ප්‍රමාණයට වඩා විශාල කඩදාසියක සපයනු ලබන තොරතුරක් සඳහා සැබෑ වියදම අය කෙරේ.

III. තොරතුරු ඉල්ලීම සිදුකරනු ලබන පුරවැසියා විසින් සපයනු ලබන ඩිස්කට්ටුවක් (Diskette), සංයුක්ත තැටියක් (compact disc) යූඑස්බී දත්ත පරිවාහකයක් (USB mass drive) හෝ එබඳු වෙනත් ඉලෙක්ට්‍රොනික උපාංගයක් වෙත තොරතුරු පිටපත් කරදීම පිණිස මේ එක් එක් අයිතමයක් සඳහා රු. 20.00 බැගින් අය කෙරේ.

IV. පොදු අධිකාරිය විසින් සපයනු ලබන ඩිස්කට්ටුවක් (Diskette), සංයුක්ත තැටියක් (compact disc), යූඑස්බී දත්ත පරිවාහකයක් (USB mass drive) හෝ එබඳු වෙනත් ඉලෙක්ට්‍රොනික උපාංගයක් වෙත පිටපත්කර දීම සඳහා සැබෑ වියදම අය කෙරේ.

V. යම්කිසි ලියවිල්ලක් හෝ විෂයයක් පරීක්ෂා කරන්නේ නම් හෝ අධ්‍යයනය කරන්නේ නම් හෝ ඉදිකිරීම් ක්ෂේත්‍රයක් පරීක්ෂාවකට ලක් කරන්නේ නම් පැයකට රු. 50.0 බැගින් අය කෙරෙනු ලබන අතර,

එකී අධ්‍යයනය/පරීක්ෂාව සඳහා පැයකට වඩා වැඩි කාලයක් ගතවන්නේ නම් පළමු පැය සඳහා ගාස්තු අය නොකෙරේ. මෙය සිදුකරනුයේ නොමිලේ එබඳු පරීක්ෂාවක් සිදු කිරීමට ඉඩ සැලසූ පොදු අධිකාරීන්ගේ එකී භාවිතයට අගතියක් නොවන පරිදිය. තව ද, එකී පොදු අධිකාරින්ගේ එකී භාවිතය මෙම උප රීතිය තිබියදී වුවද එසේම පවතිනු ඇත.

VI. නියැදි (සාම්පල) හෝ ආකෘති (මොඩල) සඳහා සත්‍ය වියදම අය කෙරෙනු ඇත.

VII. ඊ මේල් (විද්‍යුත් තැපෑල) මගින් සපයනු ලබන තොරතුරු සඳහා ගාස්තු අය නොකෙරේ.

දුරකථන කුළුණු සහ පාලම් සඳහා ගාස්තු පැනවීම

දුරකථන කුළුණු/ඇන්ටෙනා කුළුණු/විදුලි සංදේශ කුළුණු/පාලම් ඉදිකිරීම සඳහා ගාස්තු අයකිරීම :

1. සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා	-	උස මීටර් 5-20 දක්වා රු, 10,000 0 ක් සහ වැඩිවන එකකට රු. 300 0 බැගින්
2. අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා	-	උස මීටර් 5-20 දක්වා රු. 10,000 0 ක් සහ වැඩිවන සෑම මීටර් එකකට රු. 350 0 බැගින්
3. ස්ථාපිත කර ඇති දුරකථන කුළුණු/ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම/විදුලි සංදේශ කුළුණු සඳහා වාර්ෂිකව ව්‍යාපාර බදු ගාස්තුව	-	රු. 3,000 0
4. පාලම් සැකසීමේ දී වර්ග අඩියක් සඳහා	-	රු. 75 0 බැගින්
5. දුරකථන රැහැන් ඇදීමට අනුමැතිය ලබා දීම සඳහා එක් කොන්ක්‍රීට් කුළුණක් සඳහා	-	රු. 1,500 0

11 - 288/9

ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින තීරණ අංක 192 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2024 වර්ෂය සඳහා වන මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. එල්. ඩී. දසනායක,
ලේකම්,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩ වීදියේ පිහිටි,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තකු මත ම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* රු. ශත
(i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීප් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා -	25 0
(ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
(අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්,	25 0
(ආ) වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0

	I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
(iv)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi)	සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
(vii)	සෑම අලියෙකු හෝ ඇතෙකු සඳහා	50 0

(2) විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

11 - 288/10

ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන නවතා තැබීම සඳහා ගාස්තු පැනවීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින පවත්වන ලද තීරණ අංක 193 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. එල්. ඩී. දසනායක,
ලේකම්,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩ වීදියේ පිහිටි,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 2016.02.23 වැනි දිනැති අංක 1955/7 දරන පළාත් පාලන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ ප්‍රකාශයට පත්කරන ලදුව ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019.03.15 දිනැති අංක 2115 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසෙන් වැළඳගෙන ඇති කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ කුලී රථ වාහන නවතා තැබීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2024.01.01 වැනි දින සිට අය කිරීමට ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

		එක් වරක් පමණක් ගෙවිය යුතු ලියාපදිංචි ගාස්තු *රු. ශත*	*වාර්ෂික බලපත්‍ර ගාස්තු ප්‍රමාණය* *රු. ශත*
01.	ලොරියක් සඳහා	6,000 0	6,000 0
02.	වෑන් රථයක් සඳහා	6,000 0	3,600 0
03.	ට්‍රේලරයක් සහිත ට්‍රැක්ටරයක් සඳහා	6,000 0	3,600 0
04.	කාර් එකක් සඳහා	6,000 0	3,600 0
05.	අත් ට්‍රැක්ටරයක් සඳහා	6,000 0	3,600 0
06.	ත්‍රී රෝද රථයක් සඳහා	6,000 0	3,600 0

11 - 288/11

ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින තීරණ අංක 194 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. එල්. ඩී. දසනායක,
ලේකම්,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩ වීදියේ පිහිටි,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් ; හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටෙක, හෝ

(ඇ) සැබවින්ම ගොඩනැගිලිවලින් ආවරණය වූ ඒ ඉඩමේ බිම් ප්‍රමාණය, ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණයට නියමිත සමානුපාතයට වඩා අඩු සමානුපාතයක් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නා වූ හෝ ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති, බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 10%ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත, 2024 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට එක (1%) ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යැයි ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

11 - 288/12

ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඝන අපද්‍රව්‍ය බැහැර කරනු ලබන ස්ථාන සඳහා ගාස්තු පැනවීම

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වැනි දින තීරණ අංක 195 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. එල්. ඩී. දසනායක,
ලේකම්,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩ වීදියේ පිහිටි,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

49. යාන්ත්‍රික බලය පාවිච්චියට නොගෙන, විද්‍යුත් ලෝහාලේපනය කිරීම, ක්‍රෝමියම් ආලේපය කිරීම, රන් ආලේපනය කිරීම, රිදී ආලේපනය කිරීම හෝ තඹ ආලේපනය කිරීම කරන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම.
50. යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් විද්‍යුත් ලෝහාලේපනය කරන, ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
51. මෝටර් වාහන අළුත්වැඩියා කරන ගරාජ සහ ආර්ක් වෙල්ඩින් වැඩ.
52. කවර හෝ වර්ගයක උපකරණයක් ක්‍රියාකරවීම සඳහා විදුලි බලය හෝ යාන්ත්‍රික බලය භාවිතා කෙරෙන යම් ස්ථානයක්.
53. කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් ඕනෑම වර්ගයක ප්ලාස්ටික් බඩු තබා ගැනීම.
54. සියලුම වර්ගයේ ප්ලාස්ටික් බඩු නිෂ්පාදනය.
55. කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් කවර හෝ වර්ගයක පොලිතීන් බඩු තබා ගැනීම.
56. සියලුම වර්ගවල පොලිතීන් බඩු නිෂ්පාදනය.
57. කොහු නිෂ්පාදනය හා තබා ගැනීම.
58. කිලෝග්‍රෑම් 1000ට වැඩියෙන් තේ කොළ තබා ගැනීම.
59. කිලෝග්‍රෑම් 250ට වැඩියෙන් කඩදාසි හා/හෝ කවර වර්ගයක කඩදාසි බඩු ගබඩා කිරීම.
60. ඇඟලුම් නිෂ්පාදනය.
61. බත් කඩ.
62. රසායන ද්‍රව්‍ය.
63. කිලෝග්‍රෑම් 50ට වැඩි සියලුම වර්ගවල ගිණිකෙළි භාණ්ඩ තබා ගැනීම.
64. කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් එල්. පී. ජී. (LPG) සිලින්ඩර් ගබඩා කිරීම.
65. හිස්වැසුම් හෝ තොප්පි නිෂ්පාදනය කිරීම.
66. කිලෝග්‍රෑම් 100ට වැඩියෙන් රබර් බඩු (සියලු වර්ගවල) ගබඩා කිරීම.
67. කිලෝග්‍රෑම් 250ට වැඩියෙන් කපාපු පොල් ගබඩා කිරීම.
68. කිලෝග්‍රෑම් 250ට වැඩියෙන් රබර් ඇට ගබඩා කිරීම.
69. ලීටර් 91ට වැඩියෙන් ඇසිඩ් ගබඩා කිරීමේ ස්ථාන.
70. එක් වරකට සේවා නියුක්තයන් 25ට වැඩියෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් කර්මාන්ත ශාලාවක්.
71. ඛනිජ තෙල්, ගෑස් ඇතුළුව ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම.
72. පතරොම් සහ වෙඩි බෙහෙත්.

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළව අක්කර බදු සම්බන්ධයෙන් පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන සෑම කාර්තුවක් තුළ සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2024 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, මාර්තු 31 වැනි දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ද,

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 146(1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමක ම 2023 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය 2024 වර්ෂයේ සත්‍යාක්ෂණය ලෙස ද පිළිගැනීමට ද,

(ආ) හෙක්ටයාර් 5ක් හෝ ඊට වැඩි සෑම ඉඩමක් වෙනුවෙන් එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මත ම 2023 වර්ෂය සඳහා රු. 10.00 ක් බැගින් වන වාර්ෂික බද්දක් පනවා අය කළ යුතු යැයි ද,

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී බද්ද, 2024 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන සෑම කාර්තුවකට ම සමාන වාරික හතරකින් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස නියම කිරීමට ද, බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

11-372/1

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව ව්‍යාපාර බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළව ව්‍යාපාර බද්ද සම්බන්ධයෙන් පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, 2024 මාර්තු මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

යෝජනාව

(*අ*) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් ව්‍යාපාර බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරයේ 2024 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

(*ආ*) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බද්දට යටත්වන සෑම තැනැත්තෙකු විසින්ම යථෝක්ත බද්ද 2024 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II තීරුව*
බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*රු. ශත*
01. රු. 6,000 නොඉක්මවන විට	කිසිවක් නොමැත
02. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
03. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
05. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
06. රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

වෘත්තීන් හා වෙළෙඳ ව්‍යාපාර :

1. කොන්ත්‍රාත්කරුවන්
2. මුදල් ආයෝජකයින්
3. මුදල් ණයට දෙන්නන් හා සපයන්නන්
4. උකස් බඩු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම
5. මුල්‍ය සමාගමක් හෝ ආයතනයක් පවත්වාගෙන යාම
6. රක්ෂණ සමාගමක් පවත්වාගෙන යාම
7. ප්‍රවාහන සේවා සැපයුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
8. වෙන්දේසිකරුවන් ලෙස කටයුතු කිරීම
9. තැරැව්කරුවන් ලෙස කටයුතු කිරීම
10. කොමිස් නියෝජිතයින් ලෙස කටයුතු කිරීම
11. කාර්මික භාණ්ඩ නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම

12. ප්‍රසිද්ධ නොතාරිස් හා නීතිඥයන්
13. මැණික් වෙළෙඳුන්
14. පින්තාරු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
15. මුදල් අයකරන පුද්ගලික ආයතනයක් පවත්වාගෙන යාම
16. පෞද්ගලික වෛද්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
17. අවමංගල කටයුතු හා උපකරණ සපයන ආයතනයක් පවත්වාගෙන යාම
18. මත්පැන් අළෙවි කිරීම හා මත්පැන් ආපනශාලාවක් පවත්වාගෙන යාම (රෙස්ටුරන්ට්)
19. නිවාස සැලසුම්, ඉඩම් විකිණීම්, ගොඩනැගිලි ඉදිකරන ආයතනයක් පවත්වාගෙන යාම
20. දුරකතන සම්ප්‍රේෂණ කුළුණක් හෝ විකර්ශනාගාරයක් පවත්වාගෙන යාම
21. මෝටර් රථ හා මෝටර් සයිකල් පාපැදි අළෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
22. බෙදාහැරීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
23. බලයලත් මිනින්දෝරු හා තක්සේරුකරුවන් ලෙස ආයතනයක් පවත්වාගෙන යාම
24. රේස් ඔට්ටුහලක් පවත්වාගෙන යාම
25. ඉන්ධන සැපයුම් මධ්‍යස්ථානයක් හෝ ආයතනයක් පවත්වාගෙන යාම
26. පුද්ගලික සේවාවන් සපයන ආයතනයක් පවත්වාගෙන යාම (ආරක්ෂක / පවිත්‍රතා/උපස්ථායක /වෙනත්)
27. තාවකාලික ජංගම කුටි වෙනත් ප්‍රචාරක වෙළඳසැල් පවත්වාගෙන යාම
28. රියදුරු පාසලක් පවත්වාගෙන යාම
29. ලිහිසි තෙල් තොග හෝ සිල්ලර බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
30. විදේශ රැකියා ආයතනයක් පවත්වාගෙන යාම
31. විදේශ සංචාරකයින් ගෙන්වීම සහ ප්‍රවාහන කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
32. විදේශ සංචාර සඳහා ගුවන් යානා ටිකට් පත් වෙන් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
33. පරිගණක පන්ති පැවැත්වීමේ ආයතනයක් පවත්වාගෙන යාම
34. රත්තරන් බඩු අළෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
35. ලොතරැයි අළෙවි කුටි පවත්වාගෙන යාම
36. නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37. පැළ තවාන් හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38. නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
39. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
40. ලොතරැයි අළෙවි නියෝජිතායතනයක් පවත්වාගෙන යාම
41. සමාජ ශාලාවක් පවත්වාගෙන යාම
42. කුරියර් සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
43. ගල්, වැලි අළෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
44. ලී හෝ යකඩ භාණ්ඩ බෙදාහැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
45. මහන මැෂින් පහකට වඩා වැඩියෙන් යොදවා ඇඟලුම් ශාලාවක් පවත්වාගෙන යාම
46. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
47. කොම්යුනිකේෂන් එකක් පවත්වාගෙන යාම
48. පාසල් පොත් හා ලිපිද්‍රව්‍ය අළෙවි කරන හා බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. සාප්පු බඩු හා විසිතුරු බඩු අළෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
50. ප්ලාස්ටික් බඩු අළෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
51. ඇස් කණ්නාඩි සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. ගෑස් අළෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
53. සීඩී තැටි කුළියටදීමේ හා අළෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
54. උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. වාහන අමතර කොටස් අළෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම

56. ක්‍රීඩා භාණ්ඩ අළෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
57. අන්තර්ජාල පහසුකම් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. සෙරමික් භාණ්ඩ අළෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
59. ගීත පටිගත කරන ස්ථානයක් පවත්වාගෙන යාම
60. ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
61. විදුලි උත්පාදන යන්ත්‍ර සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. සංගීත උපකරණ කුළියටදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63. වාස්තු හා ජ්‍යොතිෂ කාර්යාලයක් පවත්වාගෙන යාම
64. පූජා භාණ්ඩ අළෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
65. පුවත්පත් අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. රත්තරන් බඩු හෝ ඇස් කණ්නාඩි අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67. කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
68. ස්වභාවික මල් හෝ පැළ අළෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
69. පරිගණක ආශ්‍රයෙන් නිර්මාණ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70. ආයුර්වේද පංචකර්ම වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
71. විසිතුරු මසුන් ඇති කිරීමේ, අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
72. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
73. සංචාරකයන් සඳහා මඟ පෙන්වන ආයතනයක් පවත්වාගෙන යාම
74. දඹදිව සංචාර සංවිධානය කරන ආයතනයක් පවත්වාගෙන යාම
75. මෘදුකාංග (සොෆ්ට් වෙයා) නිර්මාණය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
76. අන්තර්ජාල හරහා වෙළෙඳාම් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
77. ඇසුරුම් කර අලෙවි කරන ව්‍යාපාර, (තේ කොළ, කුළුබඩු, ධාන්‍ය වර්ග)

11-372/2

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

කර්මාන්ත බදු ගාස්තු පැනවීම - 2024 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළව කර්මාන්ත බදු සම්බන්ධයෙන් පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, 2024 මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 150 වැනි වගන්තියේ I වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, බද්දට යටත් වන සෑම තැනැත්තෙකු විසින් යටෝක්ත බද්ද 2024 මාර්තු 31 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු බවටත්, බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* *රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	ප්ලාස්ටික් නාම පුවරු හා බැනර් ඇඳීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	යන්ත්‍ර රහිතව පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	හඳුන්කුරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	අත්මලු වර්ග හා කබා මැසීමේ/බඳපටි මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (මැෂින් 5කට අඩු)	500 0	750 0	1,000 0
7.	ඇඹරුම් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	බිම්මල් වගාව පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

11-372/3

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන වෙළඳ බලපත්‍ර මත ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළව වෙළඳ බලපත්‍ර මත ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2024 වර්ෂයේ දී බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

උපලේඛනය

I වැනි තීරය		*II වැනි තීරය* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
බලය දෙනු ලබන කාර්යය		*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1500 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
පීඩාකාරී ව්‍යාපාර				
1.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
2.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම	500 0	750 0	1,000 0
3.	පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4.	තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම	500 0	750 0	1,000 0
5.	කරවල, මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 100 ට වඩා වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
6.	මාළු හෝ මස්, ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
7.	පොල්කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
8.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
9.	සත්ත්ව ආහාර විකිණීම	500 0	750 0	1,000 0
10.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	අලුත් ලෝහ හෝ පරණ ලෝහ විකිණීම	500 0	750 0	1,000 0
12.	ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0
13.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
14.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0

I වැනි තීරය		*II වැනි තීරය* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
බලය දෙනු ලබන කාර්යය		*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1500 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
පීඩාකාරී ව්‍යාපාර				
15.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
16.	සිරප් හෝ පලතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
17.	රස කැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
18.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
19.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
20.	දෑව ඉරීම	500 0	750 0	1,000 0
21.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
22.	කෝපි, ධාන්‍ය වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
23.	ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
24.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
25.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යක් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
26.	යන්ත්‍රානුසාරයෙන් බ්ලොක්ගල් නිපදවීම	500 0	750 0	1,000 0
27.	නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
28.	කුකුළු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	ටයර්/ටියුබ් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
30.	සපත්තු/බෑග්/සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
31.	දුම්කොළ යොදා කරන සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම	500 0	750 0	1,000 0
32.	භෝජනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	හෝටල් සහ නිවාඩු නිකේතන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	මත්පැන් අළෙවි සැල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	සත්ත්ව පාලන (මස්, කිරි, බිත්තර) සතුන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අන්තරාදායක ව්‍යාපාර :				
1.	කළුගල් තැනීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
2.	සිසිල් බීම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
3.	අයිස් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
4.	පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0

I වැනි තීරය		*II වැනි තීරය* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
බලය දෙනු ලබන කාර්යය		*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1500 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
5.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම/විකිණීම	500 0	750 0	1,000 0
6.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
7.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
8.	හිරිගල්, හුණුගල් කැණීම	500 0	750 0	1,000 0
9.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	හිස්ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
11.	පා පැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
13.	විසිතුරු පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
14.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15.	වෑල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	කෘමි නාශක විකිණීමේ, ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (පළිබෝධක)	500 0	750 0	1,000 0
17.	සිල්ලර බඩු වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	දේශීය හා බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	දේශීය හා බටහිර ඔසුසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
පීඩාකාරී හා අන්තරාදයක ව්‍යාපාර :				
1.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
2.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
3.	ලෝහ වර්ග පැස්සීම	500 0	750 0	1,000 0
4.	මෝටර් වාහන අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
5.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
6.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
7.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
9.	වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
10.	ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0

I වැනි තීරය		*II වැනි තීරය* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
බලය දෙනු ලබන කාර්යය		*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1500 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
11.	වී මෝල්	500 0	750 0	1,000 0
12.	මිනීපෙට්ටි තැනීම	500 0	750 0	1,000 0
13.	දුරකතන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
14.	විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම	500 0	750 0	1,000 0
15.	පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
16.	යකඩ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	උක් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	සංචාරක වෙළෙඳාම්	500 0	750 0	1,000 0

11-372/4

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වගන්තිය යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II තීරුවේ නිරූපිත බද්දක් 2024 වර්ෂය ට අයකළ යුතු බවටත්,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය ප්‍රකාරව බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින්ම යටෝක්ත බද්ද 2024 මාර්තු 31 දිනට පෙර බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
1.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම -	25 0
2.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා :	
	(i) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ii) වෙළෙඳ කාර්යයක් සඳහා නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
3.	සෑම කරත්තයක් සඳහා	20 0
4.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
5.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
6.	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	15 0
7.	සෑම ඇතෙකු සඳහා	50 0

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

11-372/5

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා දඩාවතේ යන සතුන් පිළිබඳ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළව දඩාවතේ යන සතුන් පිළිබඳ ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 66 (1), (2) හා (3) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සියලුම පොදු මාර්ගවල හෝ පොදු ස්ථානයක හෝ ඒ අවට බැඳ දිගේලි කර හෝ අයාලේ යන හෝ ගවයින්, මීගවයින් හෝ එළුවන් ආදී සතුන් ඇල්ලීමටත්, එසේ අල්ලා ගනු ලබන සතුන් ගාල් කිරීමටත්, එසේ ගාල් කරනු ලබන සතුන් නිදහස් කිරීම සඳහාත්, පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමට සහ අයාලේ යන සතුන් අල්ලා දින 10ක් ඇතුළත අයිතිකරුවන් තම සතුන් නොගතහොත් එම කාලයට පසුව එකී සතුන් ප්‍රසිද්ධියේ විකුණා අදාළ ගාස්තු හා වෙන්දේසි කිරීමේ වියදම් සමග මෙමගින් අයකළ යුතු බවට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටුව නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

		රු. ශත
1.	ගවයින් හෝ මී ගවයින් ඇල්ලීමට (එක් සතෙකුට)	2,000 0
2.	එළුවන් ඇල්ලීමට (එක් සතෙකුට)	1,000 0
3.	ගවයින් ආරක්ෂා කිරීමේ ගාස්තු (එක් සතෙකුට එක් දිනකට)	500 0
4.	එළුවන් ආරක්ෂා කිරීමේ ගාස්තු (එක් සතෙකුට එක් දිනකට)	500 0
5.	ගවයින් නඩත්තු කිරීමේ ගාස්තු (එක් සතෙකුට එක් දිනකට)	300 0
6.	එළුවන් නඩත්තු කිරීමේ ගාස්තු (එක් සතෙකුට එක් දිනකට)	250 0

11-372/6

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව ජලගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළව ජල ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109 වගන්තිය සමඟ කියවිය යුතු 108 වගන්තිය ප්‍රකාරව, හා 1988.08.23 දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ කරන ලද පොදු අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව, එකී පොදු අතුරු ව්‍යවස්ථාවේ 34 දරන ජලසම්පාදනය අතුරු ව්‍යවස්ථාවේ 40 හා 41 දරන අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව, පහත උපලේඛනයේ සඳහන් ගාස්තු ක්‍රමය 2024.01.01 දින සිට අයකර ගැනීමට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

ජල මාපක සවිකර ඇති (ඒකක ගණන)		ඒකකයක මිල රු. ශත	මාසික සේවා ගාස්තුව රු. ශත
1.	ඒකක 01 සිට ඒකක 05 දක්වා	30 0	150 0
2.	ඒකක 06 - 10 තෙක්	40 0	150 0
3.	ඒකක 11 - 15 තෙක්	50 0	150 0
4.	ඒකක 16 - 20 තෙක්	60 0	200 0
5.	ඒකක 21 - 25 තෙක්	70 0	250 0
6.	ඒකක 26 - 30 තෙක්	80 0	300 0
7.	ඒකක 31 - 40 තෙක්	90 0	750 0
8.	ඒකක 41 - 50 තෙක්	100 0	1500 0

ජල මාපක සවිකර ඇති (ඒකක ගණන)		*ඒකකයක මිල රු. ශත*	*මාසික සේවා ගාස්තුව රු. ශත*
9.	ඒකක 51 - 75 තෙක්	120 0	1750 0
10.	ඒකක 76 - 100 තෙක්	135 0	2000 0
11.	ඒකක 100 ට වැඩි	150 0	2250 0

11-372/7

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට ක්‍රීඩාපිටි කුළියට දීමේ ගාස්තු පැනවීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ II වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, 2013.06.28 දිනැති 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* උෂව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 4 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළ පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ II වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, 2013.06.28 දිනැති 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* උෂව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා 2013.12.27 වැනි දින අංක 1843 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ ක්‍රීඩාපිටි අතුරු ව්‍යවස්ථාවේ 4 වැනි වගන්තියෙන් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2024 වර්ෂය සඳහා අයකර ගැනීමට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

		රු. ශත
1.	අමුණුදෝව පොදු ක්‍රීඩාංගනය (පොදු කටයුතු සඳහා/සැණකෙලි/සංදර්ශන/ ආදායම් උත්පාදන කටයුතු සඳහා) දිනකට	5,000 0
2.	පොදු ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ඇප මුදල	2,500 0
3.	ක්‍රීඩාංගනයේ රැස්වීම් පැවැත්වීමේ ගාස්තුව	5,000 0
4.	රැස්වීම් පැවැත්වීම සඳහා ඇප මුදල	2,000 0
5.	වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා (දිනකට)	3,500 0
6.	වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා (දිනකට) ඇප මුදල	2,000 0
7.	පාසල් ක්‍රීඩා උත්සව සඳහා	1,500 0

11-372/8

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට ත්‍රීරෝද රථ ගාල් කිරීම සම්බන්ධ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළව ත්‍රීරෝද රථ ගාල් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 දරන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති ත්‍රීරෝද රථ ගාල් තුළ ගාල් කර කුළී සේවාවේ යොදවන බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි වී ඇති ත්‍රීරෝද රථ සඳහා 2024 වර්ෂයේ දී ගාස්තු අය කිරීමටත් ද,

(*ආ*) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 දරන වගන්තියේ 3 වැනි උපවගන්තිය ප්‍රකාරව, බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින්ම යථෝක්ත බද්ද 2024 මාර්තු මස 31 ට ප්‍රථම ගෙවිය යුතු බව බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*ත්‍රීරෝදරථ ගාල*	*ත්‍රීරෝද රථ ගණන*	*බලපත්‍ර ගාස්තුව වර්ෂයකට රු. ශත*	*ස්ටිකර් ගාස්තුව රු. ශත*
01	කිණිගම	08	2,500 0	100 0
02	මීරියගස් හන්දිය	06	2,500 0	100 0
03	හීල්ඔය	17	2,500 0	100 0
04	අමුණුදෝව	05	2,500 0	100 0
05	කෝමාරිකාගොඩ	05	2,500 0	100 0
06	මල්වත්ත හන්දිය	10	2,500 0	100 0
07	අඹේගොඩ	02	2,500 0	100 0
08	ලියන්ගහවෙල	06	2,500 0	100 0

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළ ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළව පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ II වැනි වගන්තිය ප්‍රකාරව හා 2013.06.28 දිනැති 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ඒ්‍ාව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2013.12.27 වැනි දින අංක 1843 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්පත්‍රය* මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ 10 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමට හෝ පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2024 වර්ෂය සඳහා අයකර ගැනීමට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය

අ/අ.	*පුවරුවේ ස්වභාවය*	*වර්ග අඩි*	*ගාස්තුව (මාස 03) රු. ශත*	*(මාස 06) රු. ශත*	*(අවුරුද්දක් සඳහා) රු. ශත*
01	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරණය කරනු ලබන දැන්වීම් පුවරු	02-10 අතර	50 0	75 0	100 0
02	රෙදි ඩිජිටල් බැනර් සඳහා	02-10 අතර 10ට වැඩි	30 0 40 0	35 0 45 0	50 0 75 0
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් සඳහා	02-10 අතර 10ට වැඩි	40 0 40 0	45 0 50 0	50 0 75 0
04	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන දන්වීම්	02-10 අතර 10ට වැඩි	20 0 30 0	25 0 35 0	30 0 40 0

11-372/10

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ බලපත්‍ර ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළ පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

යෝජනාව

1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනත යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය වර්ෂ 2022 පෙබරවාරි මස 24 වැනි දින සිට මෙහි උපලේඛනයේ "ඇ" කොටසෙහි නිශ්චිතව සඳහන් බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් අංක 2264/18 සහ 2022 ජනවාරි මස 27 වැනි දිනැති *අති විශේෂ ගැසට්පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතින් පනවන ලද රෙගුලාසිවලට අනුව පහත උපලේඛන අංක II හි සඳහන් ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නන් විසින් උපලේඛන I හි අනුප්‍රමාණික බලපත්‍ර ගාස්තු ගෙවා පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබාගත යුතු අතර, අවුරුදු 03ට රු.4500.00ක බලපත්‍රය ගාස්තුවක් අය කර ගැනීමට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

උපලේඛනය (I)

අ.අ	මුළු ආයෝජනය රු.	ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු රු.
01	2,50,000 හෝ ඊට අඩු	3,000 + රජයේ අනුමත බදු
02	2,50,001 - 5,00,000	3,750 + රජයේ අනුමත බදු
03	5,00,001 - 10,00,000	5,000 + රජයේ අනුමත බදු
04	1,000,001 ට වැඩි	10,000 + රජයේ අනුමත බදු

උපලේඛනය

"ඇ" කොටස

1. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
2. සේවක සංඛ්‍යාව 5 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 5 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වානිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
4. රෙදි වියන යන්ත්‍ර / මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එබ්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
5. දිනකට ලීටර් 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
6. පොල්තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
7. දිනකට ලීටර් 100 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත
8. දිනකට කිලෝග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලී සහිත වී මෝල්
9. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ඇඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ

දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත

11. එක් තොගයක් කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සිහින කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ කර්මාන්ත
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/මුහුවම් කිරීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්"
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්
    * මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව + [50 x ඌරන් සංඛ්‍යාව + ගවයන් සංඛ්‍යාව + 10 x (එළුවන් සංඛ්‍යාව)]
20. ගබඩා ධාරිතාවය සත මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
24. සේවක සංඛ්‍යාව 5කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින "ප්ලාස්ටර් ඔෆ් පැරිස්" අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
28. කළුගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීමේ කටයුතු
30. දිනකට සත මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවයක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත
32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත
33. සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා
34. පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම් හල්
35. විසිරි පින්තාරු කිරීමේ හෝ වාහන වායු සම්කරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ
36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත
37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
38. මෘත ශරීර කල්තබා ගැනීමට සකස් කිරීම සහිත මල්ශාලා
39. මෙම උපලේඛනයේ "ඇ" කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/කර්මාන්තයක්

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ගාස්තු හෝ සේවා ගාස්තු අය කිරීම - 2024 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළ පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් 2024 වර්ෂය සඳහා පහත සඳහන් ගාස්තු හෝ සේවා ගාස්තු අයකළ යුතු බවටත් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

01. පුස්තකාල සේවා - සේවා ගාස්තු :

		රු. ශත
(i)	අයදුම්පත්‍ර ගාස්තුව	15 0
(ii)	ළමා සමාජික ගාස්තු	25 0
(iii)	වැඩිහිටි සාමාජික ගාස්තු	50 0
(iv)	ප්‍රමාද ගාස්තු (දිනකට)	1 0
(v)	අන්තර්ජාල පහසුකම් පැය එකක් සඳහා	200 0

02. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු :

		රු. ශත
(i)	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව	350 0
(ii)	NBRO අයදුම්පත්‍ර ගාස්තුව	350 0
(iii)	නේවාසික ගොඩනැගිලි සඳහා පෙරසැරි ගාස්තුව - වර්ග අඩියක් සඳහා .	7 50
(iv)	ව්‍යාපාරික ගොඩනැගිලි සඳහා පෙරසැරි ගාස්තුව - වර්ග අඩියක් සඳහා	12 50
(v)	ඉදිකළ ගොඩනැගිලි සඳහා ආවරණ අනුමැතිය ලබාදීම වෙනුවෙන් - අමතර ගාස්තුව - වර්ග අඩියක් සඳහා	35 0
(vi)	වීථිරේඛා සහ නොපවරා ගැනීමේ සහතිකයක් සඳහා	1,500 0
(vii)	ඉඩම් කට්ටි සැලසුම් අනුමත කිරීම - කට්ටි එකක් සඳහා	1,500 0
(viii)	මිනින්දෝරු සැලසුමක් අනුමත කිරීම සඳහා	2,000 0
(ix)	අනුකූලතා සහතිකය සඳහා ගාස්තු	2,000 0

03. සන්නිවේදන කුළුණු ඉදිකිරීම :

		කුළුණේ උස
(i)	පළමු මීටර් 10 සඳහා - එක් මීටරයකට	3,000 0
(ii)	මීටර් 11 - 20 දක්වා - එක් මීටරයකට 1,600 x 9m	12,000 0

		රු. ශත
(iii)	මීටර් 21 - 30 දක්වා - එක් මීටරයකට 1,400 x 9m	16,000 0
(vi)	මීටර් 31 - 40 දක්වා - එක් මීටරයකට 1,200 x 9m	20,000 0
(v)	මීටර් 31 - 50 දක්වා - එක් මීටරයකට 1,000 x 9m	25,000 0

04. සේවා සඳහා ගාස්තු අය කිරීම :

		රු. ශත
(i)	කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය සඳහා දිනකට ඔපරේටර්වරුන් සමග (8 පැය) (ප්‍රවාහන ගාස්තු නොමැතිව)	7,000 0
	වැඩිවන සෑම පැයකටම	700 0
	ප්‍රමාද ගාස්තු දිනකට	10,00 0
(ii)	ට්‍රැක්ටර් බවුසරය සඳහා ජල ලීටර් 4500 ක්	4,500 0
	ජල බවුසරය සඳහා ජල ලීටර් 5000 ක්	5,000 0
	පළමු 10k.m. සඳහා ගාස්තු අය නෙකෙරේ	
	10k.m. සිට වැඩිවන සෑම කිලෝ මීටරයක් සඳහාම	200 0
(iii)	JCB යන්ත්‍රය සඳහා පැයකට	6,000 0
(iv)	ඩ්‍රම්ට්‍රක් රථය සඳහා දිනකට	7,500 0
	01 Km සිට 50 Km දක්වා	250 0
	50 Km ට වැඩිවන සෑම කිලෝ මීටරයක් සඳහාම	250 0
(v)	බිම් තලනය ඉන්ධන රහිතව දිනකට (08 පැය) ඔපරේටර්වරුන් සමග (ප්‍රවාහන ගාස්තු නොමැතිව)	6,000 0
	වැඩින සෑම පැයකටම	500 0
	ප්‍රමාද ගාස්තු දිනකට	1,000 0
(vi)	කැනපි 01 සඳහා දිනකට	750 0
	ප්‍රමාද ගාස්තු දිනකට	200 0
(vii)	GI බට එක් බටයක් සඳහා දිනකට	30 0
	ප්‍රමාද ගාස්තු දිනකට	10 0
(viii)	තහඩු එකක් සඳහා දිනකට	50 0
	ප්‍රමාද ගාස්තු දිනකට	20 0
(ix)	තහඩු පුටු එකක් සඳහා දිනකට	20 0
	ප්‍රමාද ගාස්තු දිනකට	20 0
(x)	කුෂන් පුටු 01ක් සඳහා දිනකට	50 0
	ප්‍රමාද ගාස්තු දිනකට (එක් පුටුවකට)	50 0
	මාණ්ඩලික (උසස් තත්වයේ එක් පුටුවකට)	300 0
	ප්‍රමාද ගාස්තු දිනකට (එක් පුටුවකට)	200 0
(xi)	**ජෙනරේටර් කුළියට ලබා දීම :**	
	3.5 KW පැය 12ක් සඳහා (ඉන්ධන රහිත)	3,000 0
	2.5 KW පැය 12ක් සඳහා (ඉන්ධන රහිත)	2,000 0
	ට්‍රැක්ටර් ට්ලරය	5000 0

	රු. ශත
පළමු කි.මී. 10ක් සඳහා	4000 0
වැඩිවන කි. මී. 1ක් සඳහා	200 0

05. අයදුම්පත්‍ර ගාස්තු :

(i) ත්‍රීවීල් බලපත්‍ර ඉල්ලුම්පත්	150 0
(ii) නව වෙළඳ බලපත්‍ර ඉල්ලුම්පත්	150 0
(iii) වීථිරේඛා සහතික ඉල්ලුම්පත්	150 0
(vi) පරිසර බලපත්‍ර ඉල්ලුම්පත්	150 0

06. මාර්ග පළුදු කිරීම සඳහා ගාස්තු :

(i) ජලනල එලීම සඳහා තැන්පත් මුදල	8,000 0
(ii) ආපසු නොගෙවන මුදල	2,000 0

07. පොරෝගල නැරඹුම් මධ්‍යස්ථානය සඳහා පොදු පහසුකම් සැලසීමේ ගාස්තු :

ප්‍රවේශපත්‍ර ගාස්තු :

(i) දේශීය ළමා	(පාසල් නිල ඇඳුමින් පැමිණෙන සිසුන්/අවු 12 න් පහළ ළමුන්	50 0
	වැඩිහිටි	100 0
(ii) විදේශීය	ළමා	200 0
	වැඩිහිටි	400 0
(iii) ටෙලිනාට්‍ය රූගත කිරීම්		15,000 0
(iv) සිනමාපට රූගත කිරීම්		15,000 0
(v) වෙළඳ දැන්වීම් රූගත කිරීම්		7,500 0
(vi) මංගල ඡායාරූප වීඩියෝ කිරීම්		3,000 0
(vii) දුරදක්නා උපකරණ භාවිතා කිරීම (එක් අයෙකුට)		50 0
(viii) විදේශීය රූගත කිරීම්		25,000 0

08. පෙරපාසල සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානය සම්බන්ධ ගාස්තු :

පෙර පාසල සඳහා

(i) බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා පෙර පාසල සඳහා එක් ළමයකු සඳහා මාසික ගාස්තු	2,000 0
(ii) හිල්ඔය උප කාර්යාලයේ පෙර පාසල සඳහා එක් ළමයකු සඳහා මාසික ගාස්තු	1,500 0

දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා :

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා පෙර පාසලේ අධ්‍යාපන කටයුතුවල නියැලෙන ළමුන් සඳහා	3,000 0
අධ්‍යාපනය නොලබන වයස අවුරුදු 3-5 අතර පිටත ළමුන් සඳහා මාසික ගාස්තු (ආහාරපාන රහිතව)	5,000 0

			රු. ශත
09. හීල්ඔය උපකාර්යාලයේ සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමේ ගාස්තු :			
(i)	දුරකථන ගාස්තු විනාඩියට		10 0
(ii)	ෆැක්ස් ගාස්තු		50 0
(iii)	විද්‍යුත් තැපෑල		100 0
(iv)	ෆොටෝ කොපි	වර්ණ ඡායා පිටපත් සඳහා	40 0
		කළුසුදු තනිපිට ඡායා පිටපත් සඳහා	10 0
		කළුසුදු දෙපිට ඡායා පිටපත් සඳහා	13 0
(v)	බිල්පත් ගෙවීම		15 0
10. හීල්ඔය උපකාර්යාලයේ දේශන ශාලා වෙන් කිරීමේ ගාස්තු :			
(i)	දේශන ශාලා ගාස්තු (එක් දිනකට)		5,000 0
(ii)	තැන්පත් මුදල		2,500 0
(iii)	ප්‍රොජෙක්ටරය ස්ක්‍රීන් / ලැප්ටොප් එක / උපකරණ භාවිතා කරන්නේ නම් - දිනකට		3,000 0
11. (i)	දැන්වීම් පුවරුවක් ඉදිකිරීමට පෙරසැරි ගාස්තු වර්ග අඩියකට		100 0
(ii)	දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ෂයකට වර්ග අඩි එකක් සඳහා		75 0
(iii)	බැනරයක් හා කටවුට් ප්‍රදර්ශනය කිරීම දින 30ක් සඳහා වර්ග අඩියකට		25 0
12.	පොළ ගාස්තු		
	(i) පොළ ගාස්තු අය කිරීම එක් අයෙකු සඳහා		30 0

11-372/12

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සංචාරක හෝටල්, ආපනශාලා හෝ නවාතැන් පොළවලින් අයකරනු ලබන ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 (1) වගන්තිය ප්‍රකාරව හා 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තාවූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ යම් සංචාරක හෝටලයක්, ආපනශාලාවක් හෝ නවාතැන් පොළක් වශයෙන් යොදා ගනු ලබන යම් ස්ථානයකින් වාර්ෂික බලපත්‍ර ගාස්තු වශයෙන් 2024 වර්ෂය සඳහා රු. 3,000.00ක මුදලක් අයකරන බවත් ඊට අමතරව එම වර්ෂයට පෙර වූ වර්ෂය සඳහා එම සංචාරක හෝටලයේ, ආපන ශාලාවේ හෝ නවාතැන්පලේ ආදායමින් 1% ක් බැගින් වූ ගාස්තුවක් අයකිරීමටත්, තව ද එම ගාස්තුව අයවිය යුතු වර්ෂය වන සංචාරක හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොළ පවත්වාගෙන යනු ලබන පළමු වර්ෂය වන අවස්ථාවක එම ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව ඉහත ගාස්තුව 2024.01.01 වැනි දින සිට අයකර ගැනීමට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

11-372/13

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ඇතැම් ඉඩම් විකිණීමේ විෂයෙහි බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළ පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වන උප වගන්තියේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් ඉඩමක්, වෙන්දේසිකරුවෙකු හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකු *නැතහොත්* අනු නියෝජිතයෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ *නැතහොත්* වෙනත් යම් ආකාරයකින් විකුණනු ලැබුවහොත්, එම විකිණීමෙන් ලැබෙන මුදලින් සියයට එකක් (1%) වන බද්දක් විකුණුම්කරු විසින් හෝ බ්‍රෝකර්කරු විසින් හෝ ඔහුගේ සේවකයෙකු *නැතහොත්* අනු නියෝජිතයෙකු විසින් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

11-372/14

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළ පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි ඉඩමක්, ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය සඳහා හෝ නිත්‍ය හෝ විධිමත් ලෙස වගා කිරීමේ කාර්යය සඳහා යෝග්‍ය වන හෝ ප්‍රාදේශීය සභාවේ මතය අනුව සාධාරණ යැයි සැලකෙන වියදමකින් එවැනි යම් කාර්යය සඳහා එම ඉඩම සංවර්ධනය කර ඇති අවස්ථාවක සහ එම ඉඩමෙහි කිසිදු ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති විටෙක හෝ එම ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති වූ විටෙක එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 1% ක ප්‍රමාණයක් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

11-372/15

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා මාර්ගවල ගමන් කරන වාහනවල බර සහ වේගය සීමා කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2023.09.01 වැනි දිනැති තීරණ පොතේ අංක 2023.09.01/31/XL III යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවට අදාළ පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. ජී. ඩබ්. වසන්තිමාලා,
ලේකම්,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව,
බණ්ඩාරවෙල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 70(1) දරන වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව ප්‍රාදේශීය සභාව සතු මාර්ගවල නියම කරනු ලබන උපරිම බරකින් සහ වේගයකින් යුත් රථ ධාවනය පාලනය කිරීම එහි මාර්ගවලට සිදුවන අලාභයන් සහ මාර්ග භාවිතය සඳහා ගාස්තු නියම කිරීම ටොන් 05 සිට 10 දක්වා වාහන (දුව/කළුගල්/වැලි/යන්ත්‍රසූත්‍ර/ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම වෙනුවෙන්) රු. 15,000 සිට රු. 100,000 දක්වා ඇප තැන්පත් මුදලක් රඳවා තබා ගැනීම අනිවාර්ය වන අතර, එම තැන්පත් මුදල නිදහස් කිරීමේ දී ආපසු නොගෙවන තැන්පතුව ලෙස 20% ක මුදලක් රඳවා ගැනීමටත්, ඊට අමතරව මාර්ගවලට හානි වූ බව තහවුරු වුවහොත් ඇප මුදල සභාව සතු වන බවත් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටු නිර්දේශ පදනම් කරගෙන මම තීරණය කරමි.

මාර්ගයේ වර්ගය	*දුර ප්‍රමාණය*	*මුදල* *රු. ශත*
කොන්ක්‍රීට්	100m - 500m 600m - 1000m	20,000.00 50,000.00
පස්/බොරලු	100m - 500m 600m - 1000m	10,000.00 20,000.00
කාපට්	100m - 500m 600m - 1000m	50,000.00 100,000.00
තාර	100m - 500m 600m - 1000m	30,000.00 50,000.00

11-372/16

කතරගම ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 01 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, මාර්තු 31 ජුනි 30 සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන සෑම කාර්තුවක් ම තුළදී සමාන වාරික හතරකින් කතරගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහාවන සම්පූර්ණ වරිපනම් බදු මුදල 2024 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර කතරගම ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් කතරගම ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) උපවගන්තියෙන් කතරගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කතරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2012 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම් 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන් සියයට හතරක් (4%) වරිපනමක් 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ, ඒ වරිපනම් එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් මා විසින් තීරණය කරමි.

උපලේඛනය

කාර්තුව	*කාර්තු සංලක්ෂය*	*5% වට්ටම් ලැබෙන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2024.01.01 - 2024.03.31 දක්වා	2024.01.31
දෙවන කාර්තුව	2024.04.01 - 2024.06.30 දක්වා	2024.04.30
තුන්වන කාර්තුව	2024.07.01 - 2024.09.31 දක්වා	2024.07.31
හතරවන කාර්තුව	2024.10.01 - 2024.12.31	2024.10.30

කතරගම ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 149 වන වගන්තිය යටතේ කතරගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා කතරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2024 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපනශාලාවක් නවාතැන්පළක්වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2023 වර්ෂයේ ලැබීම්වලින් 1%ක බදු ගාස්තුව 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මා විසින් තීරණය කරමි.

පළමු උපලේඛනය

	බලපත්‍රයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750.00 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 751.00 රු. 1,500.0 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 1,501.00 නොඉක්මවන විට*
01.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500.00	750.00	1,000.00
02.	සත්ව පාලන (මස්, කිරි හෝ බිත්තර සඳහා) සතුන් ඇති කරන ස්ථාන පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
03.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ 50 Kg ට වඩා ගබඩා කිරීම	500.00	750.00	1,000.00
04.	පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම	500.00	750.00	1,000.00
05.	පොදු හෝ පෞද්ගලික වෙළඳ පොළවල්	500.00	750.00	1,000.00
06.	හෝටල්	500.00	750.00	1,000.00
07.	කොණ්ඩා කපන ස්ථාන හෝ බාබර් සාස්පු	500.00	750.00	1,000.00
08.	මස් විකිණීම	500.00	750.00	1,000.00
09.	මාළු විකිණීම	500.00	750.00	1,000.00
10.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම	500.00	750.00	1,000.00
11.	මාළු හෝ මස් ජාඩි දැමීම, හෝ වේළීම හෝ අයිස් දැමීම	500.00	750.00	1,000.00

	බලපත්‍රයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750.00 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 751.00 රු. 1,500.0 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 1,501.00 නොඉක්මවන විට*
12.	පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500.00	750.00	1,000.00
13.	සත්ත්ව ආහාර නිපදවීම	500.00	750.00	1,000.00
14.	සබන් නිෂ්පාදනය	500.00	750.00	1,000.00
15.	අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500.00	750.00	1,000.00
16.	ලෝහ සුන්බුන් තබා ගැනීම	500.00	750.00	1,000.00
17.	ගෘහ භාණ්ඩ නිපදවීම	500.00	750.00	1,000.00
18.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500.00	750.00	1,000.00
19.	සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500.00	750.00	1,000.00
20.	රස කැවිලි නිපදවීම/රස කැවිලි වෙළඳාම	500.00	750.00	1,000.00
21.	පොල් ලෙලි නිපදවීම හෝ (පල්කිරීම)	500.00	750.00	1,000.00
22.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500.00	750.00	1,000.00
23.	රා එකතු කිරීම	500.00	750.00	1,000.00
24.	විනාකිරි නිපදවීම	500.00	750.00	1,000.00
25.	දැව ඉරීම්	500.00	750.00	1,000.00
26.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500.00	750.00	1,000.00
27.	පළතුරු මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500.00	750.00	1,000.00
28.	කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම	500.00	750.00	1,000.00
29.	ටයර් නැවත පිරවීම	500.00	750.00	1,000.00
30.	ටයර් ටියුබ් වොල්කනයිසින් කිරීම	500.00	750.00	1,000.00
31.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් භාණ්ඩ නිපදවීම	500.00	750.00	1,000.00
32.	ගඩොල් පිළිස්සීම	500.00	750.00	1,000.00
33.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයක් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500.00	750.00	1,000.00
34.	යන්ත්‍රානුසාරයෙන් බ්ලොක් ගල් නිපදවීම	500.00	750.00	1,000.00
35.	නිමි ඇඳුම් නිෂ්පාදනය	500.00	750.00	1,000.00
36.	කුකුළු වෙළඳ සැලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
37.	විෂබීජ නාශක නිපදවීම	500.00	750.00	1,000.00
38.	ටයර්/ ටියුබ්/ අලුත්වැඩියා කිරීම	500.00	750.00	1,000.00
39.	සපත්තු/ බෑග්/ සම්/ භාණ්ඩ නිෂ්පාදනය	500.00	750.00	1,000.00
40.	දුම්කොළ යොදා කරන සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම	500.00	750.00	1,000.00
41.	සිල්ලර බඩු වෙළඳාම වෙනුවෙන් ගාස්තු අයකිරීම	500.00	750.00	1,000.00

	බලපත්‍රයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750.00 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 751.00 රු. 1,500.0 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 1,501.00 නොඉක්මවන විට*
අන්තරා දායක ව්‍යාපාර		**දෙවන උපලේඛනය**		
1	කළු ගල් තැලීම හෝ කැඩීම	500.00	750.00	1,000.00
2	සිසිල් බීම නිෂ්පාදනය	500.00	750.00	1,000.00
3	අයිස් නිෂ්පාදනය	500.00	750.00	1,000.00
4	එළවලු නිෂ්පාදනය	500.00	750.00	1,000.00
5	පොල්තෙල් නිෂ්පාදනය	500.00	750.00	1,000.00
6	කොහු හෝ කෙඳි වර්ග නිෂ්පාදනය	500.00	750.00	1,000.00
7	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිපදවීම	500.00	750.00	1,000.00
8	පිදුරු තබා ගැනීම	500.00	750.00	1,000.00
9	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව	500.00	750.00	1,000.00
10	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500.00	750.00	1,000.00
11	හිරිගල් හෝ හුණු ගල් කැණීම	500.00	750.00	1,000.00
12	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
13	හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500.00	750.00	1,000.00
14	පා පැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීම	500.00	750.00	1,000.00
15	පාවිච්චි කරන කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500.00	750.00	1,000.00
16	විසිතුරු භාණ්ඩ පින්තාරු කිරීම	500.00	750.00	1,000.00
17	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම	500.00	750.00	1,000.00
18	ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ නිපදවීම)	500.00	750.00	1,000.00
පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර		**තුන්වන උපලේඛනය**		
01	රසායනික ද්‍රව්‍ය පාවිච්චිකර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500.00	750.00	1,000.00
02	ඩ්‍රයික්ලීන් කිරීම	500.00	750.00	1,000.00
03	හුණු ගල් හෝ හිරිගල් නිපදවීම	500.00	750.00	1,000.00
04	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත් වැඩියා කිරීම	500.00	750.00	1,000.00
05	ලෝහ වර්ග පෑස්සීම	500.00	750.00	1,000.00
06	මෝටර් වාහන අළුත් වැඩියා කිරීම	500.00	750.00	1,000.00
07	මෝටර් වාහන සේවා කිරීම	500.00	750.00	1,000.00
08	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
09	මෝටර් වාහන බොඩි තැනීම	500.00	750.00	1,000.00
10	කෘමි නාශක, දිලීර, නාශක, පැලෑටි හෝ පලිබෝධ නාශක	500.00	750.00	1,000.00
11	ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500.00	750.00	1,000.00

	බලපත්‍රයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750.00 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 751.00 රු. 1,500.0 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 1,501.00 නොඉක්මවන විට*
12	වී මෝල්	500.00	750.00	1,000.00
13	දුරකතන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500.00	750.00	1,000.00
14	විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම	500.00	750.00	1,000.00
15	පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අළුත්වැඩියාව	500.00	750.00	1,000.00

11 - 632/2

කතරගම ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.02 දින පවත්වන ලද කළමණාකරන කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 03 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ කතරගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එම පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කතරම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2023 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවට මා විසින් තීරණය කරමි.

1 වැනි තීරුව	*11 වැනි තීරුව* *රු. ශත*
පෙර වර්ෂයේ ව්‍යාපාරයේ ලැබීම්	
රු. 6000.00 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6001.00 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90.00
රු. 12,001.00 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180.00
රු. 18,751.00 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	300.00
රු. 75,001.00 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200.00
රු. 1,50,001 ඉක්මවන අවස්ථාවක	3,000.00

උපලේඛනය

1. කොමිස් ඒජන්තවරු
2. වෙන්දේසිකරුවන්
3. බ්‍රෝකරවරුන්
4. මුදල් ආයෝජකයින්
5. උකස් බඩු ගන්නවුන්
6. කොන්ත්‍රාත්කරුවෙකු
7. සැපයුම්කරුවන්
8. රියැදුරු පුහුණු ආයතන
9. ලොතරැයි නියෝජිතයින්
10. රක්ෂණ නියෝජිතයින්
11. මෝටර් රථ වෙළඳාම් කරන්නන්
12. මැණික් වෙළඳ ව්‍යාපාරිකයින්
13. පෞද්ගලික උපකාරක පංති පවත්වන ආයතනයක් පවත්වාගෙන යන්නවුන්
14. බැංකුකරුවන් ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නවුන්
15. පෞද්ගලික බස්රථ ධාවකයකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නවුන්
16. විශ්‍රාම ශාලාවක් පවත්වාගෙන යන්නවුන්
17. විශ්‍රාම ශාලාවක් පවත්වාගෙන යන්නවුන් සඳහා උපලේඛනයේ 11 වන තීරුව පරිදි බදු ක්‍රම අදාළ වේ.
18. බේකරියක් පවත්වාගෙන යන්නවුන්
19. ගල් වැඩපළක් පවත්වාගෙන යන්නවුන්
20. මුද්‍රණාලයක් පවත්වාගෙන යන්නවුන්
21. වඩු කර්මාන්ත ශාලාවක් හෝ දැව ඉරුම් හලක් පවත්වාගෙන යන්නවුන්
22. වීදුරු වැඩපලක් පවත්වාගෙන යන්නවුන්
23. බටහිර ඖෂධ විකුණන ස්ථානයක් හා ප්‍රතිකාර කරන ස්ථානයක් පවත්වාගෙන යන්නවුන්
24. ඇඟලුම් කම්හලක් පවත්වාගෙන යන්නවුන්.
25. සිගරැට් තොග වශයෙන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යන්නවුන්.
26. තරග ඔට්ටුපලක් පවත්වාගෙන යන්නවුන්
27. සත්ත්ව ගොවිපලක් පවත්වාගෙන යන්නවුන්
28. ගංගා හා ගොඩ වැලි හා කලුගල් සහ බොරළු සැපයුම්කරණ හා විකුණන ස්ථානයක් පවත්වාගෙන යන්නවුන්
29. සිමෙන්ති වැඩපලක් පවත්වාගෙන යන්නවුන්
30. ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නවුන්
31. ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ලෙස සේවාව පවත්වාගෙන යන්නවුන්
32. රැකියා ඒජන්සිකරුවෙකු
33. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යන්නවුන්
34. බ්ලොක් ගල් වැඩපලක් පවත්වාගෙන යන්නවුන්
35. දුරකථන සම්ප්‍රේෂණ කුළුණු
36. සෆාරි ජීප්රථ මගින් සංචාරක සේවාව සඳහා මගීන් ප්‍රවාහනය
37. කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම
38. ඌරු ගොවිපලක් පවත්වාගෙන යාම
39. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම
40. බෝල මේසයක් පවත්වාගෙන යන්නවුන්
41. පෞද්ගලික දේවාලයක් පවත්වාගෙන යාම
42. දිය නෑමේ ස්ථානයක් පවත්වාගෙන යාම
43. අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
44. ලිහිසි තෙල් අලෙවි සලක් පවත්වාගෙන යාම

45. ගෑස් සිලින්ඩර් අලෙවි සැලක් පවත්වාගෙන යාම
46. කුරුඳු නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම
47. විසිතුරු මල් සකස් කිරීම හා අලෙවිය පවත්වාගෙන යාම
48. තෑගි ඔට්ටුවට පවත්වන විනෝද ක්‍රීඩා
49. උත්සව භාණ්ඩ කුලියට දීම
50. සුරතල් මසුන් වෙළඳාම
51. ෆුඩ්සිටියක් පවත්වාගෙන යාම
52. ජලය පිරිපහදු කිරීම හා අලෙවි කිරීම පවත්වාගෙන යාම
53. ජංගම වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
54. කෘෂි යන්ත්‍ර උපකරණ කුලියට දීම
55. නිවාස සැලසුම් නිර්මාණය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
56. දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පත්වාගෙන යාම
57. රථවාහන කුලියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නවුන්
58. රථ වාහන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නවුන්

11 - 632/3

කතරගම ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 වැනි දින පවත්වන ලද කළමණාකරන කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 04 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 දින කළමණාකරන කමිටු නිර්දේශ මත තීරණ අංක 04 අනුව මා විසින් තීරණය කළ බව මෙයින් මහජනතාව වෙත නිවේදනය කරනු ලබන අතර, 2024 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද 2024 වර්ෂයේ මාර්තු මස 31ට ප්‍රථම කතරගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියෙන් (1) වන උපවගන්තියෙන් කතරගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කතරගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මා විසින් තීරණය කරමි.

උපලේඛනය

	කර්මාන්තය	*පරිශ්‍රයේ වටිනාකම*		
		රු. 750.00 නොයික්මවන අවස්ථාවක රු.	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500 නොයික්මවන අවස්ථාවක රු.*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු.*
01.	රෙදි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
02.	සාප්පු බඩු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
03.	රෙදිපිළි සාප්පු බඩු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
04.	විදුලි උපකරණ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
05.	ගොඩනැගිලි උපකරණ ජල උපකරණ අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
06.	පිඟන් බඩු ඇලුමිනියම් හා පිත්තල ප්ලාස්ටික් ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
07.	මහන මැෂින් සහ මහන මැෂින් අමතර කොටස් ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
08.	වාහන අමතර කොටස් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
09.	පාවහන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
10.	ලොතරැයිපත් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
11.	රත්‍රං බඩු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
12.	දුම්කොළ මිලදී ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
13.	මැටි භාණ්ඩ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
14.	පටිගත කරන විද්‍යුත් තැටි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
15.	රුක් කලා හා දැව කැටයම් කරණ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
16.	පොල් තෙල් කපුරු හඳුන්කුරු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
17.	පොත්පත් හා පුවත්පත් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
18.	ස්ටිකර් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
19.	විසිතුරු බඩු අලෙවිකරණ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
20.	ජූජා භාණ්ඩ වෙළඳාම	500.00	750.00	1,000.00
21.	නූල් විකිණීමේ ජංගම ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
22.	ජංගම විසිතුරු බඩු වෙළඳාම	500.00	750.00	1,000.00
23.	මදුරු දැල් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
24.	බෑග් වර්ග මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
25.	විසිතුරු මල් සකස් කිරීම හා අලෙවිය පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
26.	පොල්කටු අත්කම් නිර්මාණ	500.00	750.00	1,000.00

කතරගම ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයේ ප්‍රචාරක දැන්වීම් /දෘෂ්‍ය පරිසරය

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 05 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126.**XXX** හා 126 ඊ උප වගන්තිය වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශේෂ ගැසට් පත්‍රයේ* IV (ඇ) කොටසෙහි ගරු විෂයභාර ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව කතරගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථා යටතේ කතරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළු) ඉදි කිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තුව 2024.01.01 දින සිට පනවා අය කිරීමට, මා වෙත පැවරී ඇති බලතල අනුව පහත සඳහන් ආකාරයට අයකළ යුතු බව මා විසින් තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*කාරණය*	*ප්‍රමාණ/කාලය*	*මුදල රු.*
01	බිත්තියක පුවරුවක ස්ථිරව ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියක් සඳහාම ආයතන පරිශ්‍රය තුළ පිහිටි දැන්වීම් පුවරුවලින් වර්ගඵලයෙන් අඩුම එක් පුවරුවක් ගාස්තුවලින් නිදහස් කළ හැක. (ආයතනයේ නාමය ප්‍රදර්ශනය වන්නේ නම් පමණි) ආයතනයෙන් පිටත ඕනෑම ස්ථානයක ප්‍රදර්ශණය කරනු ලබන දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකෙරේ.	වර්ග අඩි එකක් සඳහා හෝ ඉන් කොටසකට වර්ෂයට මාසයට දිනකට	 180.00 150.00 100.00
02	බිත්තියක පුවරුවක ස්ථිරව ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියක් සඳහාම දෙපැත්ත ප්‍රදර්ශනය වන්නේ නම් එකී දන්වීම් පුවරු සඳහා ගාස්තු අයකළ යුතුය. ආයතන පරිශ්‍රය තුළ පිහිටි දැන්වීම් පුවරු වලින් වර්ගඵලයෙන් අඩුම එක් පුවරුවක් ගාස්තුවලින් නිදහස් කළ හැක. (ආයතනයේ නාමය ප්‍රදර්ශනය වන්නේ නම් පමණි) ආයතනයෙන් පිටත ඕනෑම ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකෙරේ.	වර්ග අඩි එකක් සඳහා හෝ ඉන් කොටසකට වර්ෂයට මාසයට දිනකට	 210.00 180.00 130.00
03	බැනරයක් හෝ කොඩියක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම හෝ වර්ග අඩියේ ඉන් කොටසකට (එක් මසකට හෝ ඉන් කොටසක කාලයක් ප්‍රදර්ශනය කිරීම සඳහා)	වර්ග අඩි එකක් සඳහා හෝ ඉන් කොටසකට වර්ෂයට මාසයට දිනකට	 100.00 90.00 80.00
04	ලෑල්ලක් මගින් හෝ ආධාරකයක් මගින් ගමන් කරන වාහනයකට සම්බන්ධ කරනු ලබන චිත්‍රපට හෝ සංස්කෘතික දර්ශන ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම හෝ ඉන් කොටසක් සඳහා	වර්ග අඩි එකක් සඳහා දිනකට	50.00
05	බිත්ති පුවරුවක ලෑල්ලක් හෝ වහළය ආධාරයක් මගින් ප්‍රදර්ශනය කරන ප්‍රති දීප්ත/ ඩිජිටල් ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකට හෝ ඉන් කොටසක් සඳහා	වර්ග අඩි එකක් සඳහා වර්ෂයට/මාසයට/දිනකට	300.00
06	ප්‍රචාරක රථයක් හෝ අලෙවි කුටියක් උපයෝගී කරගෙන අලෙවි ප්‍රවර්ධන කටයුත්තක් සිදුකරන විටදී එහි වෙළඳ නාමය ප්‍රදර්ශනය කරන විටදී සෑම වර්ග අඩියක් හෝ ඉන් කොටසක් වෙනුවෙන්	වර්ග අඩි එකක් සඳහා	50.00

කතරගම ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයේ සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 06 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 වැනි දින කළමනාකරණ කමිටු නිර්දේශ මත මාගේ තීරණ අංක 06 අනුව මා විසින් තීරණය කළ බව මෙයින් මහජනතාව වෙත නිවේදනය කරනු ලබන අතර, 2024 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම 2024 වර්ෂයේ මාර්තු මස 31ට ප්‍රථම කතරගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව මා විසින් තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කතරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර *නැනහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටෙක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි විටෙක, එවැනි යම් ඉඩමක

(අ) *ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ*

(ආ) *ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටෙක හෝ*

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය අනුව එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2024 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකක (2%)ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2024 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කතරගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

11 -632/6

කතරගම ප්‍රාදේශීය සභාව

බ්‍රෝකර්කරුවෙකු වෙන්දේසිකරුවෙකු විකුණනු ලබන ඉඩම් වෙනුවෙන්
2024 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්ති ප්‍රකාරව ගාස්තු අය කිරීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 07 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු රැස්වීමේදී ලබාගත් තීරණ අංක 07 යටතේ 2024 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්ති ප්‍රකාරව ගාස්තු අය කිරීමට පහත සඳහන් යෝජනාව සම්මත කරන්නට

යෙදුන බව මා විසින් මෙයින් නිවේදනය කරමි.

ප්‍රාදේශීය සභා පනතේ 154(1) යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයකු *නැතහොත්* අනුනියෝජිතයකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ *නැතහොත්* වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් විකිණීමෙන් ලැබුණු මුදලින් 1% ප්‍රතිශතයකට සමාන බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයා හෝ විසින් එම ඉඩම් විකුණූ පසු ලැබූ මුදලින් මෙම සභාවට ගෙවිය යුතු බවට මා විසින් තීරණය කරමි.

11 - 632/7

කතරගම ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ගංගා වැලි, ගොඩ වැලි පස්, බොරළු, කළු ගල් හා දැව කඳන් ප්‍රවාහනයට සභාව සතු මාර්ග භාවිතය වෙනුවෙන් ගාස්තු අය කිරීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 08 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ 7 උප වගන්තියේ (ඇ) උප වගන්තිය හා 70 (1) වන වගන්තිය ප්‍රකාරව 2024.01.01 සිට ගංගා වැලි, ගොඩ වැලි පස්, බොරළු හා කළු ගල් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් වැලි කියුබ් එකක් සඳහා මසකට රු. 400.00ක ගාස්තුවක් ද දැව කඳන් ප්‍රවාහනය වෙනුවෙන් පහත වගන්තිය ප්‍රකාරව ගාස්තුවක් ද අය කිරීමට, පහත සඳහන් යෝජනාව සම්මත කරන්නට යෙදුනු බව මා විසින් මෙයින් නිවේදනය කරමි.

- ට්‍රැක්ටර් රථයක් සඳහා රු. 2000.00
- රෝද හයේ ලොරියක් සඳහා රු. 5000.00
- රෝද දහයේ ලොරියක් සඳහා රු. 10000.00

උපලේඛනය

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ (2) වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ උඟව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උඟව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV (ඇ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ප්‍රාදේශීය සභාවල සම්මත අතුරු ව්‍යවස්ථාව/සම්මත අතුරු ව්‍යවස්ථාවල අංක 01 (A) සිට 80 (A) දක්වා කොටස්වල දැක්වෙන සම්මත අතුරු ව්‍යවස්ථා යෝජනා අංක 1944/22 දරන 2015.12.07 වැනි දිනැති *ගැසට්* පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවල 07 වන අතුරු ව්‍යවස්ථාව වන කතරගම ප්‍රාදේශීය සභාව සතු මාර්ගවල ගමන් කරන වාහනවල බර හා වේග සීමා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 07 වන උප වගන්තිය ප්‍රකාරව 2023.09.21 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු රැස්වීමේදී ලබාගත් තීරණ අංක 08 යටතේ කතරගම ප්‍රාදේශීය සභාව සතු මාර්ගවල ගංගා වැලි ප්‍රවාහනය කරනු ලබන සෑම රථයකින්ම වැලි කියුබ් 01ක් සඳහා රු. 400.00ක මාසික ගාස්තුවක් 2024 වර්ෂයේ සිට සභාවට ගෙවිය යුතු බව මා විසින් තීරණය කළ බව දන්වමි.

11 - 632/8

කතරගම ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා කසළ බදු අය කිරීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 09 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තියේ IX (ආ) උපවගන්තිය යටතේ අංක 1816/43 දරන හා 2013.06.28 දිනැති අතුරු ව්‍යවස්ථාව හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික ස්ථාන සහ නවාතැන් සපයනු ලබන නිවාඩු නිකේතනවල ඇති කසළ ඉවත් කිරීම සඳහා පහත සඳහන් ආකාරයට අයවිය යුතු බවට මා විසින් තීරණය කරමි.

කතරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික ස්ථාන සහ නවාතැන් සපයනු ලබන නිවාඩු නිකේතනවල ඇති කසළ ඉවත් කිරීම සඳහා බද්දක් 2024 ජනවාරි මස සිට මාසිකව අයකළ යුතු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව පහත සඳහන් ආකාරයට අයකළ යුතු බවට මා විසින් තීරණය කරමි.

උපලේඛනය

	ද්‍රව්‍ය/සේවා	*kg/මාසික/දෛනික*	*මිල රු.*
01.	සිල්ලර හා වෙනත් වෙළඳ සැල සඳහා	kg 1 - 50	250.00
02.	පළතුරු වෙළඳ සැල සඳහා	kg 1 - 100	500.00
03.	කාමර 1-05 දක්වා නිවාඩු නිකේතන සඳහා	මාසික	750.00
04.	කාමර 6-10 දක්වා නිවාඩු නිකේතන සඳහා	මාසික	1500.00
05.	කාමර 11-20 දක්වා නිවාඩු නිකේතන සඳහා	මාසික	3000.00
06.	කාමර 21-50 දක්වා නිවාඩු නිකේතන සඳහා	මාසික	7500.00
07.	කාමර 51 ඉහළ	මාසික	12500.00
08.	ආපනශාලා සඳහා	500 kg ට අඩු	1000.00
09.	ආපන ශාලාවන් හි දෛනිකව කසළ ඉවත් කිරීම	1000 kg සඳහා	10000.00
10.	ආපන ශාලාවන් හි දෛනිකව කසළ ඉවත් කිරීම	500 kg සඳහා	5000.00
11.	ගොඩනැගිලි අබලි ද්‍රව්‍ය සඳහා ගාස්තු	ටිපර් එකක් සඳහා	20000.00

11 - 632/09

කතරගම ප්‍රාදේශීය සභාව

කතරගම නගරයේ තොග හා සිල්ලර වශයෙන් වෙළෙඳසැල් වෙත භාණ්ඩ හා ද්‍රව්‍ය විකුණන ලොරි, සැහැල්ලු ලොරි, ත්‍රීවිල් රථ සඳහා ගාස්තු අයකිරීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 10 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල අනුව කතරගම ප්‍රාදේශීය සභාව මගින් කතරගම නගරය තුළ ඇති තොග හා සිල්ලර බඩු කඩ සඳහා තොග වශයෙන් හා සිල්ලර වශයෙන් භාණ්ඩ හා ද්‍රව්‍ය විකුණන ත්‍රීවිල් රථ, සැහැල්ලු ලොරි, හා ලොරි සඳහා දිනකට පහත සඳහන් ආකාරයට ගාස්තු අයකර ලදුපත් නිකුත් කිරීම විය යුතු බවට මා විසින් තීරණය කරමි.

අයිතමය	*මුදල රු.*
ත්‍රීවිල් රථයක් සඳහා	100.00
සැහැල්ලු ලොරි/වෑන් රථයක් සඳහා	200.00
ලොරි රථයක් සඳහා	300.00

11 - 632/10

කතරගම ප්‍රාදේශීය සභාව

රුහුණු මහා කතරගම ඇසල උත්සවය

2024 කතරගම ඇසල පෙරහැර කාල සීමාව සඳහා තාවකාලික කසළ බදු අය කිරීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 දින පවත්වන ලද කළමණාකරන කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 11 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල අනුව කතරගම ප්‍රාදේශීය සභාව මගින් බදු ගත් ස්ථානයක හෝ වෙනත් රජයේ යම් ආයතනයක් මගින් බදු ලබා ගත් ස්ථානයක ඇසළ පෙරහැර කාල සීමාව සඳහා පමණක් තාවකාලික වෙළඳාමෙ හි යෙදෙන සියලුම සංක්‍රමණික වෙළෙන්දන්ගෙන් සඳහා වූ ගාස්තු පහත සඳහන් ආකාරයට විය යුතු බව මා විසින් තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලය අනුව 1988.08.23 දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ IV* (ආ) කොටසෙහි ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයකට පත්කරනු ලදුව කතරගම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති අතුරු ව්‍යවස්ථාවල 09 වන ඡේදය යටතේ 2024 වර්ෂයේ ඇසළ උත්සව කාල සීමාව තුළ කතරගම නගර සීමාව ඇතුළත තාවකාලික බදු දුන් පෞද්ගලික ස්ථානයක් හෝ කතරගම ප්‍රාදේශීය සභාව මගින් බදු ගත් ස්ථානයක හෝ වෙනත් රජයේ යම් ආයතනයක් මගින් බදු ලබා ගත් ස්ථානයක ඇසළ පෙරහැර කාල සීමාව සඳහා පමණක් තාවකාලික වෙළෙඳාමෙහි යෙදෙන සියලුම සංක්‍රමණික වෙළෙන්දන්ගෙන් පහත ලේඛනයේ දැක්වෙන අනු ප්‍රමාණයන්ට කසල බද්දක් අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ කතරගම ප්‍රාදේශීය බලතල ප්‍රකාරව අයකල යුතු බවට මා විසින් කරමි.

01. එකී බදු මුදල කතරගම ප්‍රාදේශීය සභාව මගින් කඩබිම් ලබා ගන්නා ගැණුම්කරුවන් ටෙන්ඩර් මගින් වෙන්දේසිය සිදුකරන අවස්ථාවේදීම අදාළ අනු ප්‍රමාණයන්ට යටත්ව කඩබිම් වෙන්දේසි මුදල සමග හෝ ටෙන්ඩර් මුදල හෝ ගෙවිය යුතු බවත්,

02. පෞද්ගලික ස්ථිර කඩ කාමර තාවකාලික කුලියට ගෙන හෝ බදු ගෙන හෝ ඇසළ පෙරහැර කාල සීමාව තුළ වෙළෙඳාම පවත්වාගෙන යන්නවුන් විසින් ඇසළ පෙරහැර ආරම්භ කළ දින සිට දින 07ක් ඇතුළත අදාළ කසළ බද්ද රු. 1,500.00ක් මෙම සභාවට ගෙවිය යුතු බවටත් මා විසින් තීරණය කරමි.

11 - 632/11

කතරගම ප්‍රාදේශීය සභාව

රුහුණු මහා කතරගම ඇසළ උත්සවය

2024 කතරගම ඇසළ පෙරහැර කාල සීමාව සඳහා තාවකාලික ව්‍යාපාර බදු අය කිරීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 දින පවත්වන ලද කළමණාකරන කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 12 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් ලබා දී ඇති බලතල ප්‍රකාරව බදු ගත් ස්ථානයක හෝ වෙනත් රජයේ යම් ආයතනයක් මගින් බදු ලබාගත් ස්ථානයක ඇසළ පෙරහැර කාලසීමාව සඳහා පමණක් තාවකාලික වෙළෙඳාමෙහි යෙදෙන සියලුම සංක්‍රමණික වෙළෙන්දන්ගෙන් තාවකාලික ව්‍යාපාර බදු පනවා පහත සඳහන් ආකාරයට අය කරගත යුතු බවට කතරගම ප්‍රාදේශීය සභාව තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියෙන් පැවරී ඇති වගන්තියෙන් පැවරී ඇති බලය අනුව 1988.08.23 දින අංක 520/2 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (ආ) කොටසෙහි ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව කතරගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවේ 28 වන ඡේදය යටතේ 2024 වර්ෂයේ ඇසළ පෙරහැර කාලසීමාව තුළ කතරගම නගර සීමාව තුළ තාවකාලික බදුගත් පෞද්ගලික ස්ථානයක හෝ කතරගම ප්‍රාදේශීය සභාව මගින් තාවකාලිකව බදු ලබාගත් ස්ථානයක් හෝ වෙනත් යම් ස්ථානයක් මගින් තාවකාලිකව බදු ලබාගන්නා ස්ථානයක කතරගම ඇසළ පෙරහැර කාලසීමාව තුළ සඳහා පමණක් තාවකාලිකව වෙළඳාමෙහි යෙදෙන සියලුම වෙළෙන්දන් පහත උපලේඛනයේ දැක්වෙන අනු ප්‍රමාණයන්ට අනුකූලව තාවකාලික ව්‍යාපාර බදු පනවා අයකරගත යුතු බවට මා විසින් තීරණය කරමි.

1. කතරගම ප්‍රාදේශීය සභාව විසින් ඇසළ උත්සව කඩබිම් ටෙන්ඩර් අවස්ථාවේදී/වෙන්දේසිය කරන අවස්ථාවේදී වෙළඳ බිම් ලබා ගන්නා අයදුම්කරුවන් විසින් එම අවස්ථාවේදීම එම තාවකාලික ව්‍යාපාර බදු ගෙවිය යුතුය.

2. පෞද්ගලික ස්ථාන තාවකාලික කුලියට හෝ බද්දට ලබාගෙන තාවකාලික වෙළඳාම පවත්වාගෙන යන්නවුන් විසින් ඇසළ පෙරහැර ආරම්භ කරන ලද දින දින 03ක් ඇතුළත හෝ පසුව වෙළඳාම ආරම්භ කරන්නේ නම් වෙළඳාම ආරම්භ කරන දින හෝ ඊට ප්‍රථම තාවකාලික ව්‍යාපාර බදු ගෙවිය යුතුය.

3. ඉහත 1 හා 2 ඡේදවල සවිස්තර කවරෙකු ව්‍යාපාර බදු ගෙවීමකින් තොරව වෙළඳාම් කටයුතුවල යෙදෙන්නේනම් එය වරදක් වන අතර අනවසර වෙළඳාමක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අධිකරණය වෙත චෝදනා කර නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ.

11 - 632/12

කතරගම ප්‍රාදේශීය සභාව

රුහුණු මහා කතරගම ඇසළ උත්සවය

2024 කතරගම ඇසළ පෙරහැර කාලසීමාව සඳහා ස්ථිර කඩයක පවත්වාගෙන යනු ලබන තාවකාලික වෙළෙඳසැලක් සඳහා ව්‍යාපාර බදු අය කිරීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 වැනි දින පවත්වන ලද කළමණාකරන කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 13 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව කතරගම නගරයේ පවත්වාගෙන යනු ලබන ස්ථිර කඩයක සීමාවෙන් පිටත පවත්වාගෙන යන්නා වූ පහත පළ කරනු ලබන වෙළඳාම් වෙනුවෙන් ප්‍රාදේශීය සභාව මගින් ව්‍යාපාර බදු අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව මා විසින් තීරණය කරමි.

උපලේඛනය

		රු. ශත
I.	රෙදි කඩයක්	5,000 0
II.	පාවහන්	5,000 0
III.	පිත්තල බඩු	7,000 0
IV.	සෙල්ලම් බඩු	3,000 0
V.	ඔරලෝසු	3,000 0
VI.	ඇළුමිනියම් බඩු	7,000 0
VII.	වීදුරු බඩු	3,000 0
VIII	සුවඳ විලවුන්	3,000 0
IX.	හෝටල් සඳහා	3,000 0
X.	රස කැවිලි	3,000 0
XI	ප්ලාස්ටික් බඩු	3,000 0
XII	පොත් හා මුද්‍රිත ලිපිද්‍රව්‍ය	3,000 0
XIII.	විදුලි උපකරණ	7,000 0
XIV	විසිතුරු මැටි බඳුන්	3,000 0
XV.	ලී ආශ්‍රිත නිෂ්පාදන	5,000 0
XVI.	වෙනත් වෙළඳ භාණ්ඩ	1,000 0 සිට 5,000 0
XVII.	සැලුන්	10,000 0

11-632/13

කතරගම ප්‍රාදේශීය සභාව

රුහුණු මහා කතරගම ඇසල උත්සවය

2024 කතරගම ඇසල පෙරහැර කාල සීමාව තුළ පදික වේදිකාවේ පවත්වාගෙන යනු ලබන අනවසර වෙළඳාම වෙනුවෙන් වූ මිල ගණන්

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 14 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල අනුව කතරගම නගරයේ පදික වේදිකාවේ පවත්වාගෙන යනු ලබන අනවසර වෙළඳාම් වෙනුවෙන් ප්‍රාදේශීය සභාව මගින් බිම් කුලි අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව මා විසින් තීරණය කරමි.

උපලේඛනය

	එක් දිනක් සඳහා	*රු. ශත*
I.	නූල් තට්ටු	100 0
II.	බුලත් විට	200 0
III.	සාර විට	150 0
IV.	කඩල කරත්ත	200 0
V.	තොප්පි/වැහිකබා	200 0
VI.	බොම්බයි මොටයි	200 0
VII.	බේකරි නිෂ්පාදන	200 0
VIII	පළතුරු	200 0
IX.	පොල්	200 0
X.	කිරි ආශ්‍රිත නිෂ්පාදන	200 0
XI	අයිස් ක්‍රීම් ලොරි	350 0
XII	අයිස් ක්‍රීම් පාපැදි	200 0
XIII.	අයිස්ක්‍රීම් කරත්ත/ත්‍රීවීල්	250 0
XIV	විසිතුරු මැටි බඳුන්	300 0
XV.	පොත් හා මුද්‍රිත ලිපිද්‍රව්‍ය	500 0
XVI.	රෙදි කඩයක්	500 0
XVII.	පාවහන්	200 0
XIII.	පිත්තල බඩු	500 0
XIX.	සෙල්ලම් බඩු	350 0
XX.	ඔරලෝසු	500 0
XXI.	ඇළුමිනියම් බඩු	500 0
XXII.	වීදුරු බඩු	500 0
XXIII	සුවඳ විලවුන්	500 0
XXIV.	හෝටල් සඳහා	500 0
XXV.	රස කැවිලි	350 0
XXVI	ප්ලාස්ටික් බඩු	350 0
XXVII	විදුලි උපකරණ	500 0
XXVIII	සිම්පත්	500 0
XXIX	තේ වතුර (ජංගම)	200 0
XXX	රටකජු	100 0
XXXI	දර	150 0

11-632/14

කතරගම ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 15 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තියෙහි සහ හතරවන උපලේඛනය විධිවිධාන ප්‍රකාරව කතරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමු.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය හා හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර කතරගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවෙහි සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට මා විසින් තීරණය කරමි.

උපලේඛනය

	I වැනි තීරය	*II වැනි තීරය* *රු. ශ.*
1	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 00
2	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා	
අ	(අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18 00
ආ	(ආ) වෙළඳ කාර්යය නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	04 00
ඇ	සෑම කරත්තයක් සඳහා	20 00
ඈ	සෑම අත්කරත්තයක් සඳහා	10 0
ඉ	සෑම රික්ෂෝවක් සඳහා	7 50
ඊ	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 00
උ	සෑම ඇතෙකු සඳහා	50 00
ඌ	ඉහත සඳහන් අයිතමයන් වෙනුවෙන් ලිපිදව්‍ය ගාස්තු	21 00
එ	විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීම්වලින් නිදහස් කෙරේ.	

කතරගම ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 16 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කතරගම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී, ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට එකී ආදායමෙන් සියයට (10%) ට සමාන මුදලක් බද්දක් වශයෙන් පනවා 2024.01.01 දින සිට අය කිරීමට මා විසින් තීරණය කරමි.

11-632/16

කතරගම ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා අයදුම්පත් හා වෙනත් සේවා

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 17 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා බලතල ප්‍රකාරව කතරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව කතරගම ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පහත සඳහන් සේවාවන් සඳහා ගාස්තු පහත සඳහන් ආකාරයට විය යුතු බවට මා විසින් තීරණය කරමි.

උපලේඛනය

අ. අ.	*ද්‍රව්‍ය සේවා*	*මුදල රු.*
01	පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු (අවුරුදු 03 ක කාල සීමාවකට)	4,500.00
02	පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු අය කිරීම	
I	මූලික ආයෝජනය දස ලක්ෂය දක්වා	3,000.00
II	මූලික ආයෝජනය දස ලක්ෂයකට වඩා වැඩිනම්	10,000.00

අ. අ.	ද්‍රව්‍ය සේවා	මුදල රු.
03	ගොඩනැගිලි අයදුම් පත්‍ර/ඉඩම් අනු බෙදීම් අයදුම්පත්‍ර	1,000.00
04	ජල සේවා	
I	බල ප්‍රදේශය තුළ එක් ට්‍රැක්ටර් බවුසරයක් සඳහා ලීටර් 4,000	3,000.00
II	ලොකු බවුසරයක් සඳහා ලීටර් 7,000	5,000.00
III	(a) ප්‍රදේශයෙන් පිටත කිලෝමීටර් 01 සඳහා අමතර ගාස්තුව	500.00
	(b) (යාමට/ඒමට)	
05	ගලි සේවාව	
I	බල ප්‍රදේශය තුළ එක් ගලි බවුසරයක් සඳහා	8,000.00
II	බල ප්‍රදේශයෙන් පිටත කිලෝමීටර් 01 සඳහා ප්‍රවාහන ගාස්තුව (යාමට/ඒමට)	500.00
06	අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්	
I	වෙළඳ කාර්යය පැය 04ක් සඳහා වර්ග අඩි එකක් වෙනුවෙන්	35.00
II	වෙළඳ කාර්යය දින 01 ක් සඳහා වර්ග අඩි එකක් වෙනුවෙන්	60.00
07	පොදු ක්‍රීඩා පිටියට හෙලිකොප්ටර් ගොඩ බැසීමේ ගාස්තු	8,000.00
08	සම්මන්ත්‍රණ ශාලාව එක් දිනක් සඳහා	9,000.00
09	ත්‍රීරෝද රථයක් නවතා තැබීමේ වාර්ෂික රථගාල් ගාස්තු වශයෙන්	1,500.00
10	ජේ. සී. බී. රථය මීටර් පැය 01 සඳහා	7,000.00
11	ටිපර් රථය පැය 08 සඳහා (ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අමතර ගාස්තු නිදහස්)	20,000.00
12	ප්‍රදේශයෙන් පිටත කිලෝ මීටර් 01 සඳහා අමතර ගාස්තුව (යාමට/ඒමට)	500.00
13	මෝටර් ග්‍රේඩරය පැය එකක් සඳහා	10,000.00
14	දිගු කාලීන බදු බලපත් අවසර ලබාදීමේ පරීක්ෂණ ගාස්තු පර්චස් 1 සිට 40 දක්වා ස්ථාවර ගාස්තු පර්චස් 4 ට වැඩි පර්චස් එකක් සඳහා	 5,000.00 100.00
15	නිදුල්ලේ ඇවිදින එක ගවයෙකු සඳහා දඩ මුදල	5,000.00
I	දින එකක් සඳහා රැඳවුම් ගාස්තු	500.00
II	එක් දිනක් සඳහා රැකවල් ගාස්තුව සඳහා	2,500.00
16	ඔරලෝසු කණු දෙක බදු දීම මත අය කරන ගාස්තු	50,000.00

අ. අ.	ද්‍රව්‍ය සේවා	මුදල රු.
17	බල ප්‍රදේශයෙන් ඇතුළත පුස්තකාල සාමාජික තැන්පතු	100.00
18	බල ප්‍රදේශයෙන් පිටත පුස්තකාල සාමාජික තැන්පතු	500.00
19	පුස්තකාල ප්‍රමාද දඩ ගාස්තු දිනකට	5.00
20	පැරණි පුවත්පත් විකිණීම (කිලෝ ග්‍රෑම් එකක් සඳහා)	150.00
21	රංජිත් මද්දුම බණ්ඩාර ක්‍රීඩාංගණය දිනක් සඳහා	7,500.00
22	ශෂින්ද්‍ර රාජපක්ෂ ක්‍රීඩාංගනය දිනක් සඳහා	7,500.00
23	ටෙන්ඩර් අයදුම්පත්‍ර ගාස්තුව	3,000.0
24	අනවසර ගොඩනැගිලි ඉදිකිරීමක් සඳහා ආවරණ අනුමැතිය සඳහා පෙරසැරි ගාස්තුව	1,500.00
25	වීථිරේඛා/නොපවරා ගැනීමේ සහතික ගාස්තු	3,000.00
26	භූගත සේවා සම්පාදනයක් ලබා ගැනීමට මාර්ගයක් පළුදු කිරීම වෙනුවෙන් ආරක්ෂිත තැන්පතුව	5,000.00
27	මෝටර් ග්‍රේඩරය/බැකෝ ලෝඩරය/ටිපර් රථය කුලියට ලබා දීම වෙනුවෙන් ආරක්ෂිත තැන්පතුව	5,000.00
28	ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා භූමි පරිහරණය සඳහා ලබා දීම වෙනුවෙන් ආරක්ෂිත තැන්පතුව	5,000.00
29	ප්‍රාදේශීය සභාව සතු ප්‍රජා ශාලාව හෝ සම්මන්ත්‍රණ ශාලාව මුදලට ලබා දීම වෙනුවෙන් ආරක්ෂිත තැන්පතුව	5,000.00
30	ජල බවුසරය ලොරිය හෝ ට්‍රැක්ටර් බවුසරය ලබා දීම වෙනුවෙන් ආරක්ෂිත තැන්පතුව	2,000.00
31	ක්‍රීඩා පිටිය නොවන ස්ථානයක ප්‍රසිද්ධ රඟ දැක්වීමක් හෝ සැණකෙළියක් පැවැත්වීම වෙනුවෙන් පෙරසැරි ගාස්තුව	2,000.00

11-632/17

කතරගම ප්‍රාදේශීය සභාව

2024 කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ සේවා සැපයීම් වෙනුවෙන් අය කිරීම්

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 18 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා බලතල ප්‍රකාරව කතරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව කතරගම ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන්නා වූ කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ සේවාවන් සඳහා ගාස්තු පහත සඳහන් ආකාරයට විය යුතු බවට මා තීරණය කරමි.

උපලේඛනය

			රු. ශත
12	පාලම් තරාදියේ වාහන කිරීම සඳහා	එක් සැහැල්ලු වාහනයක් සඳහා	250.00
I		එක් බර වාහනයක් සඳහා	500.00
13	අවසන් බැහැර කිරීම	එක් ටිපර් රථයක් සඳහා	35,000.00
14	තාවකාලික ජංගම ෆයිබර් වැසිකිළි කුළියට ලබා දීම ආරක්ෂිත ඇප තැන්පත් මුදල	එකක් සඳහා දිනකට එකක් සඳහා	3,000.00 2,000.00

11-632/18

කතරගම ප්‍රාදේශීය සභාව

කතරගම ප්‍රාදේශීය සභා නිවාඩු නිකේතනය සඳහා ගාස්තු අය කිරීම - 2024

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 20 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව කතරගම ප්‍රාදේශීය සභාව සතු නිවාඩු නිකේතනය සඳහා හා එම නිවාඩු නිකේතනයෙන් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ගාස්තු පහත සඳහන් ආකාරයට අයවිය යුතු බවට මා විසින් තීරණය කරමි.

උපලේඛනය

	සංචාරකයින්	.	රු.		රු.
1	4 දෙනෙකු සඳහා	වායු සමීකරණය නොකළ	1,500.00		
2	6 දෙනෙකු සඳහා	වායු සමීකරණය නොකළ	2,500.00	වායු සමීකරණය කළ	4,000.00
3	8 දෙනෙකු සඳහා	වායු සමීකරණය නොකළ	3,500.00	වායු සමීකරණය කළ	5,000.0

නිවාඩු නිකේතනයේ ශාලාව වෙනුවෙන්

1-25 ලැඟුම් ගන්නා පිරිසක් සඳහා රු. 7,500.00

11-632/19

කතරගම ප්‍රාදේශීය සභාව

2024 වරිපනම් ලේඛන

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 21 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

2024 වර්ෂය සඳහා කතරගම ප්‍රාදේශීය සභාව වරිපනම් පොත සාමාන්‍ය කාර්යාලීය වේලාවන්හිදී මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා දැනට සූදානම් කර ඇති බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 141 (1) වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

11-632/20

කතරගම ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා වැඩ සටහන් අයවැය ලේඛනය

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 22 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 171 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 184 වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති අංක 14(3) ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම් හා වියදම් විස්තර ඇතුළත් වැඩ සටහන් අයවැය ලේඛනය මහජනතාවට දැක බලා ගැනීම සඳහා කතරගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ තබා ඇති බව මෙයින් දනුම් දෙමි.

11-632/21

කතරගම ප්‍රාදේශීය සභාව

කතරගම ප්‍රාදේශීය සභාවට අයත් කඩයක් පැවරීමේ දී හා හිමිකම් සහතික නිකුත් කිරීමේ දී ගාස්තු අය කිරීම - 2024

කතරගම ප්‍රාදේශීය සභාව විසින් 2023.09.21 දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව මාගේ තීරණ අංක 23 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල
ක්‍රියාත්මක කිරීමේ හා කාර්ය ඉටුකිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව - කතරගම.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1	තම දරුවෙකුට සහෝදරයෙකුට හෝ බිරිඳට හෝ ස්වාමියාට පවරන විට පැවරුම් ගාස්තු වලින් නිදහස් වන අතර	
	ලිපිද්‍රව්‍ය හා සේවා ගාස්තු	4,000.00
	දේපල කමිටු ගාස්තුව	1,000 .00
02	කතරගම ප්‍රාදේශීය සභාව සතු සියලුම කඩ කාමර වෙනත් අයකු වෙත පැවරීමේ දී (එක් කඩයක් සඳහා)	1,50,000.00
	ලිපිද්‍රව්‍ය හා සේවා ගාස්තු	4,000.00
	දේපල කමිටු ගාස්තුව	1,000 .00
04	වරිපනම් නම් සංශෝධනයකදී හා වරිපනම් හිමිකම් සහතික පත්	
	නිකුත් කිරීමේ දී ගාස්තු අය කිරීම, වසර දෙකක් සඳහා	1,000.00
	වැඩිවන වසරක් සඳහාම අය කිරීම	100.00

11-632/22